

# කඳුළු තාරකාවී

කුෂාන් හෙට්ටිආරච්චි

sinhalaebooks.com

©

මෙම කෘතිය කතුවරයාගේ පූර්ණ අනුමැති සහිතව
sinhalaebooks.com වෙබ් අඩවිය විසින්
පාඨකයන්ගේ කියවීම උදෙසා නොමිලේ බෙදාහරින ලද කෘතියකි.

Published with Author Consent.

sinhalaebooks.com




# කඳුළු තාරකාවී.

කුෂාන් හෙට්ටිආරච්චි.

කඳුළු
තාරකාවී
Author
KUSHAN HETTIARACHCHI

sinhalaebooks.com

# කඳුළු තාරකාවී.




කුෂාන් හෙට්ටිආරච්චි.

PDF ප්‍රකාශනයකි

කඳුළු
තාරකාවී
Author
KUSHAN HETTIARACHCHI

sinhalaebooks.com

# කඳුළු තාරකාවී

© කුෂාන් හෙට්ටිආරච්චි.

ප්‍රථම PDF මුද්‍රණය 2017

දෙවන PDF මුද්‍රණය 2023

මෙම කෘතියේ සම්පූර්ණ අයිතිය කතෘ සතුවන අතර නිසි ලිඛිත අවසරයකින් තොරව මෙහි කිසිදු කොටසක් උපුටාගැනීම හෝ කවරාකාරයෙන් හෝ ප්‍රතිමුද්‍රණය,අන්තර්ජාල ප්‍රකාශනය .ව්‍යාජ පිටපත් පළකිරීම,අලෙවිය කිසිදු මාධ්‍යකින් සපුරා තහනම් ය.

**පිට කවර නිර්මාණය**

කුෂාන් හෙට්ටිආරච්චි.

කඳුළු
තාරකාවී
Author
KUSHAN HETTIARACHCHI

sinhalaebooks.com

# පිදුම

මාගේ ආදරණීය මවට පියාට නැගනියට සහ බිරිඳට .

කඳුළු
තාරකාවී
Author
KUSHAN HETTIARACHCHI

sinhalaebooks.com




කඳුළු තාරකාවී ....

කඳුළු තාරකාවී මේක ආදර කතාවක් නම් නෙවෙයි දඟකාර කෙල්ලො තුන්දෙනෙකුගෙ කතාවක් මේ කෙල්ලො තුන්දෙනා අපූරු ත්‍රාසය ජනක චාරිකාවක් යනව තරු අතරින් සුරංගනා ලෝකයටත් කඳු අතරින් නිරයටත් යන අපූරු කතාවක් මෙහි එන ඉතිහාස කතා නම් ගම් සියල්ල මන:කල්පිතයි සැබෑ ලෝකට කිසිදු සම්බන්දයක් අඩුම තරමෙ කිසිදු පුද්ගලයෙකුට සම්භන්දයකුත් නැහැ ....හිරු ,සුබා ,පිංකි,ක්‍රිෂාන් ,හසරැල් "සමග එකතුවෙන්න කඳුලු තාරකාවී සමග . (මෙහි එන ඉතිහාස කරුණු ප්‍රබන්ධ පමණක් බව කරුණාවෙන් සලකන්න රාවණ රජ

,විභීෂණ රජ ගැන සත්‍ය ඉතිහාස කරුණු වෙනස් බැවින් මාගේ කතාවට අදාල වනසේ නිර්මාණය කල බව කරුණාවෙන් සලකන්න )ඒ වගේම මම වැඩිම වියදමක් මහන්සියක් දරල ලියපු නවකතාව තමයි “කඳුළු තාරකාවී ” මෙම කතාව සම්පූර්ණයෙන්ම මාගේ මනසේ ඇඳී කතාවක් වන අතර මෙය මාගේ නිසි අවසරයකින් තොරව සම්පූර්ණයෙන් හෝ මෙහි කොටස් උපුටා ගැනීම,අන්තර්ජාලය හෝ වෙනත් මාද්‍යක පල කිරීම . සපුරා තහනම් වේ. ගුණදොස් විචාරය ඔබ සතුය මීට

කුෂාන් (කුෂී)

කුෂාන් හෙට්ටිආරච්චි.

පරමකොටුව පාර,නක්කාවත්ත.

0773 398 938 | 0716 815 899|0777 194 198

facebook.com/kushan3000

kushan3000@gmail.com

2017 ඔක්තෝබර් 12

උදෑසන අවදි වූ පිංන්කි ඇඳඋඩ සිට බැලුවේ තවමත් ගුලිවී නිදන තම යෙහෙළියන් වන හිරු සහ සුබා දෙසයි
"මුං දෙන්නගෙ තියන කම්මැලි කමක් "
තමාටම කියා ගනිමින් ඇය ඇදෙන් නැගිට්ටාය.මේ තුන්දෙනා කෑගලු බාලිකා විද්‍යාලයේ උසස්පෙල ඉතිහාසය හදාරන නේවාසික සිසුවියන් තිදෙනෙක් .මෙතනින් පිංකි කඩිසර කෙල්ලෙක් සිහින් සිරුරක් තියෙන ඇය ක්‍රීඩාවට බොහොම ලැදියි .හිරු සහ සුබා නම් තරමක් කම්මැලි චරිත දෙකක් .මෙතනින් සුබා සුදු බතලගෙඩියක් වගේ ඉන්න කෙලිලෝල් චරිතයක්. හිරු නම් සාමාන්‍ය සිරුරක් තියන ගැහැණු ළමයෙක් .ඒත් තරමක බිය ගුල්ලියක් .මේ පාසැල් නිවාඩු කාලය උනත් මේ තුන්දෙනා ගෙවල් වලට ගියේ නැත්තෙ ඉගනීමේ වැඩ ගොඩක් තිබ්බ නිසා. අගෝස්තු පාසැල් නිවාඩුව තුන්දෙනාම හොස්ටල් එකේ ඉන්න තීරණය කලා.ඊයේ තමයි පාසැල් නිවාඩුව දුන්න දවස ඉතින් තුන්දෙනා රෑ වෙනකම් ඇහැරිලා කතා කරමින් ඉදලයි නින්දට ගියේ .
පිංකි ඔවුන්ගේ කාමරයේ තිබුන කුඩා මුළුතැන්ගෙයට ගොස් තුන්දෙනාටම උදේ කිරි එක හැදුවා.කිරි හදන ගමනුත් ඇය කල්පනා

කලේ සුරංගනී මිස් ඉගැන්වූ කදුළු ගුහාව ගැන.ඒක ඇසුව වෙලාවෙ ඉදල තුන්දෙනාගෙ කටෙ තිබ්බෙ කදුලු ගුහාව ගැන. රෑ වෙනකම් කතා කලේත් ඔය ගැනමයි.ඉතිහාසයේ එන කදුළු ගුහාව තාම සොයාගෙන නෑ කියල තමයි සුරංගනී මිස් නම් කිව්වෙ. සමහර විට ඒක කල්පිතයක් වෙන්නත් පුලුවන් .

පිංකි යෙහෙළියන් දෙදෙනාගේ කිරි වීදුරු දෙකත් තමාගේ එකත් වතුර වීදුරුවකුත් බන්දේසියක තබාගෙන නිදන කාමරයට ආවාය.

"මේ කමැලිච්චියො දෙන්න තාම නිදිනෙ. "

කියමින් ඇය හිරු සහ සුබා පොරවාගෙන සිටි පොරෝන දෙක ඇද දැම්මේ කිරි වීදුරු තුන තිබුන බන්දේසිය පාඩම් මේසය මත තැබීමෙන් අනතුරුවයි .

හිරුත් සුබාත් අවදි උනේ

"හයියෝ නිවාඩු දවසටත් නිදා ගන්න දෙන්නෙ නැද්ද අප්පා " යයි මැවිසිලි නගමින්.

සුබා පවසද්දි

"අප්පා පිංකි උඹනම් හරි වදයක් බන් "

හිරු තම ඇදමත තිබූ ටෙඩියා තවත් හයියෙන් තුරුලු කර ගත්තේ උදෑසන සීතල පහව යන්න මෙනි .

"කම්මැලියො දෙන්න බීපල්ල මේ කිරි දෙක කවද

හරි ඉතින් උඹල මැරි කරන උන් ට දෙයියන්ගෙම පිහිට තමයි. "
පිංකි අනිත් පස ඇදේ වාඩි උනේ තම කිරිවීදුරුව ගෙන උගුරක් බොමිනි .
"ඉතින් පිංකියෝ අපිට තව කල් තියනවනෙ මැරි කරන්න. "
සුබා පිංකි ගාව ඉදගෙන තොදොල් වෙමින් පැවසුවාය.
"අනේ පලයන් නාකි හුරතලේ. "
"එක රැයට මම නාකි වෙලාද නැත්තම් උඹේ ඇස් පේන්නෙ නැති වෙලාද? "
සුබා පැවසුවේ පිංකිව තවත් විහිලුවට ගනිමිනි .
"මේ ඒක නෙවෙයි දෙන්න එක්ක වොශ් රූම් ගිහින් එන්ඩලාකො. "
පිංකී පවසද්දි...
"ඒ මොකටද සුදෝ... "
හිරු කීවේ ලතාවකට නැලවෙමිනි.
"පොඩි දෙයක් තියනව උබල දෙන්න එක්ක කතා කරන්න. "
"මම ඉස්සරල වොශ් රූම් යනෝ."
කියමින් හිරු ගියේ අතේ උන් ටෙඩියාත් තුරුලු කරගෙනමය.
"යකෝ උබ ඔය උබේ වගේ තුරුල් කරන් යන්නෙ මගෙ ටෙඩිය උබ වොශ් දාල පිහින්නෙ

sinhalaebooks.com

ටෙඩියගෙන් ද? මේ ටවල් එක අරන් යමන්. "
සුබා කීවේ හිරුගේ රෝස පාට තුවාය ඇය දෙසට විසි කරමින් ය. සුබා කොහොමත් කෝමළ චරිතයකි. බොයිස් ස්කූල් එකෙ හැන්ඩියෝ කීප දෙනෙක් ම ඇය පස්සෙන් ආවත් ඇය නෙවෙයි උන් දෙස හැරිලවත් බැලුවෙ. හිරු තුවාය අල්ලාගෙන ටෙඩියාගෙන් සුබාට ගැසුවේ ඔරවාගෙනය .ඒ ඉතින් තරහට නොවන බව මේ යෙහෙළියෝ දනී .
හිරු ගියපසු සුබාත් පිංකිත් කතාවට වැටුනි
වතුර වීදුරුවෙන් කට සෝදා කිරි එක අතට ගත් සුබා
"මොකක්ද පිංකියෝ කතාව? "
"අපි අර කඳුලු ගුහාව හොයන් යමුද ?"
"මොකක් උබට පිස්සුද? "
සුබාට බිබි හිටිය කිරි එකත් ඉස්මොල්ලෙ ගියේය.
"අර බය ගුල්ලිනම් කැමති වෙන්නෙ නෑ ඕකට පිංකියෝ ."
"මේකයි මම දන්නව ඕකට යන්න. "
"මොනව ??"
"ඔව් මගෙ සීය වෙද මහත්තයෙක්. එයාගෙ පුස්කොල පොතක ඔය ගුහාවට යන පාර තිබ්බ මට මතකයි. "
"ඉතින් සීය නැනෙ දැන්. "

"ඉතින් නැති උනාට ඒ පොත් ටික තියනව. "
"මටත් නම් යන්න ආස හිතෙනව අපි හිරුටත් කියල බලමු."
"ආන් හිරූ ආව ඉක්මනට වොශ් දාගෙන එන්නකො. "
සුබාට පිංකි පවසන විටම හිරූ එතනට ආවේ..
"මොනවද දෙන්නගෙ රහස් සාකච්ඡා "
යි කියා අසමිනි.
"මොන රහස් සාකච්ඡාද? ඕන් පිංකිගෙන් අහ ගන්නකො. "
කියමින් ම සුබා වොශ් රූම් එකට දිව්වෙ තුවාය කරේ දා ගනිමිනි.
"අනේ පිංකියෝ මොකක්ද බන් මටත් කියපන් කො. "
"මමයි සුබයි කතා උනේ කඳුළු ගුහාව බලන්න යන්න. "
"මොනව? උඹට පිස්සුද කවුද දන්නෙ ඔහොම එකක් තියනවද කියලවත් ඕන් මටනම් බෑ . "
"අපෝ බය ගුල්ලි අපිට ඒ ගැන තියන පුස්කොල පොතක් තියනව. "
"පුස්කොල පොත් කියන්නෙ මොනවද ?"
"අපෝ ඒකවත් දන්නෙ නෑ ඔය රජ කාලේ ඒවගෙනෙ ලියල තියෙන්නෙ. හිරු ඔයා එන්නම ඕනේ ."

"අනේ මම බයයි නෙ ඔිවට. "
"බය ඇරෙන්නත් එක්ක යමු අපි එක්ක "
එසේ කිව්වෙ පිටුපසින් ආ සුබාය.
"මේ ඒක නෙවේ මොනවද උදේට කන්නෙ නිවාඩු කාලෙ හින්ද හොස්ටල් එකේ දිය බත් කෑවොත් හරි නෑනෙ. "
තිදෙනාම සිනාසුනෝය .
"අපි එලියෙන් කමු,"
ඒ පිංකිය
" අද කොහොමද? බන් යන්නෙ ඩොරති මිස් ට හොරෙන්. "
සුබාගේ පැනයට පිළිතුරු දුන්නෙ හිරුය.
"වරෙල්ල යන්න මාත් එක්ක ඩොරති මිස් දැක්කොත් මන් බලා ගන්නම්. "
"යකෝ කන්න කිව්වාම මේකිගෙ මොන බයක් වත් නෑනෙ බන්. "
පිංකි කිව්වෙ සුබාට තට්ටුවක් දමමිනි.
ඔවුන් තිදෙනා හොර පූසියන් වගේ අරලිය ගස් අතරින් ගේට්ටුව ලඟට ගියේ වටපිට බලමින් ය.
යන අතරේ එකොලහ වසර පංතිකාමර ලඟ තියන රඹුටන් ගහ දෙස බැලූ පිංකි.
"මේ බන් රඹුටන් තියනව රඹුටන් ගහේ. "
"ඔව් බන් රඹුටන් ගස් වල අඹ හැදෙන්නෙ නෑනෙ?"

එසේ කීවේ සුබාය.
"මේ කඩමුද රඹුටන්? "
පිංකිට ඉවසුමක් නැත .
"ඇයි මතක නැද්ද එක සැරයක් ඔය ගහේ රඹුටන් කඩල කට්ටියම මිදුලමැද්දෙ පැදුරක් එලන් රඹුටන් කෑවා. "
ඒ හිරු මතක් කලේ අතීත සිද්දියකි රඹුටන් කඩා අසුවී ප්‍රින්සිපල් මැඩම් හැමෝටම අමු රඹුටන් කන්න කිවූ හැටියි .
රඹුටන් ගස් දෙස බලමින්ම තිදෙනා ගේට්ටුවෙන් එලියට ආවෝය .
තිදෙනාම ගියේ මිශෙල් අක්කාගේ ෆූඩ් සෙන්ටර් එකටයි.හුඟක් බාලිකාවේ සිසුවියන් පිටට ගියොත් කෑම ගත්තේ මිශෙල් ගේ ෆූඩ් සෙන්ටර් එකෙනි .
"මොනවද බන් කන්නෙ? "
ඒ සුබාය සුබා නිතරම මොනවා හරි කයි. චොකලට් ටොෆි ශෝටීස් එයාගෙ බෑග් එකෙ වරදින්නේ කලාතුරකිනි .
"අක්කෙ මොනවද උදේ කෑමට තියෙන්නෙ "
ඒ පිංකිය.
"නංගි බත් තියනව ,නූඩ්ල්ස් තියනව ,සැන්ඩ්විච් තියනව ,ඉදිආප්ප තියනව. "
"නූඩ්ල්ස් කමු නේද බන්?"

පිංකී තම යෙහෙළියන් දෙසට හැරෙමින් ඇසුවාය.
යෙහෙළියන් දෙදෙනාම හිස වනා එය අනුමත කලෝය.
තුන්දෙනාම බඩ පිරෙන්න නූඩ්ල්ස් කා චොකලට් කිරි බීවෝය.
"අම්මෝ නියමයි නේ? "
සුබා පවසත්ම.
"නියමයි නියමයි යමුනේද මිස් ඩොරතිට අහු උනොත් වසල හමාරයි."
පිංකි පැවසුවේ මිගෙල් ට මුදල් ගෙවා පැනඩෝල් කාර්ඩ් එකකුත් ගෙන කඩෙන් එලියට අවාය.
"මොකද බන් පැනඩෝල්? "
හිරු අසද්දී.
"බලන් ඉඳපන් කො. "
ඔවුන් කතාවෙන් කතාවෙන් ගේට්ටුව ලඟට එද්දි දුටු දෙයින් මුහුණු බියෙන් හැකිලිනි.
පිංකි පමණක් කිසිදු බියක් නැතිව ඉදිරියට ගියාය.
ඔවුන් දෙස ඔරවාගෙන බලා සිටියේ වෙන කවුරුත් නෙවෙයි ඩොරති මිස් ය .
"හොර පූසියො තුන්දෙනා කොහෙ ගිහින් ද මේ එන්නෙ? "
කර්කශ හඬකින් ඩොරති මිස් විමසුවාය .
ඒ පැනයට උත්තර දුන්නෙ පිංකි ය.

Author KUSHAN HETTIARACHCHI

"මිස් මේ සුබාට ටිකක් සනීප මදි ඉතින් මේ පැනඩෝල් ටිකක් ගන්න ගියා. "
"පැනඩෝල් කාර්ඩ් එකක් ගන්න තුන්දෙනෙක් යන්න ඕනද ?"
"මිස් අපි ගියේ මෙයාට උදේ බඩේ අජීරණයක් තිබ්බ හින්ද කෝපි එකක් අරන් දෙන්නත් එක්ක. "
"හා හා යනවල යනවල. "
තුන් දෙනාම ඉක්මන් ගමනින් තම කාමරයට ආවෝය.
"අම්මෝ ඇති ඔයින් ගියා. "
සුබා කිව්වෙ අනිත් දෙදෙනා දෙස බලාය.
"මගෙ මොලේ හින්ද තමයි නැත්තම් කට්ටියට කාපුව දිරව ගන්නත් බැරි වෙනව. "
එසේ කිව්වෙ පිංකිය.
තුන්දෙනාම තම ඇද මත ඉඳ ගත්තේ උදේ කල සාකච්ඡාව නතර කල තැනින් පටන් ගනිමින් ය.
"හිරු මොකද කියන්නෙ නිවාඩු කාලේ කඳුලු ගුහාව බලන්න යමුද? "
සුබා අසද්දී.
"අනේ මට බයයි බං ඕවගෙ යන්න උඹල දෙන්න පලයල්ල."
"යනවනම් තුන්දෙනාම යන්නෙ නැත්තම් එක්කෙනෙක් වත් යන්නේ නෑ. "

KUSHAN HETTIARACHCHI Author

පිංකි එසේ පවසමින් තම යෙහෙළියන් දෙස බැලුවාය.
"හරි මම එන්නම් ඒත් අපි කොහොමද යන්නෙ අපිට දවසකට වඩා ඉන්න බෑනේ. "
"ඒකට පිළියමක් තියනව අපි ගෙදර යනව කියල යමු. "
පිංකි පවසද්දි.
"බොරු කියල ගිහින් ඩොරති මිස් ට අහු උනොත්."
"හිරු කවුද බන් බොරු කියල යන්නෙ උඹයි මමයි දෙන්නම ගෙදරට කියමු අපි මේ නිවාඩුවට පිංකිලගෙ ගෙදර යනව කියල. "
සුබා එසේ පවසද්දි.
"ඔය තියෙන්නෙ ගොන් නෑම්බියො දෙන්නට මොලේ."
යි පිංකි පැවසුවේ සිනාසීය.
"කොහෙද බන් ඔය ගුහාව තියෙන්නෙ පිංකියො."
"ඕක තියෙන්නෙ සුබා අපේ ගෙවල් කිට්ටුව කැලයක් තියනව රජ වත්ත කැළේ කියල අක්කර ගානක් තියනව ඒක ඇතුලෙ තියෙන්නෙ. "
"අක්කර කීයක් විතරද? "
"එහෙම දන්නෙ නෑ අක්කර දෙතුන්සීයක් ඇති. ඒක පුරාවස්තු ගොඩක් තියන තැනක් ලු. ඔය කදුළු ගුහාව කියන එක ලඟට ගියාම ඇතුලෙන්

KUSHAN HETTIARACHCHI

ගෑනු ළමයෙක් අඬනව ඇහෙනවලු. හැබැයි මෑත කාලෙ දැකපු කෙනෙක් නම් නෑ. ඔය ටික තිබුනෙත් අර පුස්කොල පොතේ තමයි ."
"අම්මෝ අපි තුන්දෙනා විතරක් ඕක බලන්න යන්න, මටනම් බෑ අනික කෙල්ලො තුන්දෙනෙක්ට ඕකට යන්න දෙයි ද? "
ඒ කවදත් බය ගුල්ලි හිරූ ය .
"ඉතින් කව්ද අනේ ඔවා කිය කිය යන්නෙ නේද? මෙයා තමයි. කිව්වෙ අඟර දඟර දමමිනි. සුබා කොහොමත් කෝමළ කාරියකි .
"හරි අපි හෙට උදේම අපේ ගෙදර යමු. ගිහින් යන විදිය තීරණය කරමු .ඔය දෙන්න දැම්ම ගෙවල් වලට කතා කරල මේ ගැන කියන්න. "
එසේ කියූ පිංකි ඇඳෙන් නැගිට වොශ් රූම් එකට ගියාය .
මේ අතර සුබා සහ හිරූ ගෙවල් වලට කතා කර අවසර ගත්තෝය. සුබාටනම් වැඩි ප්‍රශ්නයක් නොවුනේ ඇයගේ මව සහ පියා ලංකාවෙ නොමැති බැවිනි.ඇය අවසර ගත්තේ ඇගේ ආච්චිගෙන් ය.හිරුගේ මව නම් වසර දුන්නෙ පිංකි ලාගේ නිවසට යන නිසයි. ඇය පිංකිගේ පවුලේ අය හොඳට  දන්න නිසා අවසර ලැබුනි .
"දැන් ගෙවල් වලින් ෆර්මිශන් හරිද ?"
පිංකි ආවේ එසේ අසමිනි.

"අපි හරි. "
"එහෙනම් තුන්දෙනා ම හෙට උදේම යමු නෙද ?"
හෙට ගමනට අවශ්‍ය බෑග්ස් සූදානම් කල තිදෙනා එදින රෑ නින්දට ගියේ පසුදා උදේ ඇහැරීමේ බලාපොරොත්තුව ඇතිවය .

"ඒයි නැගිටපල්ලා මැට්ටියො දෙන්න. "
උදේ පාන්දර ඒ ගෝරනාඩුව පිංකිගෙන් ය.
"ඇයි බන් මෙච්චර උදෙන්. "
සුබා ඇඟමැලි කඩා හිස කසමින් අවදි වී ඇසුවාය.
"ඇයි අද යන්නෙ නැද්ද ?"
පිංකි ඇසුවේ සැරෙන් වගේය.
තිදෙනාම නැගිට ඉක්මනට සූදානම් වූහ .
උදෑසන නවය වන විට තිදෙනාම හොස්ටල් රූම් එක ලොක් කර එලියට ආවේ ලොකු බෑග් තුනකුත් එල්ලාගෙනය .
පිංකි ඉස්සර වී ගමන් ගත්තෙ ඩොරති මිස් ගේ ඔෆීස් එක ලඟටය .
ඒ වන විටත් වෙලාවට වැඩ කරන ඩොරති මිස් ඔෆීස් එකෙ සිටියාය.
පිංකි එන සද්දය ඇසී හිස එසවූ ඇය.
"නිමේෂා මොකද මේ බෑග්ස් අරන් ගෙදර යන්නද?"
නිමේෂා යනු පිංකිගේ නියම නමයි හිරුගෙ නම

හිරුණි වන අතර සුබාගේ නම සුබෝධාය.
"ඔව් මිස් "
ඇය පසු පසින් සිටි මිතුරියන් දෙස බැලූ ඇය.
"ආ තුන්දෙනාමද යන්නෙ, යන්නෙ නෑ කිව්ව නේද?"
"නෑ මිස් අපි ගිහින් සතියකින් විතර එනව අපි ගිහින් එන්නම්. "
"හොඳයි හොඳයි පරිස්සමට යන්නකෝ. "
ඔවුන් කෑගල්ල බස් ස්ටෑන්ඩ් එකට ආවේ ත්‍රී වීල් එකකය .
ඉන්පසු මාතලේ බලා යන සාමාන්‍ය බසයකට ඔවුන් නැගුනේ ඒ වේලාවේ සෙනග මද නිසාය .
තිදෙනා හරිබරි ගැසී වාඩි උනේ කිලෝමීටර් හැට ගානක් යන්න තිබෙන නිසා පැය දෙක තුනක ගමනකට ලෑස්ති වෙමිනි .
"දැන් ඉස්සරලම මොනවද කන්නෙ? "
පිංකි ඇසුවේ මගදී කන්නට ගත් ලොකු ශොර්ටීස්ට් බෑගය දෙස බලමිනි.
"වඩේ ටික කමු බන්. "
ඒ හිරුය.
"මම නම් කියන්නෙ එග් බන් ."
සුබා කිවේ බීම බෝතලයේ මූඩිය විවර කරමිනි .
බසය ගමන ඇරඹෙන විට තව විනාඩි කිහිපයක් ගත උනි.

රැයට සඳ සේ ...
සඳට තරු සේ
මා ළඟින් උන්නා
බසයේ නිශාන්ත අලහකෝන් ගැයූ ගීතයක් වාදනය වේ.
ඔන්න සිංදු පිංකි කිව්වේ හිරුගේ මුහුණට එබෙමිනි "ඒ සිංදුව ලස්සනයි නේද?"
ඒ සුබාය .
"නිශාන්ත ඔය කියන ඔය සිංදුව ලියල තියෙන්නෙ කුෂාන් හෙට්ටිආරච්චි. "
ඒ පිංකිය.
"කවුද කුෂාන් කියන්නෙ."
ඒ හිරුය
"ඇයි බං අර "මිනෝලි" කියන ෆේමස් නවල් එක ලිව්ව රයිටර් "
ඒ සුබාය.
කතා වෙන්ම බසය ගමනාන්තයට ආවේය.
සිංදුවේ ලින්ක් එක
https://www.youtube.com/watch?v=MW4Rec-35Gs
තිදෙනා මාතලේ ටවුන් එකෙන් බසින විට දහවල් එක පමණ වී තිබුණි .ඔවුන් පාර මාරු වෙන්න හදන විටමයි පිංකිලාගේ තාත්තාගේ කිරිපාට නිසාන් සෙඩ්‍රික් කාරය ඔවුන් අසල නැවැත්වූයේ.රියදුරු අසුනේ සිටියේ ඔවුන්ගේ

KUSHAN HETTIARACHCHI

රියදුරු කරුණාපාලය .
කෙල්ලො තුන්දෙනා ඉක්මනින් කාරයට නැගුනේ බඩුමලු ඩිකියට දැමීමෙන් අනතුරුවය.
"කරුණාපාල මාමෙ කෝ තාත්තා "
පිංකි ඇසුවේ ඉදිරිපස අසුනේ වාඩිවෙන ගමන් ය.
"ලොකුමහත්තය හදිස්සියේම සතියකට නුවර එලියෙ තේවත්තට ගියා. එහෙ අලුතින් හදන ෆැක්ටරි එකේ වැඩ වගේකට. "
"ඒකත් හොදයි. "
පිංකි තමන්ටම කියා ගත්තේ තමන්ගේ ගමනට තිබුන ප්‍රදානතම බාධකය ඉවත් වී ඇති නිසාය .
විනාඩි දහයකින් පමණ ඔවුන් නිවසට ඒමට සමත් උනෝය.නිවසට එන විට පිංකිගේ මව ඉදිරියට ආවේ සිනාසීගෙනය.තුන්දෙනාම කාර් එකෙන් බැස ගෙතුලට වන්හ.කරුණාපාල ගැහැණු ළමුන්ගේ ගමන් මලු ටික ඔවුන් සඳහා පිංකිගේ මව සූදානම් කල කාමරයට ගෙනාවේය .
"දුවල එනව කිව්ව හින්ද මම ඔයාලට වෙනමම කාමරයක් සූදානම් කලා."
පිංකිගේ මව එසේ කියමින් ම ගෙතුලට ආවාය.
"මැණිකා මේ බේබිලාට කෑම සූදානම් කරන්න. "
ඇය ගෙතුල සිටි මැණිකාට ඇසෙන සේ සාලයේ සිට පැවසුවාය .
"හොදයි නෝනා කෑම උයල ඉවරයි. මේ පපඩම්

බදින ගමන්. "
"දුවල වොශ් එකක් දාගෙන කෑම මේසෙට එන්න."
කිව් ඇය පිංකි දෙසට හැරී.
" පිංකි ඔයත් යාලුවො එක්ක මේ කාමරේම ඉන්නවද? "
"ඔව් අම්මා එහෙම හොඳයි නේද ?"
"දුවා ගෙ කැමැත්තක් ."
ඇය මුළුතැන්ගෙයට යන විට කෙල්ලො තිදෙනා ඔවුන් වෙනුවෙන් සූදානම් කල කාමරය වෙත ගියෝය .
"මේ හොඳට නා ගනිල්ල මෙහෙ වතුර තියනව. "
පිංකි කිවේ එකට යා කොට තිබු ඇඳන් තුන මත ලොකු බෙඩ්ශීට් එක එළමින් ය .
"ඇයි අපි වෙනද නාන්නෙ ඇද්ද සුදෝ. "
සුබා පැවසුවේ පිංකිගේ තිකට අත ගාමිනි.
හිරු ඉක්මනින් වොශ් රූම් එකට වැදී නා ගත්තාය.
ඒ අතර පිංකිත් සුබාත් කාමරය අස් කර ගත්තෝය.
ඔවුන් තුන්දෙනා ලෑස්තිවී කෑම මේසයට යන විට අම්මා කෑම මේසයට වී ඔවුන් තිදෙනාව බලාපොරොත්තුවෙන් සිටියාය .සියල්ලෝම වාඩි වූ පසු ඔවුන් කෑම ගැනීම ආරම්භ කලෝය .
"අම්මා සීයගෙ කාමරේ යතුර අම්ම ලඟ නේද

තියෙන්නෙ "
පිංකි කතාවට මුල පිරුවේ නිහඬතාවය බිඳිමින් ය.
"ඒක නම් මගෙ කාමරේ අල්මාරියේ ලාච්චුවේ ඇති. මොකද දුවට හදිස්සියෙ සීයගෙ කාමරේ යතුර. "
"අම්මේ අපි මේ නිවාඩුවට ආවේ අපේ ඉස්කෝලෙ වැඩකටත් එක්කයි. අපි මේ අපේ ප්‍රොජෙක්ට් එකට කරුණු වගයක් හොයන්න ඕනේ සීයගෙ පුස්කොල පොත් වල තිබ්බ. තොරතුරු එවාත් ඕනේ ඒ එක්කම රජවත්ත කැළේ ට යන්නත් ඕනේ පුරාවස්තු අධ්‍යයනයට. "
"දුව සීයගෙ කාමරේ යතුරනම් දෙන්නම්.මේ තාත්තත් නැති අතරෙ කැලෑ ගානේ රිංගන්නනම් මට කොහෙත්ම ෆර්මිශන් දෙන්න බෑ "
"අනේ අම්මා කැළේ ට නොගියොත් අපි මේ ආපු එකෙන් ඇති වැඩකුත් නෑනේ අම්මා ,අනික දවස් තුන හතරක් කෑම්පින් කරන්න හිතන් ආවෙ අපි."
"දුව ඔයාට පිස්සුවක් හැදීගෙන එනවද? ඔයාලා වගේ තරුණ ගෑනු ළමයි තුන්දෙනෙක් තනියම කැළේ යවන්න ."
"ආන්ටි මෙහෙමයි ඔයා කලබල වෙන්න එපා. අපි මේ ගැන අධ්‍යයනයකරල නෙ අන්තිමට කැළේ ට යන්නෙ ඉතින් අපි තව කවුරු හරි පිරිමි කෙනෙක්

හොයා ගමු. "
ඒ සුබාය .
"දුව ඔයාල දෙන්න ගැනත් වගකීම තියෙන්නෙ මට නෙ දරුවනේ මම කොහොමද ඔයාලව තනිපංගලමෙ කැළේ ට යවන්නෙ? "
"අම්මා හොඳ විදිහක් බලන්න අපිට කොහොමත් මේ වැඩේ වෙන්න ඕනේ නැත්තම් අපි ආව එකෙ වැඩක් නෑනේ අපි හෙටම අපහු යනව."
"ඕකනෙ පිංකි ඔයාට තරහ යනවනෙ මම බලන්නම් ක්‍රිෂාන් අයිය වත් ඉන්නවද කියල මේ දවස් වල "
(ක්‍රිෂාන් යනු පිංකිගේ නැන්දාගෙ පුතාය ඔහු විශ්වවිද්‍යාල සිසුවෙකි )
"අනේ අම්මා මම නම් එයාට කැමති නෑ පණ්ඩිතයනෙ එයාගෙ කතන්දර අහ අහ අපට ඉන්න වෙයි. "
"එහෙම කියන්න එපා පිංකි අයියත් එක්ක යමු. "
ඒ සුබාය .
"උඹටත් කොල්ලෙක් කිව්වොත් නලියනවනෙ ඉතින්. "
පිංකි කිව්වෙ ඔරවාගෙනය.
"මොකද උඹ සද්දෙ වහල. "
සුබා ඇසුවේ හිරූ ගෙනි
සුබා එයට පිළිතුරු දුන්නෙ හිනාවකිනි.

sinhalaebooks.com

"හරි අම්මා ක්‍රිෂාන් අයියා එනවනම් හසරැල් මල්ලිටත් එන්න කියමු එතකොට පස්දෙනෙක් ඉන්නවනෙ සතියක් කැළේ හිටියත් ප්‍රශ්නයක් නෑ ඒ දෙන්න අයියයි මල්ලියි හින්ද ඕකේ. "

පිංකි තම අවසාන තීරණය දුන්නාය. ඇය ක්‍රිෂාන්ගේ මල්ලි හසරැල් ට වඩාත් ඇලුම් කලාය ඔහු දඟකාර කොලු ගැටයෙකි .ඒ වගේම පිංකි ආ විට අතේම එල්ලුන ගමන් ය .

කෑම කා සීයාගේ කාමරේ යතුර හොයාගත් යෙහෙළියන් තිදෙනා ඒ කාමරය දොර විවර කර ගත්තේ තරමක් අපහසුවෙනි. "කිරි කිරි ටික් ටික් "හඬක් නංවමින් දොර විවර විය කාමරය පුරා මකුලු දැල් පිරිලාය. .

"අම්මෝ පිංකියො මේක භූත මාලිගාව වගේ නෙ." හිරූ කීවේ අතේ තිබූ කොස්සෙන් මකුලු දැල් කඩමිනි.

"ඔව් බන් මේකට කවුරුත් වැඩිය එන්නෙ නෑ සීයගෙ මරණෙන් පස්සෙ. "

"ඇයි සීයා හොල්මං කරනවාද?"

සුබා ඇසුවේ සිනාසෙමිනි.

"පිස්සුද? සුබා මේ තියෙන්නෙ සීයගෙ පෙට්ටගම ඕකෙ තමයි අර පුස්කොල පොත තිබ්බෙ. "

පිංකි කීවේ සුබාව ගණනකට නොගෙන පෙට්ටගම අරින්න තැත්කරමිනි .

sinhalaebooks.com

"කෝ ඉඳපන් ඕක තනියම අරින්න බැරි වෙයි, හිරු වරෙන් "

සුබා හිරුටත් කතා කලාය තුන් දෙනා ටිකක් මාරුවෙන් පෙට්ටහම විවර කලෝය .

විවර වූ පෙට්ටගමේ උඩින්ම තිබ්බෙ පරණ රෙදි කෑලි වගයකි තිදෙනාම පරණ රෙදි එලියට දැම්මේ තරඟයට මෙනි .ඊලඟට පරණ පොත් වගයකි .පොත් ටික එලියට ගත් විට පිළිවෙලට අඩුක් කර තිබ්බෙ පුස්කොල පොත් ටිකයි .

"මේ තියෙන්නෙ. "

සුබා පැවසුවේ සතුටිනි .

එහෙත් පිංකි ගේ මුහුණේ තිබුනේ ප්‍රශ්නාර්තයකි.

"ඇයි බන් මොකද අවුල? "

හිරු අසද්දි.

"නෑ බන් ඒ පොත මෙතන නෑ වගෙයි ඒකෙ පිට ලී පතුර දුඹුරු පාටයි මේ තියන ඒවගෙ ඔක්කම කහ පාටයි ඔය කහ පාට ඒවගේ ඔක්කම තියෙන්නෙ බෙහෙත් වට්ටෝරු දුඹුරු පාට එව්වගෙ තමයි මන්තර ඔය ඉතිහාස තොරතුරු තිබ්බෙ. "

"මෙතන තියන එව්වනම් ඔක්කම කහපාට එවා කමක් නෑ මේවත් එලියට ගමු සමහර විට යට ඇති. "

ඒ කිව්වෙ සුබාය .
"තිදෙනාම පුස්කොල පොත් ටික එලියට ගත්තොය. "
අවසාන පොතත් එලියට ගත්තාට පසු තිදෙනාගේ මුහුනේ තිබුනේ බලාපොරොත්තු සුන් වුන සේයාවකි. තිදෙනාම මහන්සිය නිසාම පෙට්ටගම ලඟ බිම ඉදගත්තෝය .
"පිංකි දැන් මොකද කරන්නෙ අපේ සම්පූරණ උත්සහය වතුරෙ. "
එ පැවසුවේ හිරුෑය.
"අනේ මන්ද බන් ඔය පොත තිබ්බෙ මේ පෙට්ටියේ හැබැයි මම දැක්කෙ දැනට අවුරුදු හත අටකට උඩදි සීයා නැතිවෙන්න කිට්ටුව ."
"බන් සීය නැති උනාට පස්සෙ කවුහරි ඉස්සුවද දන්නෙ නෑ පොත වටිනවා කියල දැනගෙන. "
"නෑනෙ බන් මේ කාමරේට කවුරුවත් එන්නෙ නෑ අනික සීයගෙන් පස්සෙ යතුර අම්ම ලඟමයි තිබුනෙ ."
"ඒහෙනම් මේ කොහෙ හරි තියෙන්න ඕන බන් ඔය පොත. "
ඒ හිරුෑගෙනි
"පිංකි බන් මට සැකයක් තියනව මේ බලපන් මේ පෙට්ටගමේ ඇතුලෙ ගැඹුරයි පිටින් පේන ගැඹුරයි වෙනස් නේද? "

සුබා පැවසුවේ යලිත් නැගිට පෙට්ටගමට එබෙන ගමන් ය .
"උඹ හරි බන් ඒ කියන්නෙ පෙට්ටගමේ හොර ලාච්චුවක් වගේ එකක් තියෙන්න ඕනෙ "
ඒ පිංකිය
තිදෙනාම එකවරම පෙට්ටගමට එබුනෝය හිස් පතුල හැර කිසිවක් ඔවුන්ට පෙනුනේ නැත .
"මේ හොදට බලන්න මේ පතුලෙ තියන රටාව "
ඒ පෙන්නුවේ හිරු ය
"ඔව් මේ ලීයෙ නිකන් බට්න් වගෙ තියෙන්නෙ මට හිතෙන්නෙ මේ බට්න් යම්කිසි විදිහකට එබුවාම හැංගිලා තියන ලාච්චුව ඇරෙනව "
"ඔයා හරි පිංකි ඒත් අපි මේක අරින්නෙ කොහොමද? "
"ක්‍රමයක් හොයමු ක්‍රමයක් ඇති, ඉන්නකෝ මේ පුස්කොලපොත කහ පාට නෙවෙයි නේ රෝස වගේ නේ නේද ?"
පිංකි කිව්වෙ තරමක් වෙනස් පාටක් තිබූ පුස්කොල පොත අතට ගනිමින් ය .තිදෙනාම එකතු වී ඒ පුස්කොල පොතේ බැමි ලිහා පොත විවර කලෝය .
පුදුමයකි එය පොතක් නොව පොතක් විදිහට හැදූ පෙට්ටියකි එය විවර කරන කම්ම ඔවුන් සිතා සිටියේ එය පුස්කොල පොතක් කියාය

.පෙට්ටිය තුල වූයේ රෝල් කරන ලද පුස් කොලයකි .
"[රහස් අගුල විවර කරන අයුරු ... කැට නමයෙන් මැද කැටය වරක් තදකර තුන සහ හය යන කැට දෙවර බැගින් පිළිවෙලින් තද කර නැවත මැද කැටය තද කරගෙන සිටින්න දොර විවර වේ] "
"[සැලකිය යුතුයි ඔබ වැරදි දිශාවේ සිට කැට තද කලහොත් යලි ඔබට උත්සහ කිරීමට සිදුවනුයේ ඔරලෝසු පැය දොලහකට පසුවයි]"
"ඈ බන් මේක ලේසි වැඩක් නෙවෙයි වගේ "ඒ සුබාය.
"මේකට ක්‍රමයක් ඇති. "
හිරු කීවේ තල්පත දෙස හොදට බලමිනි.
"දිශාව කොහොමද හොයා ගන්නෙ වරද්ද ගත්තොත් පැය දොලහක් බලන් ඉන්න වෙනව අවම පැය තිස් හයක් වත් බලන් ඉන්න වෙනව හරි යට හරියන්න ".
"මේක ලේසි විදිහකට තියෙන්න ඕන කෝ ඕක දියන් මට බලන්න. "
කියමින් සුබා තල් පත හිරුගේ අතින් උදුර ගත්තාය .
"උඹල දෙන්න තියන තෙලේට නටල පුලුවන් නම් ඕක ඉරපල්ල. "
පිංකි මැදට පැන්නාය.

"මේ මේකේ උඩ ඩොට් එකක් තියනව අපි බලමු පෙට්ටගම පතුලෙත් ඕක තියනවද කියල "
සුබා හරියට හැසිරුනේ රහස් පරීක්ෂිකාවක වගේය .
තිදෙනාම යලිත් පෙට්ටගමට එබුනෝය පුස්කොල පොතේ ලෙස ඩොට් එකක් තිබුනේ ඔවුන් සිටි පැත්තෙනි .
මේ පෙට්ටගම නම් අගනා නිර්මාණයකි මෙහි පියන පැත්තේ සිට යතුරු එබිය යුතු වේ .කවුරුත් හිතන්නෙ නැති දෙයකි.
"පිංකි ඔයා අගුල අරින්න බලන්න. "
සුබා ඇයට තල්පත දුන්නාය.
පිංකි ඉතා පරිස්සමට බොත්තම් එබුවාය ඒ හිමීට කියවමිනි.
"මැද එක තුන, තුන, හය.හය මැද එක "ඔබාගෙන සිටියත් වෙනසක් නොවුනි.
"වැඩකරන්නෙ නැද්ද? "
සුබා සහ හිරු එකවරම වගේ ඇසුවෝය.
"ම්ම් හ්ම් නෑ වගෙ. "
පිංකි මැද බටන් එකෙන් අත ඉවතට ගත්තාය.
"ක්ලික් ටික් ටික් කට කටස්. "
පෙට්ටගම පතුලින් ඒ ශබ්දය ඇසෙන්න ගත්තෙ පිංකි අත ඉවතට ගනිද්දීමයි . පුදුමයකි පෙට්ටගමෙ පතුල ටික ටික උඩට එයි තිදෙනා

පුදුමයෙන් බලා සිටියි .පතුල මැදක් උඩට ඉස්සී නතර විය .
"ක්ලික් "
හඬින් පතුල දොරක් සේ ඇතුලට ඇරුනි තිදේනාම පෙට්ටගම ඇතුලට එබුනෝය
ඇතුලේ දුඹුරු පැහැ පුස්කොල පොත් දෙකක් පිත්තල පීරිසියක් වගේ දෙයක් සහ කලුපාට තෙල් බෝතලයක් තිබුනි. තිදෙනා ඒ දේවල් අතට ගත්තෝය .
"දැන් මේ තියන ඒව පෙට්ටගමට දාමු මේ රහස් ලාච්චුව වහන්නෙ කොහොමද? "
පිංකි අනිත් දෙදෙනාගේ මුහුණු දෙස බැලුවේ පිළිතුරක් බලාපොරොත්තුවෙනි .
"අර යටට ඇරුනු දොර පියනෙ හැඩල් එකක් වගේ කෑල්ලක් තියනව ඉස්සිල දැන්. "
සුබා කිව්වෙ ඒ හැඬල් එකෙන් අල්ලා උඩට දොර උස්සන ගමන් ය. දොර වැසුන ගමන් .
"ක්ලික් ටික් ටික් කට කටස් "
හඬක් නගමින් පතුල යලි පහතට ගියේය .
තිදෙනා යුහුසුලුව ඉතිරි බඩු පෙට්ටගමට දමා වැසුවෝය .
පුස්කොලපොත් දෙක සමග ඉතිරි ටික රැගෙන ඇඳමතට ආ ඔවුන් රෑට මේ පොත් කියවන්න කතිකා කර ගත් හ .තිදෙනාටම එලියට ඇවිත්

මිදුල කෙලවර උණ ගස් අතරේ තිබූ බංකුව මත ඉඳගත්හ .
මුලින්ම කටහඬ අවදි කලේ සුබා ය.
"පිංකියො උඹලගෙ ක්‍රිෂාන් අයිය කොහොම කෙනෙක් ද ?"
"අම්මට බොල හිරුවො බලපන් කො මේකිගෙ මූනේ තියන මනමාල පාට. "
"මගුලකට නෙවෙයි මගෙ ෆේස්බුක් එකෙත් ඉන්නව ක්‍රිෂාන් කියල කෙනෙක්. "
"ආහ් එහෙනම් අපේ මස්සිනා පැණිය වෙන්න ඇති ,මූද? "
පිංකි වාහනයකට හේත්තු වී අතේ DSLR එකක් ගත් කොල්ලෙකුගේ පින්තූරයක් සිය ෆෝන් එකෙන් පෙන්නුවාය.
"දැට්ස් අ බෝයි මෙයා තමයි බන්. "
සුබා කීවේ ප්‍රීතියෙනි.
"උඹෙ කෘශ් එකක්ද? "
පිංකි ඇසුවේ සුබාගේ මූහුණට එබෙමිනි .
"කෘශ් මම දන්නෙ නෑ එයා ෆේමස් රයිටර් කෙනෙක් නෙ ෆේස් බුක් එකේ මම එයාගේ ෆෑන් කෙනෙක් ,දවසක් මම එක්ක චැටුත් කලා "ආදර මීනු "කියල එයාගෙ ෆේමස් නවල් එකක් තිබ්බෙ එයාව නොදන්න කෙනෙක් නෑ ලව් ස්ටෝරිස් ලස්සනට ලියනව "

"අපොයි මෙයා අහුවෙලා වගේ එයාගෙ බටර් වලට කෙල්ලො ඉතින් අහුවෙනවනෙ. "
පිංකි කීවේ ඇසක් ඉඟිමරාය .
"එයා එහෙම නෑ බන් "
"හරි හරි මේ ගමන ගිහින් ඉවර වෙලා මගුල් ගේකුත් ගන්න පුලුවන් වෙයි .. මගෙ මස්සිනා ගැන මට වඩා උඹ දැනගන්න විදිහක් නෑනෙ සුබා බතලී ,හිරූ ,අනික මේකි අර බොයිස් ස්කූල් එකෙ සහන් ට කැමති නැත්තේ ඕක තමයි. "
පිංකි කීවේ සුබාට තට්ටුවක් දමමිනි ..
"සහන් ල වැඩක් නෑ බන් පොපියුලර් නෑ නෙ. "
හරි හරි දැන් ටිකක් ඉදල සෙට් වෙමු අපි කෑම්පින් කරණවනම් දවස් හතරකටවත් හරියන කෑම ඕනේ.
"අපි ක්ෂණික නූඩ්ල්ස් ටිකක් අරන් යමු. "
ඒ හිරුය.
"ඒක හොදයි තව බිස්කට් චීස් ෆ්රුට් ඒව අරන් යන්. "
සුබා කියද්දී.
"රජවත්ත කැළේ ගාවම ෆාර්ම් එකක් තියනව අපි දන්න. අපිට එහෙන් බිත්තර එහෙම ගන්න පුලුවන්. අපේ වාහනේ දාන්නත් පුලුවන්. "
පිංකි එසේ පවසද්දී .
"අපි වාහනේකද යන්නෙ? "

හිරූ ඇසුවාය .
"ඔව් ක්‍රිෂාන් අයියා ආවොත් එයාගෙ වාහනේ නැත්තන් ඔය ගමන යන්න වෙන්නේ කරුණාපාල මාමා එක්ක තමයි. "
පිංකි පවසද්දී .
"අපෝ කරුණාපාල මාමා හරියන්නෙ නෑ ක්‍රිෂාන් අයිය එන්නෙ නැතිවෙයි ද? "
සුබා පැවසුවේ දුකින් වගේය.
"කියන්න බෑ බන් උඹට වැඩනම් ඌ එන්නෙ නෑ. සමහර විට අම්ම කිව්ව නිසා ඒවි. "
"එතකොට අර චූටි මල්ලි හසරැල්. "
හිරූ අහද්දි .
"අනේ මන්ද බන් ඔය චූටි බච්චෝ අරන් ගිහින් උන්ව නළවන්න වෙන්නෙ අපට. "
සුබා කිව්වේ පිංකි දෙස බලාගෙනය.
"හිරූ මේක හරියන්නෙ නෑ මේකිට අරූ එක්ක ඕන මගුලක් කර ගන්න කියල අපි රිසර්ච් එකට යමු මේකිට ලව් සික් ගහලනෙ. "
"අනේ පිංකියෝ."
මොවුන්ගේ මේ කතා බහ යන අතරෙයි නිවසට වාහනයක් එන සද්දය ඇසුන නිසා තිදෙනාම ගේට්ටුව දෙස බැලුවෝය .
"ඔය එන්නෙ ක්‍රිෂාන් අයියා. "
පිංකි පවසත්ම.

ඔවුන් ළඟ නතර වූ වාහනයෙන් බැස ආවේ ක්‍රිෂාන් ය .තරමක් පිරිපුන් සිරුරක් හිමි ඔහු ප්‍රියමනාප තරුණයෙකි ,ක්‍රීඩා සහ බොඩි ෆිට්නස් කරන නිසා තරමක් කැපී පෙනෙන සිරුරක් ඔහුට ඇත .

"හායි නංගිලා කොහොමද? "

ඔහු එසේ කියාගෙන ආවේ පිංකි විතරක් නොව අනිත් දෙදෙනාත් අඳුනන විලසය.

"ආ අයියේ අම්ම පණිවිඩයක් කිව්ව නේද ඔයාට ?"

"කිව්ව කිව්ව ගොන් කෙල්ලො තුන්දෙනෙක් එක්ක කැම්පින් කරන්න කියල. "

"ඉතින් ඔයාට අපි ගොන් නම් අපි වෙන කෙනෙක් හොයා ගන්නම්. "

"ඉට්ස් ඕකේ පිංකි කෙල්ලො තුන්දෙනෙක් එක්ක කැළේ මදුරුවො තලනවට වඩා වැදගත් වැඩ මට තියනව. "

"මෝඩය. "

"කෝ නැන්දි ඇතුලෙ ඉන්නවද?"

"ඉන්නව ගිහින් බලා ගන්නව මෝඩය. "

පිංකි කිව්වෙ තරහින් ය.

"මම උබල දෙන්නට කිව්වෙ ඕක හෙන අහංකාරයි කියල. "

"ඒත් බන් උඹ හැන්ඩි නෙ. "

එසේ කීවේ සුබාය.

"මමනම් හිතන්නෙ සහන් ට ඔයිටවඩා මේන්වේන් කරණ බොඩි එකක් තියනව. සහන් ඔයිට වඩා හැන්ඩි. "

ඒ හිරූය.

"වෙන්න ඇති බොඩිය කන්නද බන්. ක්‍රිෂාන් අයිය ලියන එව්ව ලස්සනයි. අනිත් එක එයා කලාවට හුගක් කැමති කෙනෙක්. එයා ශූට් කරණ ෆොටෝස් උනත් මාර ගති. සහන්ලට කලාව ගැන දැනීමක් නෑ. අනික බොඩිය පිම්බුව කියලම කෙල්ලො කැමති වෙන්නෙ නෑ. "

සුබා කිව්වෙ ටිකක්බැරෑරුම් ලෙසය .

"හරි හරි අන්න අම්ම කතා කරණව යමු ඇතුලට."

තිදෙනා ඇතුලට යන විට ක්‍රිෂානුත් පිංකිගේ අම්මාත් ඔවුන් තිදෙනා එන තෙක් තේ මේසයට වී බලා සිටියෝය.

"දුවලට ගමන හෙට යන්න වෙන්නෙ නෑ. "

පිංකිගේ අම්මා පැවසුවේ තිදෙනා දෙස බලමිනි .

"ඇයි අම්මා. "

"නෑ අයියට එන්න පුලුවන් අනිද්දට, අනික ඔයාලට සූදානම් වෙන්න කාලෙකුත් ඕනනේ. හෙට නිවාඩුව ඒ වැඩ ටික කරගෙන අනිද්ද උදේ ම අයිය එයි ඔයාලට යන්න පුලුවන් ."

"ඇත්තෙන්ම නැන්දා මල්ලිවත් එක්කන් එන්නම් මම. "

"ඒක හොඳයි පුතා මල්ලිට ක්ලාසුත් පාඩුවෙයිද? "
"ක්ලාස් පාඩු වෙන්න ක්ලාස් යන්න ඕනනේ. කොල්ලො එක්ක සොෆ්ට් බෝල් ගහනවට වඩා මේක වෙනස් අත්දැකීමක් වෙයි එයාට. "
ටික වෙලාවකින් ක්‍රිෂාන් පිට උනේ අනිද්දා උදේම එන බලාපොරොත්තුවෙනි .
රාත්‍රී කෑම හත පමණ වනවිට ගත් යලුවන් තිදෙනා කාමරයට වැදුනේ පුස්කොල පොත් දෙක කියවීම සඳහාය . ලොකුවට තිබුන පොත ප්‍රමාණයෙන් ලොකු උනාට තල්පත් දහයකට වඩා නොතිබුනි. එහි තිබුනේ අර පිත්තල පීරිසිය තෙල් බෝතලය ගැනයි.
"[පිත්තල මංජුසාව ගෙන එහි පියන හැර එය දැසට සමාන්තරව යම්කිසි ස්තානයක තබාගෙන තබාගෙන කලු පැහැ බෝතලයෙන් තෙල් බිංදු කීපයක් මංජුසාව මත ඇති පහනට දමන්න. ]"
"මාරයි නෙ බන් මේක මොකක්ද? "
පිංකි ඇසුවේ තම යෙහෙළියන් දෙදෙනා දෙස බලමිනි.
"අනේ මන්ද බන් අර අඳුනද මොකක්ද කියන එක ද මේ. "
"ඔව් මම හිතන්නෙ ඒත් මම අහල තියන එකට වඩා මේක වෙනස් කියවපන් බලන්න. "

ඒ හිරුය.
"[තෙල් බිංදු තුනක් පමණක් සෑහේ ඉන්පසු අවශ්‍ය කාරණය නැරබීමට බලාපොරොත්තු වන කෙනා තෙල් බිදු දෙකක් නලල දෙපැත්තේ ගා ගත යුතුය මුලින් ම පිරිසිදු වී බුදුන් වැද මෙය කිරීමට ඉදිරිපත් විය යුතුය. ]"
"මේක අදුනක් තමයි අපි මේකත් අරන් යමු මේ පොතේ වෙනනම් විශේෂ දෙයක් නෑ වගේ. "
කියූ පිංකි අනිත් පොත අතට ගත්තේ කලින් පොත වසා නියමිත පරිදි තැබීමෙන් අනතුරුවය .
"බලමු මේකෙ මොනවද තියෙන්නෙ කියල"
"[.....කඳුලු ගුහාව කරා යන මාර්ග විස්තරය ..... ]"

යහලුවන්තිදෙනා උදේ අවදිවීමට පරක්කු උනේ රෑ පුරා පුස්කොල පොත් කියවූ නිසාය .
උදේ තේ මේසෙදි ....

"පිංකියො අද ටවුමට ගිහින් අවශ්‍ය බඩු ටික ගමු නේද?"

සුබා පවසද්දී.

"ඔව් තුන්දෙනාම යමු මොනවද ගන්නෙ අපි ලිස්ට් එකක් හදා ගමු. "

හිරු නිතරම ඇගෙ සාක්කුවේ තියන පොඩි

නෝට් බුක් එකයි පෑනයි ගෙන ලියා ගන්න ලෑස්ති උනාය .

"අපි ගන්න ඕන ක්ෂණිකව හදා ගන්න පුලුවන් කෑම .

එක අපි අර ටවුමෙ කඩෙන් හොද ටෙන්ඩ් දෙකක් ගන්න ඕන.

ඊලගට නූඩ්ල්ස් පැකට් දවස් හතරකට විතර හරියන්න .

තව බිස්කටුත් ගමු.

වතුර උණුකර ගන්න භාජනයක්."

පිංකි පවසද්දී හිරු ලියා ගත්තාය .

ඉන්පසු තිදෙනාම කරුණාපාල සමග ටවුමට ගියේ බඩු රැගෙන ඒමටයි .

යන අතර කරුණාපාල.

"බේබිල ඔය කරන්න යන වැඩේට නම් මම එච්චර කැමති නෑ."

"ඇයි කරුණාපාල මාමේ? "

පිංකි අසද්දී.

Author KUSHAN HETTIARACHCHI

"ඔය කැළේ ඇතුලෙ හොල්මන් තියනව. අනික ඕකට දවල් වත් කවුරුත් යන්නෙ නෑ. අනික ළමයි බිලි ගන්න අඬන ගුහාවකුත් තියනවලු, ඕක ඇතුලෙ. "

"කව්ද මාමට ඕක කිව්වෙ? "

හිරු ඇසුවේ සිනා සී ය .

"මම පොඩි කාලෙ අපේ තාත්ත තමයි කිව්වෙ. "

"මාමා මොනවද තව දන්න විස්තර? "

"එහෙමට විස්තර දන්නෙ නෑ මම. මගේ තාත්ත පුරාවිද්‍යාඥයෙක්. එයත් ඔය කැළේ ඇතුලෙ යන්න ගිහින් තමයි අතුරුදහන් උනේ. දැනට අවුරුදු හතලිහකට කලින් මම එතකොට අවුරුදු දහයක විතර කොල්ල. අදටවත් මගෙ තාත්තගෙ තොරතුරක් නෑ.බේබිලාටත් එහෙම දෙයක් උනොත් .ඒකයි මම කිව්වෙ. "

"අපි පස් දෙනෙක් යනවනෙ මාමෙ අනික දවස් දෙක තුනකට වඩා ඉන්නෙ නෑ."

"ඒත් මගෙ හිතට හරි නෑ බේබි. "

ඔවුහු ගමනට අවශ්‍ය බඩු ටික රැගෙන ඉක්මනට ආවෝය . පැමිණ දහවල් ආහාරය ගත් මිතුරියන්

තිදෙනා හවස ගෙනයන බඩු ටික සූදානම් කරන්න වූවෝය .

"හම්මේ බන් ඔටුවෙකුත් අරන් යන්න වෙයිද? "

ඒ සුබාය.

"ඔටුවෙක් මොකටද බන්. "

"මේ බඩු ගෙනියන්න. "

සුබා කිව්වෙ පිංකි දෙස බලාගෙනය.

"උබටනම් බඩු ගෙනිහින් දෙන්න ඔටුවෙක් එනවනෙ උදේට. "

"කව්ද පිංකි ඒ ඔටුව? "

"අර ක්‍රිෂාන් කියල ඔටුවෙක් ඉන්නෙ අපේ නැන්දිගෙ පුතා. "

පිංකි කිව් කතාවට මිතුරියන් තිදෙනාටම සිනහ ගියෝය.

"ඔයාලගෙ ක්‍රිෂාන් අයිය ඔටුවෙක් ද අනේ. "

සුබා පිංකිගෙන් ඇසුවෙ කෝමළ තාලෙට ය.

"ඔටුවෙක් නෙවෙයි මම කියන්නෙ නෑ. අපිට යනකම් ලොකුකම් බල බල යන්න වෙයි. "

"අපෝ එහෙම කියන්න එපා පව්නෙ. "

සුබා කියද්දී .

"ආ ඇත්තද මෙයාගෙ අනුකම්පාව ඕනවට වැඩියි."

පිංකී ගස්සගෙන වොශ් රූම් එකට ගියාය.

උරහිස් හකුලා සුබා හිරූ දෙස බලද්දි.

"එකම මස්සිනා පොඩ්ඩනෙ දුක ඇති බන්. "

හිරූ පැවසුවේ සිනා සීය.

"මට ඒක ඇහුනා. "

පිංකි කිව්වෙ වොශ් රූම් එකේ සිටයි .

හිරුත් සුබත් මුහුණෙන් මුහුණ බැලුවේ පුදුමයෙනි.

රෑ වෙන විට සියලුදේවල් සූදානම් කළ ඔවුන් ඉක්මනින්ම කෑම ගෙන නිදා ගත්තේ හෙට දින වෙහෙසකර ගමනක් යාමට ඇති නිසාය .හෙට දින යන ගමන ගැන උද්යෝගයෙන් සිටි මිතුරියන් තිදෙනා සිහින ලෝක වල කිමිදෙමින් නින්දට ගියෝය .පසුදා උදේ හත පමණ වන විට ක්‍රිෂාන් පැමිණියේ තම කුඩා මල්ලි හසරැල් ද

Author KUSHAN HETTIARACHCHI

සමගය. අවුරුදු එකොළහක දොළහක පොඩි ළමයෙක් වූ ඔහු හිටියේ ගමන ගැන පිබිදුන උද්යෝගයෙනි .ඔහු වාහනයෙන් බැස්ස ගමන් සොයාගෙන ගියේ පිංකිවය .ඔහු කරේ දුර දක්නයකුත් එල්ලගෙන සිටියේය.

"මගෙ සුදු අක්කියෝ. "

කියමින් ඇයගේ කාමරයට දිවගිය පිංකිව ආදරයෙන් වැළඳගත්තාය. හසරැල් දැක්ක අනිත් දෙදෙනා මුහුණෙන් මුහුණ බලා ගත්තේ සිනහ සෙමිනි .

"මගෙ සුදු මල්ලි කොහොමද? ඔයා නම් බයිනෝ එකකුත් අරන් ඇවිත් නේද? "

පිංකි පෙරලා ඔහුගෙන් විමසුවේ ඔහුගේ හිසද අත ගාමිනි .

"ඔව් අක්කේ මේ කැමරාවකුත් තියනව. "

ඔහු සාක්කුවෙන් පොඩි ඩිජිටල් කැමරාවක් එළියට ගත්තේය.

"ඕ ශෝයි නේ. "

"මේ කව්ද මෙයාල. "

ඔහු පිංකිගෙන් ඇසුවේ සුබා සහ හිරු දෙස බලමිනි.

"ආ ඉන්න මම අදුන්වල දෙන්න මේ ඉන්නෙ සුබා අක්කා ,මේ ඉන්නෙ හිරූ අක්ක. "

යයි කීවේ සුබාවත් හිරූවත් පෙන්නමිනි .

"එතකොට මේ ඉන්නෙ අපේ මල්ලි බබා හසරැල්."

තිදෙනාම හසරැල් සමග එකතුව බෑග්ස් ටික ක්‍රිෂාන් ගේ වාහනයට දැම්මෝය .ඉන්පසු මවට වැන්දෝය .

"තුරුණුවන්ගෙ සරණයි පරිස්සමට ගිහින් එන්න ,ක්‍රිෂාන් පුතා නංගිල තුන්දෙනා බලා ගන්න. පරිස්සමින් ගිහින් එන්න. "

පිංකිගේ මව ඔවුන් වැඳ පිටත් වෙන විට පැවසුවාය.

මිතුරියන් තිදෙනා කැබ් එකේ පිටුපසට නැගුන අතර පුංචි හසරැල් ඉස්සරහ සීට් එකෙ වාඩි උනේය .

"නංගිල කන්න බොන්න දේවල් ගත්ත නේද ?"

ක්‍රිෂාන් පිටුපස හැරී විමසුවේ මිතුරියන්

තිදෙනාගෙන් ය .

"කන බනේ මයි ඔව් ඔව් ගත්තා ගත්තා. "

ඒ පිංකි ය.

"මේන් අයියා මේ චොකලට් එක කන්න. "

සුබා තම බෑගයේ වූ චොකලට එකක් ගෙන ක්‍රිෂාන් අතට දුන්නේය .ඔහු වාහනය ඩ්‍රයිව් කරන ගමන් ම එය අරන් හසරැල් අතට දුන්නෙ එය විවර කරන්න කියමිනි .

"දැන්මම දැල එලල වගේ."

හිරු කීවේ පිංකිට ලං වී ය.

"ඇයි දෙන්නට ජෙලස් ද? "

සුබා ඇසුවේ බොරු තරහක් මවාගෙනය.

ඔවුන් ටික වෙලාවකින් මදනායක ෆාර්ම් එකට ආවෝය. එය මදනායක වතු යායේ පිහිටා තිබේ රජවත්ත කැලය තියෙන්නෙ ඊට ටිකක් එයාහිනි .

ක්‍රිෂාන් කැබ් එක ගරාජයේ ඇතුලටම දැන්මේ.ඔවුන් දවස් හතරක් වාහනය තබා යන බව මදනායක මහතා ට දැනුම් දී තිබුන නිසාය. ක්‍රිෂාන් මදනායක මහතා සමග හිතවත් නිසා ඒ

අවසරය ලබාගෙන තිබුනි.

ඔවුන් වාහනයෙන් බසින විට එතනට සිනාසීගෙන ආවේ ෆාර්ම් එකෙ මුරකරු සිරිදාසයි.

"මහත්තයල උදෙන්ම ඇවිත් නේද? "

"ඔව් සිරිදාස ඔයා මම කිව්ව දේවල් ලෑස්ති කලාද?"

"ඔව් මහත්තය බිත්තර ටිකනෙ. "

"ඔව් සිරිදාස මේව ගෙනියන්නෙ කොහොමද? "

"මදනායක මහත්තය කිව්ව බිත්තර කේස් එකකට දාල දෙන්න කියල මහත්තයල එද්දි ඒක අපහු ගේන්නකො. "

"හා සිරිදාස මදනායක අංකල් නැද්ද අද? "

"නෑ මහත්තය නුවර ගියා අද එන්නෙ නැතිවෙයි. "

"හරි අපි යන්නම් එහෙනම් සිරිදාස, කට්ටිය පුලු පුලුවන් විදිහට බඩු ගම්මු නේද? "

ක්‍රිෂාන් කිව්වෙ කට්ටිය දෙස බලාගෙනය.

කට්ටියම ඉක්මණින් තම තමන්ගේ බඩු ටික ගත්

අතර ක්‍රිෂාන් කූඩාරම් දෙක ඔහුගේ බඩු වලට අමතරව අතට ගත්තේය පස්දෙනාම හිමින් හිමින් රජවත්ත පැත්තට ගියෝය.

"පිංකි දැන් මේ කෑම්ප් එකක් ගහන් මොනවද අපි කරන්නෙ? "

"මේක මේ රිසච් එකක් අයියේ ගියාම මම කියන්නම් කො ඔයා DSLR එක ගෙනාව නේද ?"

"ඔව් මම ගෙනාව තව මරු බඩුවක් ගෙනාව."

"ඒ මොකක් ද? "

"සෝල ෆෝන් චාජර් එකක්. "

"වාව් නියමයි නෙ අපි පවර් බෑන්ක් තුනත් ගෙනාව."

"ඒකත් හොදයි. "

"මේ ඔයා සුබෝධා නේද ?"

ක්‍රිෂාන් සුබා දෙසට හැරී ඇසුවේ ය.

"ඔව් අයියේ මම ඔයාගෙ එෆ් බී එකේ ඉන්නවනෙ. දවසක් ඔයා මාත් එක්ක චැට් කරත් එක්කනෙ."

"ඒකනෙ මම කල්පනා කරේ දැකල තියනව

KUSHAN HETTIARACHCHI

කියල."

"නයිස් ටු මීට් යූ. "

ක්‍රිෂාන් ඇයට තම සුරත පෑවාය.

"නයිස් ටු මීට් යූ ටූ අයියා. "

සුබාද ක්‍රිෂාන් ගේ සුරත අල්ලා ගනිමින් පැවසුවාය.

"ඒකත් ජයසිරි මංගලම් කිව්වලු. "

පිංකී හිරුට ලංවී පැවසුවේය.

කතාවෙන් කතාවෙන් පස් දෙනාම රජවත්ත කැළේ මායිමට ආවෝය.

(මේ ගමනේ ඡායාරූප කිහිපයක් මම ඔබට ගේනවා ඔය පලවෙනියටම තියෙන්නෙ ඇතුල් වෙන තැන පාර )




රජවත්ත කැලයට පිවිසෙන මාර්ගය.

"අම්මෝ පිංකි මේක පට්ට කැලයක් නෙ. "

ක්‍රිෂාන් කියද්දී

"ඔව් ඒකනේ රජවත්ත කැළේ කියන්නෙ. "

පිංකිගේ ඒ කතාවට සුබාත් හිරුත් හිනා උන අතර.

"මම හිතුව සහෝදරය ඉල්ලන් කයි කියල. "

හසරැල් කිව්වෙ හිනා වෙමින් ය .

"පොඩි මැන් එහෙනම් ඔයත් චීත්ත අදින පැත්තෙ

නේද?"

ක්‍රිෂාන් කිව්ව කතාවෙන් හසරැල් ගේ කට වැසුනි.

මේ අතර පිංකි මාර්ග විස්තරය තිබූ පුස්කොල පොත එලියට ගත්තාය.

"ක්‍රිෂාන් අයියේ මේ පොතේ තියන විදිහට ඔය ගල්තලාව උඩින් යන්න ඕනේ "




ගල්තලාව.

"වාව් පුස්කොල පොතක් කෙල්ලනේ අපි නිධානයක් හාරන්නද යන්නෙ. "

ක්‍රිෂාන් පිංකී දෙසට ආවේ එසේ අසමිනි.

"නෑ නෑ අයියෝ මේ ළමයනම් අපි මේ සීයගෙ පොතක තියන විස්තර අනුව කඳුළු ගුහාව ළගට යන්නෙ."

"කඳුලු ගුහාව ඒ මොකක්ද අප්පා. "

"යන්කො යන්කො මම කියන්නම්. "

ඔවුන් ගල් තලාව මතින් ගොස් වංකගිරියක කැරකී ගල මතට ගියෝය .




ගල්වලින් වට වූ වංකගිරිය.

"වාව් පිංකියෝ අර බලන්නකො ලස්සන." ඒ හිරු ය.ඇය පෙන්නුවේ ඈතින් පේන පොල් ගස් ටිකයි ඇත්තටම ඒක ලස්සන දසුනකි.

sinhalaebooks.com

ඒ දසුන දෙස වශී වී බලා සිටි ක්‍රිෂාන් පියවි සිහියට ආවේ .

සුබා ගේ කට හඬිනි.

"ක්‍රිෂාන් අයියා ගන්නකො ෆොටෝ එකක් ලස්සන සීනරි එකක් නෙ. "

සුබා ක්‍රිෂාන් ලඟට ගියා ය.

"ඕකේ නංගි බබා පොඩ්ඩක් මේ බෑග් එක ගන්නකෝ. "

ක්‍රිෂාන් තම බෑගය සුබාට දී ඒ ලස්සන දසුන තම කැමරාවට හසුකර ගත්තේය.




ඈත පොල්ගස් පෙනුණු ඒ සොඳුරු දසුන.

මේ වනවිට ඔවුන් කැලය මැදට බොහෝ දුරක් පැමිණ තිබුනි.

"අපි මේ ලඟ ටෙන්ඩ් දෙක ගහ ගමු නේද? දවල්ට මොනව හරි කන්නත් ඕන දැන් එකත් පහුවෙලා."

"ක්‍රිෂාන් අයියේ අර ඉස්සරහ තැනිතලාවෙ හදමු නේද? "

හිරු පැවසුවේ ඉස්සරහ තිබූ තුරු වදුල ලඟ තැනිතලාව පෙන්නමිනි.

"හරි අපි මෙහෙම කරමු. "

ක්‍රිෂාන් පවසද්දී.

"ඔව් කොහොමද? "

පිංකි ඇසුවාය.

"මමයි සුබයි මල්ලියි ටෙන්ඩ් දෙක ගහනකම් ඔයයි හිරුයි අපට කෑමට මොනව හරි හදන්න, වතුර ගන්න අර පල්ලෙහා පේන පොකුනෙන් හරි නේද? "

පිංකියි හිරුයි කෑම සෑදීමට සූදානම් වූ අතර අනිත් තිදෙනා කූඩාරම් ගැසුවෝය

ඔවුන් පැයකින් පමන කූඩාරම් දෙක සකස් කර

ඉවර කලෝය ඒ වන විට පිංකිත් හිරුත් රසම රස කෑම වේලක් සූදානම් කොට තිබුනාය




ඔවුන් ගැසූ කූඩාරම් දෙක.

පස් දෙනාම කූඩාරම් ලඟ ගස් අතර සෙවනේ ඔවුන් ගෙන ආ කාපට් එක එලා කෑමට සූදානම් වූ අතර පිංකිත් හසරැලුත් පල්ලෙහා පොකුණෙන් තව වතුර බාස්කට් එකක් රැගෙන ආවෝය .




ඔවුන් වතුර ගත් පොකුණ.

පස් දෙනාම වටේට ඉඳගෙන නූඩ්ල්ස් සහ තම්බපු බිත්තර කෑවෝය .

කෑම කා තේ බොන අතරේ ක්‍රිෂාන්,

"ඔයාල දන්න විස්තර කියන්නකො කඳුළු ගුහාව ගැන. "

පිංකි දෙස බලා පැවසුවේය .

"අපිත් ලොකු විස්තරයක් දන්නෙ නෑ මේ පුස්කොල පොතේ තමයි තියෙන්නෙ. "

"එහෙමද අපි මේ පුස්කොල පොතේ විස්තර වලින් මැප් එකක් හදා ගමු ඒක ලේසියි නංගි. "

යි කියමින් තමන්ගේ ෆෝන් එක එලියට ගත් ක්‍රිෂාන් GPS ඔන් කර ඔවුන් ඉන්න මේ රජවත්ත කැලේ මැප් එක ගත්තේය .ඉන් පසු ඔහු පුස්කොල පොත පෙරලන්නවිය.

"මල්ලි මගෙ බෑග් එකෙ ලොකු සී ආර් පොතක් ඇති ගන්න. "

හසරැල් බෑග් එක ඇර සී ආර් පොතක් ගෙන ආවේය.

ක්‍රිෂාන් එම පොත බිම දිග හැරගෙන GPS මැප් එකේ පෙන්වන විදිහට කටුවට සිතියම ඇඳගත්තේය .ඉන්පසු පුස්කොල පොත කියවමින් ඒ තැන් සිතියමේ ලකුනු කලේය .යෙහෙළියන් තිදෙනා මොහු කරණ වැඩය ගැන උනන්දුවෙන් බලා සිටියේ ඔවුන් එහෙම දෙයක් ගැන සිතා නොතිබුනු නිසාය .

"දැන් හරි සුබා ඔයාට පුලුවන් ද මේ මැප් එකේ තව පිටපත් හතරක් අදින්න. "

"ඒ මොකටද අයියේ? "

"අපි යන්නෙ කැලය ඇතුලෙ අපි අතරමං උනොත් කොහෙට ගියත් අපි පස් දෙනා අතේම මැප්ස් තියනවනම් ලේසියි නෙ එක තැනකට එකතු වෙන්න, බබාල කැම්පින් ගැන මුකුත් ම දන්නෙ නෑනේ. "

ඔහු කිව්වෙ සිනාසෙමින් ඔහු නිතැතින්ම කන්ඩායමේ නායකයා වී සිටියේය.

ඉන්පසු ඔහු තම ගමන් බෑගය විවර කොට කොම්පාස් හතරක් ගෙන යෙහෙළියන් තිදෙනාට එක බැගින් දී හසරැල් අතට ඉතිරි එක දුන්නෙය .

"වාව් අයියා ඔයා අපටත් වඩා මේ ගමනට සූදානම් වෙලා වගේ ."

එසේ පැවසුවේ සුබාය.

එයට සිනාවකින් පිළිතුරු දුන් ක්‍රිෂාන් .

"මේ කියන කඳුළු ගුහාව වැඩි ඈතක නෙවෙයි මේ

කඳුළු සාරකාමි
Author KUSHAN HETTIARACHCHI

පේන හැටියට තියෙන්නෙ අපි හෙට උදේම වැඩේට බහිමු දැන් අද අපි ටිකක් විවේකීව ඉමු. දැන් දවල් උන හින්ද අපිට ඕක හොයන්න ගියොත් රෑ වෙනව. "

"ඒක ඇත්ත අයියෙ. "

ඒ හිරු ය.

ඔහු දිගටම කතා කරන්න විය.

"ඔය පුස්කොළ පොතේ තියන නිල් දිය පොකුණ අර පල්ලෙහා අපි වතුර ගත්ත පොකුණ වෙන්නත් බැරි නෑ ඒ පොකුනෙ වතුර අසාමාන්‍ය නිලක් තියනව නේද ?"

"ඒත් අයියා මේ කියන විදිහට මේක වෙන්න බැහැ නේද? මොකද මේ කියන තරම් විශාල නෑනේ අනික ඒ පොකුණ එක්කමනෙ ගුහාවෙ දොර තියනව කියන්නෙ. "

පිංකි කිව්වෙ කල්පනා කරය .

"ඔව් නංගි හැබැයි ඔය ගුහාව ලඟ තියනවනම් ඔය ගෑනු ළමය අඬන සද්දේ රෑට ඇහෙන්න ඕනේ. "

"ඔව් අයියේ අනිවාර්යයෙන් අපි බලමු. "

"අනේ මට බයයි. "

ඒ හිරූ ය.

"බයවෙන්න එපා අපි ඉන්නකම් නේද මල්ලි. "

ක්‍රිෂාන් හසරැල්ගේ පිටට තට්ටුවක් දැම්මේය.

"ඔව් ඒත් අයියේ මමත් නම් ටිකක් බයයි. "

කට්ටියම අවට ටිකක් ඇවිදිමින් සිට සවස පොකුණෙන් නා ගත්තෝය. ඉස්සල්ලාම පොකුණට බැස්සේ ක්‍රිෂාන් ය ඔහු පොකුණට බැස්සේ ඉතාමත්ම පරිස්සමිනි. මන්ද මේ පොකුණේ මොන අත්භූත දේවල් සැඟවී ඇතැයි කාට නම් කිව හැකි ද?. ඔහුට පෙනුනේ පොකුණ ඇතුලෙන් ගල් බැම්මක් සහ ගල් පඩි තියෙන

බවය. ජේන විදිහට නම් ගැඹුරු විය යුතු ය. මේ වතුරේ අසාමාන්‍ය නිල පෙනෙනුයේ ඒ නිසා විය හැකි ය.

"කට්ටියම නාගමු හැබැයි කවුරුත් ඇතුළට බහින්න එපා මට ෂුවර් නෑ මේක ගැඹුරු වගේ හුඟක්. "

ක්‍රිෂාන් කීවේ ගැහැණු ළමයින් දෙස බලාගෙනය.

"ඇයි අයියේ ඇයි එහෙම කියන්නේ. "හිරු අසද්දී

"නෑ නංගි මෙතන ගල් පඩිපෙළක් වගේ තියෙන්නේ හොඳටම දිය සෙවල ,මෙතන පීනන්න පුළුවන් කවුද ඉන්නේ? "

"මට පුළුවන් අයියා කිමිදෙන්න උනත්. " සුබා ඉදිරියට ඇවිත් පැවසුවාය. සුබා පාසලේ පිහුණුම් කණ්ඩායමේ සහතික පදක්කම්දිනූ පිහිණුම් ශූරියකි .

"ඔය ඉන්නේ මට මැච් වශූරියකි. ක්‍රිෂාන් කිව්වේ

සිනාසී ය. "

"මටත් කිම්දෙන්න පුළුවන් එහෙනම් හෙට කිම්දිලා බලමු නේද නංගි."

"ඕකේ අයියා අද රෑ උනානේ. "

ඔවුන් පස් දෙනාම උඩ පඩිය මතට වී නා ගත්තෝය.

"අපි ගොඩාක් රෑ වෙනකන් ඇහැරලා ඉන්න ඕන නෑ .අපි නිදාගන්න ඕන ඒක වෙන්නේ මෙහෙමයි."

ක්‍රිෂාන් තමන්ගේ තීරනය ඉදිරිපත් කරන්න විය.

"මමයි සුබයි රෑ දොළහ වෙනකම්, ඔය තුන්දෙනා නිදියන කම් නිදි මරාගෙන මුර කරනව .දොළහට ඔය තුන්දෙනා ඇහැරිලා උදේ හය වෙනකන් අපි දෙන්නා ඇහැරෙනකම් මුර කරන්න ඕන එහෙම හොඳයි නේද ?"

"දැන් එතකොට ඔයා හැමවෙලේම සුබා එක්ක වැඩ කරන්නේ ඇයි."

පිංකි ඇසුවේ  සමච්චල් සිනාවක් මුහුණට අරගෙන.

සුභාට  මම කැමති හින්දා පිංකි අනික අපි දෙන්නා ෆේස් බුක් යාලුවෝ මගේ තේරීම ගැන සුභාට ප්‍රශ්නයක් තියෙනවා ද ක්‍රිෂාන්  සුබා දෙස හැරී ඇසුවේය.

නෑ අයියා නැහැ මමත් ඔයා එක්ක වැඩ කරන්න කැමැතියි.

" ඕක තමා කියන්නෙ ඉබ්බා දියේ දාද්දී ඇන්නෑවේ කිව්වා කියලා."

පිංකි රහසින් හිරුට කිව්වාය. ඔවුන් පස් දෙනා හවස හය හමාර වන විට රාත්‍රි ආහාරය ගැනීමට සූදානම් වුණේය ක්‍රිෂාන් තම මල්ලී හසරැල් සමග එකතුව දර සහ කොටන් රැගෙන විත් විශාල ගිනි මැලයක් ගැසුවේය. ටික වේලාවක්  කතා බහ කරමින් පස්දෙනා අතරින් හසරැල් හිරු සහ පිංකි නිදා ගැනීමට සූදානම් විය. සුබා සහ ක්‍රිෂාන් කතා

කරමින් අවට පරිසරය ගැන විමසිලිමත් ව සිටියෝ ය.

"අයියා කෝපි එකක්වත් බොමුද? නිදිමත යන්නත් එක්ක. "

සුබා ඇසුවේ ක්‍රිෂාන් ට ලංවීය.

"ඔයාට හදන්න පුළුවන්ද නංගි. "

"හදන්න දෙයක් නෑ අයියේ අපි වතුර උණු කරපු වෙලාවේ ෆ්ලාස්ක් එකට දැම්මා. "

"එහෙනම් බොමු. "

සුබා කෝප්ප දෙකකට කෝපි වත් කර එකක් ක්‍රිෂාන් අතට දී එකක් තමන් අතට ගෙන ඔහු ළඟින්ම කාපට් එකේ වාඩි වුණාය.

"අයියා මෙතනට අහස ලස්සනට පේනව නේද?"

"ඔව් නංගි මමත් ඒක තමයි බැලුවේ."

"මම අය්යගෙන් දෙයක් අහන්න ද?"

"අහන්න බලන්න. "

"එයාට ගර්ල් ෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවද?"

"බැරෑරුම් ප්‍රශ්නයක්."

"ඒ කියන්නේ ඉන්නවා කියන්න බෑ එහෙම නේද?"

"ඒක කියන්න පුළුවන් එක දිග කතාවක්. "

"ඉතින් ඒ දිග කතාව කෙටි කරල කියන්න."

සුබා පැවසුවේ හුරතල් හඬකිනි.

"මම ආදරේ කරපු කෙනා දැන් මට අයිති නැහැ එයා වෙන කෙනෙක් මැරි කලේ මම ඒ මතකයත් එක්ක තාමත් ජීවත් වෙනව."

"ඉතින් ඔයාට පුලුවන්නෙ වෙන කෙනෙක් ගැන හිතන්න."

සුබා පැවසුවේ ක්‍රිෂාන් දී මුහුණට එබී ගනය.

"මට එහෙම හිතෙන්නේ නෑ නංගී."

එවිටම වගේ ගැහැනු ළමයෙක් ඉකිගසා අඬනවා වැනි ශබ්දයක් ඇසී නෑසී ගියේය.

වෙලාව රාත්‍රී දොලහට කිට්ටු වී ඇති බව තම අත් ඔරලෝසුව බැලූ ක්‍රිෂාන් ට වැටහී ගියේ ය.

දෙදෙනා ම මුහුණින් මුහුණ බැලූහ.

"අයියේ ඒ අර සද්දේ නේද?"

"ශ්..ශ් නංගි හොඳට අහන් ඉන්න ඒ සද්දෙ එන්නෙ කොයි පැත්තෙන්ද කියලා. "

"හිතා ගන්න බෑ මොන පැත්තෙන්ද කියල අයියේ අපි අනිත් තුන් දෙනාට කතා කරමුද?"

"කතා කරන්න කෝ ඔයා මම මල්ලිව ඇහැරවා ගන්නම්."

සුබා කූඩාරම තුළ නිදා සිටි පිංකි සහ හිරු ව ඇහැරෙව්ව අතර ක්‍රිෂාන් තම මල්ලිව ඇහැරවූයේය .

එවිටම වාගේ යළිත් අර ශබ්දය ඇසී නැසී ගියේය.

ශබ්දය ආ  දිශාව තීරණය කරගත නොහැකි වූයේ  පස් දෙනාට ශබ්දය ඇසී තිබුණේ පස් පැත්තකිනි.

"අපි ඕක උදේට හොයා ගමු "ක්‍රිෂාන්  කිවූ අතර.

"අපි දැන් ඉතින් නිදා ගමු නේද සුබා. "

"ඔව් අයියා මටත් නිදිමතයි. "

සුබා සහ  ක්‍රිෂාන්  කූඩාරම් දෙක ට වැදී නිදා ගත්තෝය.

උදෑසන ම පොකුණට ගොස් මුහුණ සෝදා ගෙන උදේ ආහාරය ගත් යහළුවන් පස් දෙනා පොකුණ අවට හොඳින් පරීක්ෂා කරන්න විය. පොකුණේ එක තැනක් පෙන්වූ පිංකි.

ක්‍රිෂාන්  දෙසට හැරී

"අයියා මේක නිකන් බහින තොටුපොළක් වගේ."

"හෝව් හෝව් නංගි ලංවෙන්න එපා. "

"ඇයි අයියා. "

"නංගි මේ තැන ගැන අපි දන්නෙ නෑ ඉතින් ටිකක් පරිස්සන් වෙන්න ඕනේ පුස්කොල පොතේවත් මේ පොකුණ නෑ, එක්කො තියනව අපිට හොයා ගන්න බැහැ. මුලින්ම අපි ලොකු ලීයක් හොයාගෙන මේකෙ ගැඹුර ගැන අවබෝධයක් ගන්න ඕනේ. "

"අයියේ දිග ලීයක් නම් තියනව කූඩාරම ගාව මන් ගේන්නද? "

ඒ හසරැල් ය.

"හරි මල්ලි ඔයා ගිහින් ගේන්නකො. "

"අයියා හිතන්නෙ කොච්චර ගැඹුරු ඇතිද මේක. "

හිරු ඇසුවේ පොකුණ දෙස බලමින් ය.

"මේකයි නංගි ඔයාල තුන්දෙනාම අහගන්න මට

සඳුනි තාරකාවී
Author KUSHAN HETTIARACHCHI

හිතෙනව මේ පොකුණ තමයි අපි හොයන තැන. මේ පොකුණ කියන්නෙ එක්තරා විදිහක දොරක් වෙන්න පුලුවන්. "

"ඔයා කොහොමද මෙච්චර දේවල් කියන්නෙ අයියේ? "

පිංකි අසද්දී...

"මම ඔයාගෙ පොත් දෙකම කියෙව්ව ඊයෙ. "

"කොයි වෙලාවෙද? මම ඔයා එක්කමනෙ හිටියෙ අයියේ. "

සුබා කියද්දි..

"ඔයා කෝපි එක බොනකොට ටිකක් මහන්සියි කියල මගෙ උරහිසට හේත්තු උනා නේද?"

"ඔව් "සුබා යෙහෙළියන් දෙදෙනා දෙස බැලුවේ ලැජ්ජාවෙනි .

"ඔයා පැයකටත් වඩා නිදා ගත්ත මට හේත්තු

වෙලා. අනිත් එක මම ඔයාලට කිව්වෙ නෑ අර ගෑනු ළමයා ඇඬුවෙ මේ පොකුණේ වතුර උඩ පා වෙවී මම ඒක හොඳටම දැක්ක. "

"මොනවා තිදෙනාම ක්‍රිෂාන් දෙස බැලුවේ විශ්මයෙනි. "

"ඒ කියන්නෙ එයා කවුද ?"

තුන්දෙනාම මුහුණෙන් මුහුණ බලා ගත්තෝය හිරූ නම් බියෙන් ඇකිලී ගොසිනි.

"කවුරු උනත් ඒ මනුෂ්‍යයෙක් නම් නෙවෙයි. "

ක්‍රිෂාන් කිව්වෙ මුහුණ බරැරුම් කරගෙනය.

"එතකොට අයියේ ගුහාව කෝ ඒක මෙතන නෑනේ."

පිංකි එසේ පවසද්දි හසරැල් බොහොම අමාරුවෙන් දිග ලීය අරගෙන එතෙන්ට ආවේය .

"ඔයාල ටික පණ්ඩිතයෝ වගේ කතා කර කර

Author KUSHAN HETTIARACHCHI

ඉන්න. "

හසරැල් කිව්වේ ලීය ක්‍රිෂාන් අතට දෙමිනි.

"ඉතින් මල්ලි ඔයා නෙ මෙතන පොඩි එක්කෙනා."

පිංකි කීවේ හසරැල් ගේ ඔලුව අත ගාමිනි.

මේ අතර ක්‍රිෂාන් ලීය ගෙන පොකුන තුලට හිමීට බැස්සුවේය අඩි අටක් පමණ දිග ලීය අවසන් වන තුරු ඇතුල් කලත් පතුල අසුවුන බවක් නොපෙනුනි.

ඉන්පසු ඔහු බිම දන ගහගෙන තම අතද වතුරට දමමින් පහත් උනේය .ලීය තවත් යටටම යයි.

ක්‍රිෂාන් ලීය අතහැර නැගිට්ටේ බලාපොරොත්තු සුන්වූ ලෙසයි.

"මේක මාර ගැඹුරක් තියෙන්නෙ පතුල ගැන අවබෝධයක් නැතුව කිමිදෙන්නත් බැහැ. ඒක අවදානමක් කිමිදෙනව කිව්වට අපි ලඟ උපකරණ නෑ උපරිම යට ඉන්න පුලුවන් ෆයු මිනිට්ස් විතරයි"

ඔහු කීවේ සුභා දෙස බලාගෙනය .

"ඔව් අයියා මට නම් ත්‍රී මිනිට්ස් විතර තමයි. "

"ඉන්න බලන්න පිංකි කිව්ව බහින පඩිය වගේ තැන. "

පස්දෙනාම පඩිය වගේ තැනට ලං විය.

"මෙතනින් ඇතුලට බහින්න හදල තියෙන්නෙ."

කියූ ක්‍රිෂාන් තම සපත්තු දෙක ගලවා බසින්න ලෑස්ති විය.

"අයියා පරිස්සමින් දිය සෙවල ලිස්සයි. "

සුබා කියනවත් සමගම ක්‍රිෂාන් ගේ පය ලිස්සා ලිද තුලට වැටුනි. ඔහු වැටුනේ ඉදගෙන සිටිනා ඉරියව්වෙනි .කෙල්ලො තුන්දෙනා මහ හඬින් කෑ ගැසුවෝය. පුංචි හසරැල් කටත් ඇරගෙන බලා සිටියේ බිය වී ය.ක්‍රිෂාන් ගානක් වත් නැතුව පඩිය උඩ සිනාසෙමින් සිටියේය .

sinhalaebooks.com

"මෙතන ඇතුලට බහින්න පඩි පෙළක් තියනව පිංකි ඔය මගේ බෑග් එකේ ලොකු රෙදි කඹයක් ඇති ගන්නකො. "

පිංකී ක්‍රිෂාන් ගෙ බෑග් එකෙන් කඹය ගත්තාය .

"ඔයාල හතර දෙනාම කඹේ අල්ල ගන්න. මම මේක ඉනේ බැඳගෙන පොකුණට බහිනව. මම යටට ගිහින් විනාඩි තුනෙන් ආපසු ආවෙ නැත්තම් කඹේ ගොඩට අදින්න තේරුනාද. "

"හරි ඒත් පරිස්සමින් අයියා. "

හිරුත් පිංකිත් සුබාත් පැවසුවේ එක විටම වාගේය. සුබා තම අත් ඔරලෝසුව බලා වෙලාව මතක තබා ගත්තාය.ක්‍රිෂාන් පඩියෙන් පඩිය යටට බැස්සේය. ඇතුල නිල්ම නිල්පාටයි ඔහු තම සාක්කුවේ තිබූ වතුර යටදී පාවිච්චි කරණ ටෝච් එක ගෙන දැල්වූයේ ය.

ශා ඔය පේන්නෙ ලස්සනට මේක තමයි එහෙනම් තැන පොකුනේ බිත්ති මත විවිද චිත්‍ර වගේ දේවල්

ඇත.ක්‍රිෂාන් පුස්කොල පොතේ තිබූ විස්තර මතක් කරන්න විය .හරි ජල අගුල ඒක තියෙන්න ඕනේ පඩි හතක් බැස්සාම.ඒ කියන්නෙ ඊලඟ පඩියෙ හරි. ඔහු තම අත් ඔරලෝසුවට විදුලි පන්දම ගසා වේලාව බැලුවේය .තව විනාඩි දෙකක්ම තියනව. ඔහු පොතේ තිබ්බ විදිහට දකුණට හැරුනි මේ තියෙන්නෙ තැන. ඒත් කෝ අර කිව්ව විදිහෙ අගුලක් ක්‍රිෂාන් එතන තිබූ දිය සෙවල අතින් සූරා දැමුවේ ය .එවිටම ඔහු නෙත් කොනින් දුටුවේ පල්ලෙහා සිට කවුරුන් හෝ උඩට එන බවකි. ඔහු එදෙස බලද්දී ඒ රූපය තුරුදහන් විය .

"සුගන්දිකා මම ඔයාව හොයා ගන්නව පුස්කොල පොතේ රහස දන්නෙ මම විතරයි. " ක්‍රිෂාන් තමාටම පවසා ගත්තේ පුස්කොල පොතේ කාටවත් කියවන්න බැරුව තිබූ කොටස තමා ඊයේ කියවූ බැවිනි. ඒ කොටස පාලි ස්ලෝකයක් වගේ තිබුනත් එය හරි අතට කියෙව්වොත් වැඩක්

නැති අපභ්‍රංසයකි. ක්‍රිෂාන් එය දකුනේ සිට වමට කියවද්දී සුගන්දිකා සහ මේ අගුල ගැන විස්තරය ඔහුට අවබෝද විය. සුගන්දිකා යනු අවුරුදු දහස් ගනනකට පෙර සිටි අතීත රජ කුමරියකි. ඇයගේ ජන්මයේ දී තිබු දෝෂයක් නිසා රජුටත් රටටත් ශාපයක් වන බව අනාවැකි කරුවන් පවසා ඇත.එයින් මිදීමට නම් ඇයව අවුරුදු විසි එක පිරෙන දා පොලව යට පිහිටි මේ ගුහාවේ සදා කල් ඇයව සිර කල යුතුය.අවුරුදු හාර දහසකට පමණ පසු මෙම ස්ථානයට එන පිරිසක් විසින් ඇයගේ ආත්මය නිදහස් කරනු ඇත.ඒ පිරිස මේ පස් දෙනා බව ක්‍රිෂාන් දැනගත්තේ ඔවුන්ගේ නාම මාත්‍ර ඒ පොතේම තිබූ බැවිනි. "ක්‍රිශ්නා ,හසරැල් ,මීනාක්ශි ,බෝධී ,රවිනි " ක්‍රිෂාන්,හසරැල් , නිමේෂා ,සුබෝදා ,හිරුණි ..

එකපාරටම උඩ සිටි අය කඹය අදිනු තේරුනු ක්‍රිෂාන් පඩිපෙළ දිගේ උඩට නගින්න විය .

උඩ ට ආපසු මද වේලාවක් ක්‍රිෂාන් ට කතා කර

ගැනීමට නොහැකි වූයේ වතුර යටදී හුස්ම තද කරගෙන සිටි නිසාය. ඔහු එතනම බිම වාඩි විය.

"අයියා ඔයා ට ගොඩක් අමාරු ද?"

ක්‍රිෂාන් ලඟින් ඉඳ ගත්ත සුභා ඔහු ගේ හිස පිරි මදිමින් ඇසුවාය.ක්‍රිෂාන් ඔළුව දෙපැත්තට සැලුවේ නැහැ කියන්නට මෙනි.මද වේලාවකින් හිස එසවූ ක්‍රිෂාන්.

"මේක තමයි පාර ඔයාලා කාටත් අහු උන නැති දෙයක් මට ඊයෙ රෑ අහු උනා. "

"ඒ මොකක් ද?"

පිංකි ඇසුවේ විශ්මයට පත් දෑසිනි.

"ඔයාලට මතකද අර පුස්කොළ පොතේ තිබ්බා අපභ්‍රංශ අකුරින් මන්තරයක් වගේ එකක්. "

"ඔව්. "

ගැහැණු ළමුන් තිදෙනා තිදෙනා ම එකවර

පැවසූහ.

"ඒක කියවන්න තියෙන්නේ දකුණු පැත්තේ ඉඳලා වමට මම ඊයෙ රෑ ඒක කියෙව්වා."

"මොනවා?"

"කඳුළු තාරකාවී කියලා කියන්නේ වෙන කවුරුත් නෙමෙයි ඈත අතීතයේ හිටපු රජ කුමරියක්, මොකක් හරි උපදිනකොට තිබ්බ්ච් ශාපය හින්දා එයා අවුරුදු විසි එක පිරෙද්දි මේ ගුහාවෙ හිර කරලා තිබිලා තියෙන්නේ. එයා කාලයක් එක්ක මේ ගුහාව තුළ මැරිලා එයාගේ මිනිය මේක ඇතුළෙ තියෙනවා. ඒ වගේම මේ වතුර තියෙන්නෙත් අගුලත් විදිහට යට ඒ ගුහා දොර වැහෙන්න."

"එතකොට ඒ ගුහාවට වාතාශ්‍රය."

"එය ඇසුවේ සුබායි. "

"පඩි හතක් ගියාම අගුලක් තියනවා අරින්ඩ, ඒක

ඇරියට පස්සෙ පිළිවෙළින් වතුර ටික බහිනවා. ඊට පස්සේ අපිට යන්න පුළුවන් ඒ ගුහාව ඇතුළට. "

"වාව් අයියා ඔයා මේවා කොහොමද හොයා ගත්තේ."

හිරූ ඇසුවේ පුදුම වී ය .ඇයගේ බියසුලු ගතිය කුතුහලය නිසාම පහව ගොසින් සේ ය .

"ඒ මන්තරේ වගේ එකේ මේ හැමදේම තියෙන්නේ අනිත් එක අපි පස් දෙනා ගැන ඒ පොතේ තියනව."

"මොනව. "

සියලු දෙනා පුදුමයෙන් ඔහු දෙස බැලීය.

""ක්‍රිශ්නා, හසරැල් ,මීනාක්ශි ,බෝධි ,රවිනි " ඒ තමයි ඒ නම් ,ඒ විතරක් නෙමෙයි සුගන්ධිකා ගේ ආත්මයක් මේ මේ ළිඳ ඇතුලේ තියෙනවා. "

"සුගන්ධිකා ඒ කවුද?"

පිංකි අසද්දී..

"සුගන්ධිකා කියන්නේ ඒ රජ කුමරිය, එයාගෙ ආත්මෙ මං ඇස් දෙකෙන්ම දැක්කා. මම ඒ පැත්ත බලද්දි එයා අතුරුදහන් වුනා."

කෙල්ලන් තුන්දෙනත් හසරැලුත් ක්‍රිෂාන් දෙස බලා සිටියේ බියට පත් දෑසිනි.

"මම ආයෙත් යටට ගිහිල්ලා ඒ අගුල අරින්න ඕන, ඒක දිය සෙවල වලින් වැහිල තියෙන්නෙ මට දෙන්න මගේ බෑග් එකේ ඇති පොඩි ෆ්ලැට් නියනක්. "

යයි හසරැල් ට පැවසූ ක්‍රිෂාන්.

"සුභා මොනව  හරි අපි රස්නෙට බොමුද ?"

"ඉන්න අයියා මං අරන් එන්නම්."

මේ අතර හසරැල් ෆ්ලැට් නියන ගෙනවිත් ක්‍රිෂාන් අතින් තැබුවේය .

KUSHAN HETTIARACHCHI Author

සුබා ගෙනා කෝපි කෝප්පය බිව් ක්‍රිෂාන්.

"හරි මම ආයේ යනවා."

කියමින් නැගිට්ටේ ඉස්කුරුප්පු නියන ඉනේ ගහගන්නා ගමන්ය.

"මාත් එන්නද අයියේ සුබා ඇසුවේ අනිත් තිදෙනා දෙස බලා ය ".

"නෑ නෑ අයියා විතරක් ගියාම ඇති. "

පිංකි කිව්වේ සුබා දෙස රවා බලා ය .

"මම කිමිදෙන්න දන්න නිසා අයියට උදව් කරන්න පුළුවන් වතුර යටදී. "

සුබා පවසද්දී .

“උදව් ම කරයි මේන් කියල.”

ඒ කට ඇද කල හිරූ ය.

"මං දන්නෑ ඕන් එකක් කර ගන්න එකයි ඇත්තේ."

"පිංකී ගස්සා අහක බලා ගත්තාය. "

සුබා දෙස බැලූ ක්‍රිෂාන්.

"ඔයා කැමතිනම් එන්න නංගි ඔයාගේ ස්විමින් කිට් එක ගෙනාවද ඔයා."

"ඔව් අයියේ මම එක ගෙනාවා. "

"එහෙනම් ඒකට චේන්ජ් වෙලා එන්න. "

සුබා එතනින් ගියේ පිංකිට දිව දික් කර කට ඇද කර ය .

"මම උඹෙ මස්සිනා අල්ලගන්නේ නෑ බන්. "

පිංකිට රහසින් පවසාය.

"මෙතන මොකක් හරි කුමන්ත්‍රණයක් තියෙනව, පිංකි හිරුට පැවසුවේ සුබා යන දෙස බලාගෙනය."

"හ්ම්ම් මටත් හිතෙනව ඊයේ රෑ මොකක් හරි වෙලා වගේ. "

හිරු පිංකිට පැවසුවේ සිනා සීය .

"අපිට මොකද ඕන මංගල්ලයක් කර ගත්තාවේ උන් දෙන්න කැමතිනම්. "

සුභා  මද වේලාවකින් පැමිණියේ ගැහැණු ළමයි පිහිනීමට අදින ඇඳුමකුත් ඇඳගෙන ය.

"සුභා යමු පරක්කු වෙනවා ක්‍රිෂාන්  කීවේ රෙදි කඹය සුභා අතට දෙමිනි."

"අයියා මේක බැඳ ගන්නේ නැද්ද?"

"නැහැ නංගි මට ඕන නැහැ යට අල්ලගෙන බහින්න ගල් වලින් හදපු අල්ලු වගයක් තියෙනවා."

සුභා  කඹය ඉණවටේ බැඳ ගත් පසු ක්‍රිෂාන් ඇයගේ අතින් අල්ලාගෙන පොකුණට බසින්නට විය. ඔවුන් දෙදෙනා නොපෙනී යනතෙක් ම අනිත් අය බලාගෙන සිටියෝ ය.

සුභාත් ක්‍රිෂානුත් පඩි හතක් බැස අගුල තියෙන

KUSHAN HETTIARACHCHI

sinhalaebooks.com

තැනට ආවෝය. දෙදෙනා සිටියෙ එකිනෙකාගේ අත්වලින් අල්ලා ගෙන ය.

ක්‍රිෂාන් අගුල පාදා අගුල විවර කරන තෙක් සුභා ක්‍රිෂාන්ගේ ඉන දෙපැත්තෙන් අත් දෙක දමා අල්ලා ගත්තාය.

ක්‍රිෂාන් ගේ දෑත් නිදහස් නිසා ඔහු ඉතාමත් ලේසියෙන් අගුල තිබුණු තැන ඉනේ තිබුනු පිහියෙන් සුද්ද කරඅගුල පාදා ගත්තේය.

සුභා ක්‍රිෂාන් ගේ ඉනවටා දමා තිබූ අත් දෙක වැරෙන් තව අල්ලාගෙන ඔහු ව බදා ගත්තේ ඒ වෙලේ ඇති වූ හැඟීමක් නිසා ය. ඇයට දැනුනේ කවුරුන් හෝ ක්‍රිෂාන් සහ තමා දෙපැත්තට අදින බවකි .

ක්‍රිෂාන් වැරෙන් අගුල පාත් කරනවා සමගම විශාල දිය බුබුළු ගොඩක් ගොඩාක් උඩට යන්නට විය. ඒ එක්කම වතුර මට්ටම ටික ටික පහළට එන්නට විය. ඒ එක්කම විනාඩි හතරක් පසු වූ

නිසා උඩ සිටි අය කඹය ටික ටික උඩට අදින්න විය.

වතුර ඉතාමත් ඉක්මනින් පහළට යන්නට විය. ඔවුන් දෙදෙනා පඩි දෙකක් පමණ නගිනකොට පොකුණෙහි පතුල තෙක්ම වතුර හිඳී තිබුණි. මහන්සිය නිසාම දෙදෙනා එතන තිබුණු පඩිය මත හිඳ ගත්තෝය.

උඩ සිටි අය දෙස බැලූ ක්‍රිෂාන්,

"ඔයාල එක පාරට බහින්න එපා දිය සෙවල වලට ලිස්සයි ඉන්න අපි උඩට එනකම්."

ඔහු සුභාගේ අතින් අල්ලාගෙන උඩට නගින්න විය .

දෙදෙනා උඩට ආ ගමන්,
"දැන් අව්ව හොඳටම වැටෙනව ඒ හින්ද දිය සෙවල වේලෙයි. "

ක්‍රිෂාන් පැවසීය.

"ඔව් දැන් දොලහටත් කිට්ටුයි අපි දවල් ට කාලා ඉවර වෙද්දී ඕක වේලෙයි ටිකක් හරි."

පිංකි පැවසුවාය.

"ඒත් මේකේ දොරක් නෑනේ පේන්න තනිකරම බැම්මක් විතරනෙ. "

හිරු පැවසුවේ පොකුණ තුලට එබෙමිනි.

"ඔයාල ඔක්කොම ලොකු අයනෙ මට නම් ප්‍රශ්නෙ මේකේ තිබුන වතුර කොහෙද ගියේ කියල. "

ඒ පුංචි හසරැල් ය.

"ඒකනම් ප්‍රශ්නයක් අපි කාලා ඉමුකො නේද? "

ක්‍රිෂාන් කිව්වෙ වතුර පිහාගෙන වෙන ඇදුමකට මාරුවෙමිනි.

පැයකින් පමණ ඔවුන් හොද කෑම වේලක් පිළියෙල කර ගත්තෝය .

කෑම කා අවසන් වෙන විට පඩි අත තිබූ දිය

Author KUSHAN HETTIARACHCHI

සෙවල තරමක් වේලී තිබුනි.

පිරිස ඇමතූ ක්‍රිෂාන්.

"දැන් මෙතනින් එහාට ගියාට පස්සෙ අපිට ආයෙ ආයෙ මෙතනින් එන්න බැරිවෙන්න පුලුවන්. ඒහින්ද අවශ්‍ය කරණ දේවල් ඔක්කොම අරන් යන්න වෙනව. අනික අපිට ප්‍රයෝජනයක් නොවෙන දේවල් අපි මේ කැළෑ රොද ඇතුලෙ හංගල යමු. "

"හරි. "

සියලු දෙනාම ඔහුගේ අදහස පිළිගත්තෝය .

ඊට පසුව සියලු දෙනාම එකතු වී පරිස්සමට පඩි පෙළ දිගේ පොකුණ තුළට බසින්න විය. පොකුණ තුළ කිසිම තැනක දොරක් තියෙන බවක් නොපෙනේ. පතුල තනිකරම නිල් පැහැති ය. "මේ පතුල ඇයි මෙච්චරම නිල් පාට?"

පිංකි ඇසුවේ විමසිලිමත් ව ය.

"ඒක මෙහෙමයි, ඔතන ඔය නිල් පාටින් තියෙන්නේ ඔය පතුල තමයි ගුහාව ට යන දොර එන්න මම පෙන්නන්න."

ක්‍රිෂාන් සියලු දෙනා සමඟම පතුලට මතට විය.

ඉන්පසු පතුල මත දණ ගසා ගත් ඔහු පරිස්සමින් පතුල පිරික්සන්න විය.

"හරි මේ තියෙන තැන."

ඔහු පැවසුවේ ජයග්‍රාහී ලීලාවෙනි.

පිංකි ඔය බෑග් එකේ පොඩි පිහියක් ඇති ඒක දෙන්න මට.පිංකි තම බෑගයෙන් පිහියක් ගෙන ක්‍රිෂාන් අතට දුන්නාය.ඔහු අගුලක් වැනි යමක් තියෙන තැනක් පිහියෙන් පිරිසිදු කරන්න විය .පිංකි දැන් අපිට ඕනෙම දෙවැනි පුස්කොල පොතයි අර පිත්තල පීරිසියයි .ඈය වහා ඒවා ක්‍රිෂාන් අතට දුන්නාය ක්‍රිෂාන් ඒවා අතට ගත්තේ ඉතාමත් පරිස්සමිනි.ඉන් පසු පිත්තල පීරිසිය පාදාගත් අගුල මත තැබූ ක්‍රිෂාන් පුස්කොල පිටු

සඳුනි තාරකාවී
Arthur
KUSHAN HETTIARACHCHI

පෙරලන්න විය.




පොකුණ වතුර බැස ගිය පසු දිස්වූ අයුරු.

KUSHAN HETTIARACHCHI

මේකේ තියෙන විදිහට නම් මේක උඩින් තියලා මේ තෙල් ටික මේකට දාන්න ඕන.ක්‍රිෂාන් තෙල් ටික ටික දානවත් එක්කම,පිරිසියේ මැද තිබූ කළු පාට තලපය වැනි තැනින් නිල් පාට එලියක් විහිදෙන්න පටන් ගති.

"කට්ටියම පස්සට එන්න."

ක්‍රිෂාන් කීවේ අනිත් හතර දෙනාද පස්සට ඇද ගනිමිනි. එක පාරටම දෙදරුමක් වැනි දෙයක්

සමග පොකුණේ පතුල අඩි හයක් පමණ පහලට ගියේ ය. පුදුමයකි ඔවුන් ඉස්සරහ ලොකු දොරක් දකින්නට තිබුණි.තනි කර කළු ගලින් නිමවා ඇති බිත්තිය මත ඒ දොර පිහිටා තිබුණි. ලස්සන ගල් කැටයම් වට කොට ඇති ඒ දොර මනරම් නිර්මාණයකි.

"දැන් ඉතින් මේ දොර ඇර ගන්නෙ කොහොමද?"

හිරු කනස්සල්ලෙන් පවසද්දී..

පිංකි ඉදිරියට පැමිණ.

"මේ දොර අරින්ඩ තියෙන්නෙත් අර විදියටමයි."

"අර විදිහටම."




තාරකාවි

ඒ මනරම් ගල් දොරේ පින්තූරයක්.

ඒ කිව්වේ ක්‍රිෂාන් පුදුමෙන් ඔවුන් දෙස බැලූහ .

Author
KUSHAN HETTIARACHCHI

"අයියෝ පොත් ටික අපි ගත්ත ගෙදර පෙට්ටගමක තිබිලා ඒක අරින්න තිබ්බෙ කැට නමයක් ඔබලා."

කියමින් පිංකි දොර පඩිය ළඟ දණ ගසාගෙන එතන තිබුණු ගල් කැට වගයක් එහා මෙහා කරන්න විය.

"ටකස් ටකස් ටකස් "හඬින් දොර විවර විය.

පිංකි නැගිට්ටේ.

"අයියා විතරක් නෙවෙයි මමත් පුස්කොළ පොත කියෙව්වා කියෝගන්න බැරි උනේ අර අපභ්‍රංශ ටික විතරයි " කියමින් ය.

දොරෙන් ඇතුලත දිස් උනේ දැඩි අන්දකාරයකි.

පිරිසට දෙසට හැරුණු ක්‍රිෂාන්.

" කඳුළු ගුහාවෙන් පිවිසෙන අමුතු ලෝකය ට ඔබ සැම සාදරයෙන් පිළිගන්නවා."

ඔහු එය පැවසුවේ නාට්‍යානුසාරයෙනි. සියල්ලෝම එයට සිනා සුනහ.

"දැන් මේකයි මේ ගල් දොරෙන් ඇතුලට ගියාට පස්සෙ අපිට මොනවා වෙයිද කියල කියන්න අමාරුයි. මෙතනින් එහාට අපි යන්නේ අවුරුදු දහස් ගණනක් කිසිම මනුස්සයෙක් පය ගහපු නැති අඩවියකට. මේ ඉන්න අපි පස් දෙනාම හැම වෙලේ ම එකටම ඉන්න ඕන ඔයාලට තේරුණා

නේද මේ කඳුළු ගුහාව නෙමෙයි. මෙතනින් ඇතුලට ගියහමයි කඳුළු ගුහාව අපිට හම්බ වෙන්නෙ.සමහරවිට අත්භූත සතුන් ඉන්න පුළුවන්.තවත් සමහර විට අපි පස් දෙනා ආපසු නොඑන්නත් පුළුවන්. ඔන දේකට එකට අපි මුහුණ දෙමු ක්‍රිෂාන් පැවසුවේ හැඟුම්බරවය .

"නෑ අයියා අපි මේ අබිරහස හොයා ගෙන ආපහු එනවා. අපි පස් දෙනාම එනවා." සුබා කීවේ ක්‍රිෂාන්ගේ අතක් අල්ලා ගනිමිනි.

ඔවුන් සතුව කෑලි පහේ විදුලි පන්දම් දෙකක් තිබුණි ඒවා ද දල්වා ගෙන ඔවුන් ගුහාව තුළට පිවිසුණි.

"මේක කඳුළු ගුහාව නෙවෙයි නම් මේක මොකක්ද අයියේ."

මෙතෙක් වේලා නිහඬව සිටි හසරැල් ක්‍රිෂාන් ගෙන් ඇසුවේය.

පොතේ හැටියට නම් මල්ලී මේක ගේට්ටුවක්

විතරයි.

ඔවුන් කිලෝමීටර් එකක් පමණ යන විට යාන්තම් එළියක් ඉස්සරහින් පෙනුනි. ඔවුන් මේ එන්නෙ තනිකරම ගල් ගුහාවකය. වවුලන්ගේ රජ දහනක් වූ නිසා දෝ ඔවුන්ගේ ගඳ හොඳින් දැනුනි.

ටිකකින් ඔවුන් පිවිසුනේ එළිමහනකටයි.

"මේ කොහෙද අප්පා. "

හිරු පැවසුවේ වටපිට බලමිනි .

"කිසිම දියුණුවක් නැති පාටයි නේද?"

ඒ සුබාය.

ඔවුන් පිවිස තිබුනේ ගල් පොකුණක් තිබූ ස්ථානයකට ය.




උඩටනගින ගල් පාර.

Author
KUSHAN HETTIARACHCHI

උඩට නගින්න පාරක් ද පසකින් ගල් පොකුනක් ද විය.

"ඔයාලට මේ ඉර එලියෙ වෙනසක් නැද්ද? "

ක්‍රිෂාන් ඇසුවේ සියලු දෙනා දෙසම බලමිනි .




පසෙකින් තිබූ ගල් පොකුණ.

"ටිකක් නිලට හුරු අඳුරක් තියනව."

පිංකි පවසද්දී .

"අපි ගුහාව ඇතුලට එද්දි වෙලාව හවස දෙකත් පහු වෙලා. ඒත් දැන් වෙලාව තාම දහයටත් නෑ වගේ නෙද? අර බලන්න ඉර තාම තියෙන්නෙ නැගෙනහිර.පරිසරයේ තියෙන්නෙත් උදෑසන ගතියක්. "

ක්‍රිෂාන් පැවසුවේ තම මාලිමාව අතට ගෙන

බලමිනි.

"ඔව්මයි අයියේ අපි මේ කොහාටද ඇවිත් තියෙන්නෙ? "

ඒ සුබාය .

"හරියටම කියන්න බෑ නංගි මේක වෙනස් මානයක් වෙන්න පුලුවන්. කොවොන්ටම් පිසික්ස් වලදි උගන්නන දෙයක් සමාන්තර ලෝක. "

"ඒ කියන්නෙ වෙනත් ලෝකයක්. "

හිරු අසද්දි.

"ඉස්සරඅපේ රජවරු හිටිය විද්‍යාව පරතරයට ගිය. " ක්‍රිෂාන් දිගටම පවසද්දී.

"අර ඉසුරුමුණිය තරු සිතියම වගේද?"

පිංකි මැද්දට පැන්නාය.

එකපාරටම ඔවුන්ට විශාල සද්දයක් ඇසුනි.

සද්දය එන දෙස බැලූ ක්‍රිෂාන්.

"අන්න ...පාත් වෙන්න මෙන්න මේ මෙතෙන්ට මුවා වෙමු. "

වැඩුනු මිනිසෙක් තරම් විශාල බත්කූරෙක් ගල් පොකුණ වටේ කැරකී යලි ආපසු පියාඹා ගියේය.




වැඩුනු මිනිසෙක් තරම් විශාල බත්කූරෙක් ගල් පොකුණ වටේ කැරකී යලි ආපසු පියාඹා ගියේය.

උෟ ගියපසු බියවී සිටි අනිත් අය දෙස බැලූ ක්‍රිෂාන්.

"දැක්ක නේද සයිස් එක බත් කූරා ඔච්චර ලොකුනම් මේකෙ ඉන්න අනිත් උන් කොහොම ඇද්ද?"

"ඒකනෙ අයියේ මටනම් බයේ බැහැ. "

ඒ හිරුැය.වට පිට බැලූ පිරිස හිමින් හිමින් කන්ද

නගින්න විය.

"බය වෙන්න එපා තවමොක්කු මොක්කු මේකේ ඉන්න වදන් නෑ."

සුභා කීවේ වටපිට බලමිනි. ස්වාභාවික ගල් එකතු වී සෑදුණු පාර දිගේ කන්ද උඩට නැග මුදුනට ආ පසු ඔවුන්ට පෙනුණේ අමුතුම ආකාරයේ ගලකි. හරියට පාන් ගෙඩියක් කැපුවා වැනි ආකාරයට පිරුණු විශාල ගල දෙස ඔවුන් බලා හිටියේ විශ්මයෙනි .

"ක්‍රිෂාන් අයියට මොනව ද හිතෙන්නෙ .මොකක් හරි ලොකු අමුත්තක් පේනවා නේද? මේ පරිසරයේ? "

"ඔව් නංගි."

ඔහු කිව්වේ සුබා දෙස බලාගෙනය.

"මට හිතෙන්නේ ශතවර්ෂ ගාණක් අතීතය ට අපි ගිහිල්ල වගේ අපි. අනිත් එක හරි පරිස්සමින් මෙහෙ ඇවිදින්න ඕන.දැක්කනේ විශාල බත් කුරා ඒ වගේ විශාල සත්තු ඉන්න පුලුවන් තවත්."




ඔවුන්ට පෙනුණේ අමුතුම ආකාරයේ ගලකි හරියට පාන් ගෙඩියක් කැපුවා වැනි ආකාරයට.

"අයියෙ ඔයා අපි යන්න ඕනේ තැන හරියටම දන්නවද?"

එසේ ඇසුවේ පිංකි ය.

"ඔව් නංගි මම හරියටම දන්නවා. අපි මේ ගල් දෙබොක්කාවක ඉන් එහා පැත්තට යන්න ඕන."

"වාව් සුබා වත් ලග තියන පොත සම්පුර්ණයෙන්ම කියවල වගේ. "

එසේ කීවේ හිරු ය .

"ඔව් අපේ අයියට කෙල්ලෙක් ඉන්නව නං ලෝකේ

උනත් පෙරළයි."

මෙතෙක් වෙලා කට වහගෙන සිටි හසරැල් තමන්ගේ කට ඇරියේය.

ගල් දෙබොක්කාව අතරින් පහළට බැස්ස ඔවුනට දකින්නට ලැබුණේ බෝලයක් වගේ පිහිටා තිබූ විශාල ගලකි.




පහළට බැස්ස ඔවුනට දකින්නට ලැබුණේ බෝලයක් වගේ පිහිටා තිබූ විශාල ගලකි.

එය වටේ ගොස් එයින් එහා පැත්තට ගිය පසු ඔවුන් සොය සොයා පැමිණි කඳුළු ගුහාව කුඩා පොකුණකින් වට වී තිබුණි. එය ඉතාමත් සෝබමාන තැනකි.ගුහාව තිබුනේ විශාල ගල්

පොකුණ මැද තිබූ දූපතක් වැනි කොටසේය. අනික ගුහා කට තිබුනේද වතුරට කෙලින්ම මුහුණ හරවා නිසා ලේසියෙන් කෙනෙකුට එයට ඇතුලු වීම ලේසි නැත.




එහා පැත්තට ගිය පසු ඔවුන් සොය සොයා පැමිණි කඳුළු ගුහාව කුඩා පොකුණකින් වට වී තිබුණි.

පොකුණ ඉවුරේ බිම ඉඳගත් ක්‍රිෂාන්.

"දැන් ලොකු ම දේ ගුහා කට ගාවට යන්නේ කොහොමද? කියන එක."

සියල්ලෝම බලාපොරොත්තු සුන් වූ ආකාරයෙන්

පොකුණ ඉවුරු මත වාඩි වී කල්පනා කරන්න වූහ.

"නංගි අපි මොනවා හරි කමු ද? මට හරි බඩගිනි."

ක්‍රිෂාන් කීවේ පිංකි දෙස බලාය බලාය.

පිංකි ත් හිරු ත් සුභාත් එකතුව ගිනි මැලයක් ගසා නූඩ්ල්ස් පිළියෙළ කළෝය. ඒ අතර ඔබමොබ ඔබ මොබ ඇවිද්ද හසරැල්.

"අයියේ පාරුවක් හදනවනම් දරකොට නම් තියෙනවා යැයි පැවසුවේ ක්‍රිෂාන් ළඟට එමින් ය."

"අන්න වැඩේ අපි පාරුවක් හදමු. "

ක්‍රිෂාන් සහ හසරැල් එකතුව දර කොට ගෙනවිත් සාමාන්‍ය තරමේ පාරුවක් නිර්මාණය කළෝ ය.

මේ අතර කෙල්ලො තුන්දෙනා ගජරාමෙට තම ෆෝන් වලින් සෙල්ෆි ගත්තෝය .එක පාරටම සුබා..

"අනේ ෆෝන් එකෙ සිග්නල් නෑනේ. "

තම යෙහෙළියන්ට තම දුරකතනය පෑවාය .

එවිට හැමෝම තම දුරකතන පිරික්සන්න විය. කාගේවත් ෆෝන් වලට සිග්නල් නැත .

"එහෙනම් මගෙ සැකේ හරි අපි ඉන්නෙ වෙනත් මානයක. "

ක්‍රිෂාන් පවසද්දි.

"ඒක උනේ කොහොමද? "

පිංකී විමසුවාය .

"ඒක උනේ වෙනත් ලෝකයකට යන දොරක් තමයි අර පොකුන. අර පිත්තල පීරිසියෙන් කරන්නෙ අපි ඉන්න මානය වෙනස් කරණ එක අපිට ඒක තේරුනේ නෑ."

"දැන් කරන්න දෙයක් නෑ අපි ආපු වැඩේ කරමු ."

ක්‍රිෂාන් පාරුවට නැග පරීක්ෂා කොට අනිත් අයටත් නගින්න යයි පැවසුවේය.

කට්ටියම පාරුවට නැගී හිමිහිට හිමිහිට ගුහාව දෙසට පා උනේ ලොකු කෝටු දෙකක ආධාරයෙන් හබල් ගාමිනි .මදවේලාවකින් ඔවුන්ට ගුහා කට ලඟට යාමට පුලුවන් විය.

"දැන් ඊලඟ ප්‍රශ්නය මේ පාරුව රඳවල තියා ගන්න එක. "

වතුර තරණය කර ගුහා කටට සේන්දු වූ පිරිස

ඇමතූ ක්‍රිෂාන් පවසන්න විය. ගුහාව දැඩි කලුවරකින් වෙලී තිබුණි.

"අයියේ අපි පාරුව ටිකක් ඇතුලට ඇදල තියමු. එතකොට අවුලක් වෙන්නෙ නෑ. "

ඒ හසරැල් ය.

"අපි එහෙමවත් කරමු. "

ඔවුන් පස් දෙනාම එකතු වී පාරුව ගුහාව තුලට ඇද්දෝය .

"දැන් හරි අපි දැන් යමු. "

ක්‍රිෂාන් පවසා ගුහාව තුලට යන්න හැදුවා පමණි.

"ඉහි ඉහි ඉහි. "

පෙරදින රාත්‍රියේ මෙන් ගැහැණු ළමයෙකුගේ ඉකිබිඳුමක් ලඟින්ම වගේ ඇසී නැසී ගියේය.

සියලු දෙනාම නිෂ්ශබ්දය.

ගැහැනු ළමුන් තිදෙන ඔවුන් ඔවුන් දැඩි සේ වැලඳ ගත්තේ හිත් වල ඇතිවූ චකිතය නිසා ය .

ඒ අතර අඳුරේ උවත් ඔවුන්ට පෙනුනේ දත් විලිස්සා ගත් බයානක රුවක් තමන් දෙස බලා

සිටිනා බියකරු දසුනයි .

"සුගන්ධිකා ඔබ අපට බාධා නොකල යුතුයි."

ක්‍රිෂාන් දැඩි හඬකින් පැවසුවේ අර බියකරු රූපය දෙස බලාගෙනය .

ඒත්සමගම ඒ රූපය අතුරුදහන් වූයේ දුමක් ගසා යන පරිදිය.

කෑලි පහේ විදුලි පන්දම් දෙක දල්වා ගත් ඔවුන් ගල් ගුහාව තුලින් ඉදිරියට ඇදෙන්න විය .

මද දුරක් යන විට ඔවුන්ට හමු වූයේ පොළව පහළට බසින්න තිබු ගල් පඩිපෙළකි කොහාටවත් විහිදෙන වෙනත් මාර්ග නොවූ හෙයින් .

කඳුළු තාරකාවී
Author KUSHAN HETTIARACHCHI




මද දුරක් යන විට ඔවුන්ට හමු වූයේ පොළව පහළට බසින්න තිබු ගල් පඩිපෙළකි.

පස් දෙනාම වට පිට පිරික්සමින් පඩිපෙළ දිගේ පල්ළෙහාට බසින්න විය. ඔවුන් පිවිසියේ විශාල ශාලාවක් වැනි තැනකටය .එක මුල්ලකට වෙන්න තිබූ දෙයින් ඔවුන්  විමතියට පත් විය. ඒ අවරුදු විසි එකක පමණ ගැහැනු ළමයෙකුගේ සිරුරකි අවුරුදු දහස් ගනනක් ගත උනත් ඒ සිරුර ජීවමාන ලෙසම තිබුණි .ක්‍රිෂාන්ට ක්ෂණයකින් මතක් උනයේ කලින් දා රෑ පොකුණ මත පාවී පාවී හැඩුවේ මේ ගැහැණු ළමයා බවය .




ඒ අවරුදු විසි එකක පමන ගැහැනු ළමයෙකුගේ සිරුරකි.

"අයියෝ මේ කව්ද?"

වෙව්ලන කටහඬින් ඇසුවේ හිරුය. ඒ හඬ ආ විදිහෙන්ම ඇය හොඳටම බයවී ඇති බව අනෙත් අයට වැටහුනි .

"මේ තමයි අපි සොයන් ආව කඳුලු තාරකාවී නොහොත් සුගන්දිකා කුමරිය. "

ක්‍රිෂාන් පවසද්දී.

"ඒත් මේක නිදාගෙන ඉන්නව වගේම තියනවනෙ."

පිංකී පැවසුවාය.

"ඔව් ඒක ඇත්ත අපි ඉතින් දැන් මේ කඳුළු තාරකාවී නොහොත් සුගන්ධිකා ව අවදි කරන්න වෙනවා. "

ක්‍රිෂාන් පවසද්දී .

"මොනවා මෙයාව ඇහැරවන්න. "

හිරු කීවේ විමතියෙනි. ඇයගේ බියපත් කටහඬ වෙව්ලා ගොස් තිබුණි .

"ඇයි මෙයා අවුරුදු දහස් ගණනකට කලින් මැරිච්ච කෙනෙක් නේ."

සුබා පවසද්දී.

"ඒක ඇත්ත ඒ වුනාට අපිට මෙයාව ඇහැර වන්න පුළුවන් අර පුස්කොල පොතේ තියෙනව, ඒක කරන විදිහ. "

ක්‍රිෂාන් පැවසීය .

"ඒත් මෙයා ඇහැරුනාම නපුරු කෙනෙක් නම්, මැරිච්චි මිනිස්සු කියන්නේ හොල්මන් කියලයි මං අහල තියෙන්නෙ."

හිරු පැවසුවේ බියපත් කටහඬිනි.

"ඒවා පුහු මත නංගි විද්‍යාත්මකව හැම දේම හිතන්න. නැතුව පුහු මනස්ගාත නෙවෙයි මූලාශ්‍ර වලට අනුව සුගන්ධිකා කියන්නේ අහිංසක කුමාරිකාවක්. ජීවිතේ ලස්සනම කාලෙදි හිරකාරියක් විදියට ජීවත් වුන කෙනෙක්. එයාගේ ආත්මයට සැනසීමක් දෙන්න පුළුවන් නම් ඒක නේද හොඳම දේ. අනික අපි මේ ජීවත් වෙන්නේ වෙනස්ම ලෝකයක මේ ලෝකෙ තියෙන හුඟක් දේවල් වෙනස් ."

ක්‍රිෂාන් දැඩි හඬකින් පවසද්දී .

"මම නං කොහොමටත් කැමති නෑ මිනියකට

sinhalaebooks.com

පණ දෙන එකට."

එසේ කීවේ පිංකීය.

"ඇයි ඔයාල ඉතින් පටු විදියට හිතන්නේ මෙයාව නැගිට්ටවන්නේ නැතුව අපිට මෙතනින් එහාට අඩියක්වත් තියන්න බෑ. "

"ඒකත් තියෙන්නෙ ඔය පුස්කොළ පොතේමද?"

"ඔව් මේ පොතේ ගොඩක් විස්තර තියනවා සමහරවිට පිංකි ඔයාගේ සීයා මේ ගමන ඇවිල්ල තියෙන්න පුළුවන්. "

"නෑ අයියෙ එයා මේ ගමන ආව වෙන්න බෑ."

පිංකි එසේ පවසද්දී .

"ඇයි එහෙම කියන්නේ?"

"එහෙම උනානම් වුණා නම් මේ සුගන්ධිකා මෙහෙම නිදාගෙන ඉන්න විදිහක් නැහැනේ."

"ඒකත් නම් ඇත්ත තමයි. "

"අපි මෙයා ඇහැරවන්න කොහොමද?"

හසරැල් තම අයියාගෙන් අහද්දි .

"ඔක්කොටම කලින් මේ ගුහාව තුළට හිරු එළිය

එන ක්‍රමයක් තියෙනවා ඒක හොයාගන්න ඕන."

ක්‍රිෂාන් වටපිට බලමින් පැවසීය.

ඔවුහු විදුලි පන්දම් දෙක ඔබ මොබ අල්ලමින් එම කුටිය පිරික්සන්නට විය. ඔවුන්ට පෙනී ගියේ මෙය ගුහාවක් නො ව මිනිස් දෑතින් කළ නිර්මාණයක් බවය. ඔවුන් ආපු දොර පමණි වෙන කිසිම දොරටුවක් වත් කවුලුවක්වත් පෙනෙන්නට නැති බව ඔවුන් ට වැටහුනි.

"මේක ඇතුලට හිරු එළියට එන විදිහක් තියෙන්නම ඕනේ ඉන්න බලන්න."

ක්‍රිෂාන් පුස්කොල පොත අරන් බලන්න විය. එහි තිබ්බේ හිරු කවුලු විවර කිරීමට ඇති යාන්ත්‍රනයක් පිළිබදවයි. ඒ පිළිබඳව තිබෙන තඹ පත්‍රය මේ කුටිය තුල තැම්පත් කර ඇති බව පැවසුවත් එතනින් එහා විස්තරයක් නොමැත.මේ අතර ටෝච් එලියට ඔහු දැක්කෙ ඔවුන් බැස්ස පඩිපෙළට මෙහා පැත්තේ මුල්ලේ ඉඳගෙන සිටින මිනිසෙකි. ඇත්තටම ඒ දෙස හොඳින් බැලූ විට පෙනුනේ ඒ මිනිසෙක් නොවව ඇට සැකිල්ලකි .

KUSHAN HETTIARACHCHI




ඒ මිනිසෙක් නොව ඇට සැකිල්ලකි .

"අපිට ඕන උත්තර ඔක්කම මෙයා ගාව තියනව නිසැකයි. "

ක්‍රිෂාන් එදෙසට ගියේ කිසිදු චකිතයක් නැතිවයි .

ක්‍රිෂාන් ඇට සැකිල්ල ලඟට ගොස් ඇට සැකිල්ල ඉදගෙන සිටි ආකාරයටම ඇට සැකිල්ල ඉස්සරහා දණගහ ගත්තේ ය. ඇටසැකිල්ල වාඩි වී සිටියේ ගල් පෙට්ටියක් මත ය .

"මට පේන විදිහට නම් මෙයා මුරකාරයෙක් වගේ"

ක්‍රිෂාන්පැවසුවේ පිරිස දෙසට හැරී ය.

"ඔව් ඔව් මටත් එහෙම හිතෙනවා. "

"ඔව් මම මුරකාරයෙක් තමා."

හිඳගෙන සිටි ඇටසැකිල්ල කතා කරමින් නැගිට්ටේය.

"ඕන් පස්සට වෙන්ඩ"

ක්‍රිෂාන් අනිත් පිරිස සමඟ පිටිපස්සට පැන්නේය.

ඇට සැකිල්ල ඇවිදිමින් ඔවුන් දෙසට එයි.

ගැහැණු ළමයින් තිදෙනා බියෙන් හැකිලුනු අතර.

ක්‍රිෂාන් එල්ලය බලා මදක් නැවී විදුලි පන්දමෙන් ඇට සැකිල්ලේ කකුල් දෙක ට වැරෙන් පහරක් ගැසී ය. ඇටසැකිල්ලේ සුනු විසුනු වී බිත්තිය මුල්ලට විසිවිය.

"ආයේ එයා නැගිටින්නෙ නෑ."

ක්‍රිෂාන් පැවසුවේ බියපත් මුහුණින් ඔහු දෙස බලා සිටින හතර දෙනා දෙස බලා ය. ඉන් පසු ක්‍රිෂාන් ලංවූයේ ඇට සැකිල්ල වාඩිවී සිටි පෙට්ටිය ළඟටය.

"මේක ගල් පෙට්ටියක් වෙන්න බැරිද? අපිට ඕන දේ මේක ඇතුලේ තියෙන්න පුළුවන් ක්‍රිෂාන් පැවසුවේ දැඩි අධිෂ්ඨානයකිනි. "

"මල්ලි මගේ බෑග් එකේ ඇති ඉස්කුරුප්පු නියන ඒක අරන් දෙන්න පොඩ්ඩක්. "

හසරැල් ඔහු ට ඉස්කුරුප්පු නියන දුන්නේ ය.

ක්‍රිෂාන් ගල් පෙට්ටිය හොඳට පරීක්ෂා කළේය.

"මේක පෙට්ටියක්ම තමයි ඒත් කොහොමද මේක අරින්නේ."

"අයියෙ ඒක අරින විදිය පුස්කොළපොතේ නැද්ද?"

එසේ ඇසුවේ මෙතෙක් නිශ්ශබ්ද වී සිටි පිංකිය.

"අයියේ අපි මේ සුගන්ධිකා ගේ මිනියට පන දුන්නට පස්සේ එයත් මේ වගේ නපුරු ආත්මයක් වුනොත්, ඉස්සර අහිංසක උනාට මැරුණට පස්සේ අහිංසක නැද්ද කවුද දන්නේ. "

එසේ පැවසුවේ හිරු ය.

"අපි බලමුකෝ මමනම් හිතන්නේ නෑ එයා නපුරු වෙයි කියලා. මේ ගල් පෙට්ටිය ගැන පුස්කොල පොතේ නැහැ සමහර විට ඒ ගැන තිබ්ච්ච පුස්කොල කවුරු හරි අරගෙන තියෙනවා."

"ඒත් ඕක ගන්න කෙනෙක් නෑ නේ අයියේ. "

"කමක් නෑ අපි බලමුකෝ මෙතනින් ඒ මොකක්

හරි කට්ටයක් වගේ තියනවා නේද?"

ක්‍රිෂාන් කීවේ පෙට්ටිය දෙස බලාගෙනය අයියේ ඔය කට්ටයක් නෙමෙයි නේද? යතුරු හිලක් නේද? තියෙන්නෙ හසරැල් කීවේ උවමනාවෙන්ම ඒ දෙස බලමිනි .

"ඔවුම තමයි ඒත් ඉතිං එකේ යතුර කෝ?"

ක්‍රිෂාන් අසද්දි.

"මම නම් හිතන්නේ යතුර තියෙන්නේ ඔය පෙට්ටිය යටමයි."

හසරැල් බැරෑරුම් හඬින් පැවසීය .

"වාව් මගේ මලයටත් හොඳ මොළයක් තියෙනවා නේ. අපි දෙන්නම එකතුවෙලා මේ පෙට්ටිය පොඩ්ඩක් මෙහාට අදිමු ද?"

ක්‍රිෂාන් පැවසුවේ තම මලයාගේ හිස අත ගාමිනි.

ඔවුන් දෙදෙනා එකතුව ගල් පෙට්ටිය මදක්

මෙහාට ඇද්දෝ ය. හසරැල් කීවා හරි ය පෙට්ටිය යටින් හරි හතරැස් වලක් කපා තිබුණි, ඒ තුළ ගල් පෙට්ටිය ඇයි සැලකිය හැකි විශාල යතුරක් තැන්පත් කොට තිබුණි.

හසරැල් යතුර අතට ගත්තේ ඉතා පරිස්සමිනි.

"අයියෙ ඔයාම අරින්න බලන්න ඒක. "

ක්‍රිෂාන් යතුර ගෙන ගල්පෙට්ටියේ යතුරු හිලට යතුර දමා කැරකෙව්වත් එය මුලින් කැරකුනේ නැත.ටිකක් මහන්සි වී කැරකවූ විට අගුල කැරකුනි.ගල් පෙට්ටිය විවර කරන විට සියල්ලෝම ගල් පෙට්ටිය තුලට නෙත් යොමු කලෝය .සියල්ලන්ගේම බලාපොරොත්තු සුන් කරමින් ඒ තුල වූයේ රතු පාට විල්ලුද රෙදි කෑල්ලක් මත තිබූ බට නලාවකි.

"දැන් මොකද කරන්නෙ අර පිස්සු ඇටයා තියාගෙන ඉදල තියෙන්නෙ බට නලාවක් නේ. "

ක්‍රිෂාන් පවසද්දී..

"කෝ බලන්න දෙන්න අයියේ. "

හිරූ බටනලාව ඉල්ලුවේ ඇය සංගීතයට කැමති නිසා ය.

"අයියේ ඕක තියන් ඉන්න මොකක් හරි හේතුවක් ඇති. "

පිංකී පවසද්දී.

"අයියේ ඔක එක්තරා විදිහක යතුරක් වෙන්න බැරිද? "

සුබා පැවසුවේ තවමත් දන ගසන් ඉන්න ක්‍රිෂාන් ලඟින් ඉඳගනිමිනි.

එවිටම අඳුරු මුල්ලෙන් කටහඬක් ඇසුනි.

" මම නැතුව ඔක කරන්න ඔයාලට කරන්න බැහැ"

ඔවුන් දෙසට එමින් සිටියේ අර ඇට සැකිල්ලයි වේගෙන් ආ ඇටසකිල්ල ක්‍රිෂාන් ලඟට ඇවිත්.

"ඇයි මට ගැහුවෙ අවුරුදු දාස් ගනනක් මම එතන ඉදන් හිටියෙ ඔයාල එනකම්. "

"මොනව? "

"ක්‍රිශ්නා ,හසරැල් ,මීනාක්ශි ,බෝධී ,රවිනි "

"මේ ඔයාලගෙ නම් ඔයාල සුගන්ධිකා කුමරියගෙ යාලුවො. "

ඔයාල එනකම් මම මෙතන ආරක්ෂාකරා පොකුණ ගාවට ගිහින් හැමදාම අඬන්නෙ කුමරියගෙ ආත්මය .

sinhalaebooks.com

"එතකොට ඔයා කවුද? "

"මම සුගන්ධිකා කුමරියගෙ ආරක්ෂකයා. කුමරිය මියගිය දා ඉඳල මම මේ කුටිය තුල ඉන්නව මගෙ නම චිත්‍ර බාහු. "

"චිත්‍රබාහු ඔයා ආපු විදිහට බය හිතුනනෙ එකයි ගැහුවෙ. "

"ඒකට කමක් නෑ."

"අපට කියන්නකො මේ ගැටලු නිරාකරණය කරල සුගන්දිකාව නැගිට්ටවා ගන්න ක්‍රමය. "

"ඇත්ත මට තව ටික වෙලාවයි තියෙන්නෙ, ඔය බට නලාවෙන් මෙන්න මේ පද පේලිය ගහන්න තුන් පාරක්."

"මිතුරු මිතුරියන්
ආදර මිතුරන්
වෙන් නොකරනු මැන
නපුරු සුලන් රැල් "

කියමින් ඇටසැකිල්ල කපා හෙලූ කෙසෙල් කඳක් වගේ බිම වැටී සුනු විසුනු වී ගියේය.

හිරු දෙස බැලූ ක්‍රිෂාන්.

"දැන් ඕක බට නලාවෙන් ගහන්නෙ කොහොමද?"

"ඉන්න අයියෙ මම ට්‍රයි කරන්නම්. "

හිරු කිහිප සැරයක් ට්‍රයි කරල වාදනය කරපු එක හරි කියල තේරුනේ.

එක පාරටම.

"ටික් ඩික් ටික් "

හඬ නගමින් අගුලක් ඇරුන හඬ ඇසෙද්දියි.

ශබ්දයත් එක්කම මුළු ගුහාවම එළිය වෙන්න පටන් ගති ගුහා මුදුනේ ගල් ඇත් වී හිරු එළිය කෙලින්ම ගුහාව තුළට පතිත වී තිබුණි .පස් දෙනා ම ඔබ මොබ බැලුවේ ගුහාවේ සෑම තැන ම නිරීක්ෂණය කරමිනි.

තවත් එක් විශේෂ දෙයක් විය. එනම් ගුහාව මැද්දේ සෘජුකෝණාස්‍රාකාර පෙට්ටියක් මෙන් කොටසක් උඩට නෙරා ඇවිත් තිබීමය. සාමාන්‍යයෙන් මෙය මිනිසෙකු නිදාගන්නා ඇඳක් තරම් විශාල වූ අතර, අඩි තුනක් පමණ උස විය. තනිකරම කළු ගලින් නිමවා ඇති මෙය මත මංජුසාවක් වක් විය. බැලූ බැල්මට එය තඹ හෝ ලෝකඩ වලින් නිම වූවක් බව පෙනෙන්නට තිබුණි. ක්‍රිෂාන් සහ සුභා ඒ දෙසට ගියේ එකටම වාගේය.

" මං මේක තමා ආපු වෙලේ ඉඳලම බැලුවේ. "

ක්‍රිෂාන් කීවේ සෘජුකෝණාස්‍රකාර ගල් ඇඳ අතගා බලමිනි. ඉන් පසු ඔහු මංජුසාව අතට ගත්තේ ඒ විවර කරමින්මය. ඒ තුළ තඹ පත්‍රයක් තැන්පත් කර තිබුණි.

තඹ පත්‍රය ගෙන පිංකි අතට දුන් ක්‍රිෂාන් කෙලින්ම ගියේ සුගන්ධිකා ගේ මිනිය තැන්පත්

කර තිබූ ගල් ආසනයේ වෙතය. ඉන්පසු කිසි චකිතයක් නැති ව සුගන්ධිකා ගේ මිනිය ඔහුගේ දෑතින් ඔසවාගත් ක්‍රිෂාන් එය ගෙනවිත් ගල් පෙට්ටිය මත තැබුවේ අනිත් අය විස්මයෙන් බලා සිටිද්දීය .

"ඔයාට බය නැද්ද අයියේ? "

එසේ ඇසුවේ පිංකිය.

"මම මොකටද බය වෙන්නෙ."

ඔහු එසේ කියමින් සුගන්ධිකා ගේ මිනිය සෘජුකෝණාස්‍රාකාර පෙට්ටිය මත තබමිනි.

"දැන් අපිට තියෙන්නෙ මෙයාට පණ දෙන එක විතරයි හිරු එළිය හොඳට ලැබෙනවා.

ක්‍රිෂාන් කීවේ  උඩ ඇරුණු කවුළුව දෙස බලමිනි.

" අපි කොහොමද ඒක කරන්න අය්යේ?"

පිංකි ඇසුවේ ක්‍රිෂාන් දෙස බලමිනි. එක කරන්නේ

මෙහෙමයි.ඔය පුස්කොළපොතේ ඒ ගැන විස්තරයක් තියෙනවා. අපි ඒක කරල බලමු. ඔයා ගාවනේද අර තෙල් බෝතලේ? ගන්න කෝ ඒක අතට. මල්ලි පොඩ්ඩක් එන්නකෝ මෙතෙන්ට, ඔයා මේ තෙල් බෝතලය අරගෙන සුගන්දිකාගෙ බෙල්ල දෙපැත්තේ බිංදු දෙක ගානේ ගාන්න. මෙය තඹ පත්‍රයේ තියෙන විදිහට මෙයාට පණ දෙන්න කන්‍යා වෝ තුන් දෙනෙක්ගෙ ලේ බිදු තුනක් ඕන.

"මොනවා?"

ගැහැණු ළමයින්ට තිදෙනාම ක්‍රිෂාන් දෙස බැලුවේ එකවර ම ය.

ඔව් මේ තඹ පත්‍රයේ කියලා තියෙන්නේ ඒ විදිහට තමයි මේකෙත් ඒක කියල තියෙන්නෙ අනිත් පැත්තට මේක කියවද්දි කියවන්න ඕනෑ දකුණ ඉඳලා වමට. මේ බලන්න ක්‍රිෂාන් තඹ පත්‍රය ගැහැණු ළමයි තුන් දෙනාට පෑවේය.

"දැන් කොහොමද අපි මේ වැඩේ කරන්නෙ? ලේ බිංදු ගන්නෙ කොහොමද? "

"ඒක සිම්පල් මෙන්න මේ හැට්ට කට්ටෙන් විදලා ලේ බින්දු තුනක් ගමු."

ක්‍රිෂාන් ඔහුගේ බෑගයේ තිබූ හැට්ට කට්ටක් පිංකි අතට දුන්නේය.

"මට නම් බෑ ඇඟිල්ල හිල් කරන්න සුභා කීවේ මුහුණ අකමැත්තෙන් හකුලා ගනිමිනි."

"ඇයි ඔයා එහෙම කියන්නෙ? සුගන්දිකා ඇහැරවා ගන්නැතුව අපිට මෙතනින් එහාට අඩියක්වත් තියන්න බැහැ, මෙතනින් එහා යන්න ඕන හැමදේම දන්නේ එයා විතරයි. එයාව කොහොමටත් අවදිකරගන්න ඕනේ. අනික එයා අපි පස් දෙනා ගෙම යාළුවා. ගොඩක් ඈත අතීතයේදී ඒ මතකය ඔයාලට නැති වුණාට මට තියෙනවා තේරුනාද?"

ක්‍රිෂාන් ඇය දෙස එක එල්ලේ බලා සිටිමින්

පැවසීය.

"සුභා අපි මේක කරන්න ඕනේ අපි මේ ආපු ගමනින් වැඩක් නෑ. "

හිරු පැවසුවේ සුභාගේ උරහිසට අත තබමිනි.

"හරි අපි ඒක කරමු. "

සුභා පැවසුවේ ක්‍රිෂාන් දෙස බලමිනි.

හසරැල් සුගන්දිකාගේ බෙල්ල දෙපස තෙල් බින්දු දෙක බැගින් ගා පිරි මැද්ද අතර..

පළමුව පිංකිත් දෙවනුව සුභාත් තෙවනුව හිරුත් පිළිවෙලින් තම ඇඟිලි හැට්ට කට්ටෙන් හිල් කර සුගන්දිකාගෙ තොල් අතරින් මුව තුලට දැමීය. හිරුගේ ලේ බිඳුව වැටෙනවත් සමගම අහස කලු කොට විදුලි කොටන්න විය. ඔවුන් එය දුටුවේ විවර වූ ගුහාවේ වහලයෙනි පස් දෙනාම ගුහාවේ බිත්තියට හේත්තු වූයේ වෙන්න යන දේ දෙස කුතුහලයෙන් බලමිනි.

sinhalaebooks.com

මේ දේ බිය නැතිව කලත් ක්‍රිෂාන්ටත් චකිතයක් නොතිබුනා නොවෙයි.

ධාරානිපාත වර්ෂාවක් ඇතිවීමට ගතවූයේ ඉතා සුලු මොහොතයි, සුගන්දිකාගේ මිනිය වැස්සෙන් තෙමෙන්න විය ,ඒත් සමගම මිනිය ටිකක් ගැස්සෙන්න විය.

"අයියේ මට බයයි."

හිරුත් සුබාත් ක්‍රිෂාන් ගේ අත් දෙකෙන් දෙපැත්තෙන් අල්ලා ගනිමිනි.

ඒ සමගම ධාරානිපාත වර්ෂාව නතර වී දැඩි හිරු රශ්මියක් මිනිය මතට වැටෙන්න විය. එහි දීප්තිය දෑස් වලට දරා ගැනීමට නොහැකි නිසා සියල්ලෝම දෑස් වසා ගත්තෝය .ඒ එක්කම දැඩි සුලගක් හමා යන්න විය.මද වේලාවකින් සියල්ලම නිශ්චල වූ පසු සියල්ලෝම දෑස් විවර කලෝය.පුදුමයකි සුගන්දිකා ගල් පෙට්ටිය මත වාඩි වී සිටියාය. සියල්ලොගේම දෑස් වල සතුටු කඳුලුය සුගන්දිකා පෙට්ටිය මත හිඳගෙන සිටියේ හැගීම් විරහිතවය.

ක්‍රිෂාන් දෙස බැලූ සුගන්දිකා.

"ක්‍රිෂ්නා. "

මේ ඔයාද ඇය ඇගේ මිහිරි කටහඬෙන් විමසුවාය.

"ඔව් කුමරිය මම ක්‍රිෂ්නා ඒත් මගෙ දැන් නම ක්‍රිෂාන්. "

"ක්‍රිෂාන් ,මට මොකක්ද මේ උනේ පිය රජතුමා තව කොච්චර කාලයක් මාව මේ විදිහට හිරකරල තියනවද? "

"සුගන්දි දැන් පිය රජ කෙනෙක් නැහැ. බොහෝ කල් ගතවෙලා. අවුරුදු දහස් ගනනක් දැන් මේ දෙදහස් දා හත වර්ෂය. "

Author
KUSHAN HETTIARACHCHI

"එහෙම උනේ කොහොමද? හසරැල් මිනාක්ශි බෝධි රවිනි මේ අය ඇයි මාව අඳුරන්නෙ නෑ වගේ ඉන්නෙ? "

ඇය පැවසුවේ පුදුමයෙන් මෙන් ඇය දෙස බලන් සිටිනා යහලුවන් දෙස බලමිනි.

"ඒ අයගෙ මතකය ගිලිහිලා කුමරිය අපි මැරෙමින් ඉපදෙමින් ආත්ම කීයක් ගත කරන්න ඇත්ද? "

සියලුම දෙනා සුගන්දිකා වෙත ලං උනෝය.

"ඔයාගේ මතකය රැඳුනේ කොහොමද ක්‍රිෂ්නා? "

"ඒ අප අතර තිබුන බැඳීම කුමරිය, අවුරුදු 21දි ඔබව පිය රජ මේ ගුහාව තුල සිර කරද්දි මම ඔබේ පෙම්වතා ඒ ආදරය මට ආත්ම දහසක් ගියත් අමතක වෙන්නේ නෑ. "

"ඔහ්හ් ක්‍රිෂ්නා ඔබනම් කදිම පෙම්වතෙක්. "

කුමරිය ක්‍රිෂාන්ගේ අත අල්ලමින් පැවසුවාය.

මේ මිනාක්ශි නෙවෙයි දැන් ඇගේ නම නිමේෂා. මේ බෝධි නෙවෙයි සුබෝධා. මේ හසරැල් නම් හසරැල් ම තමයි. මේ රවිනි දැන් හිරූ.සියලු දෙනා කුමරියගේ සුරතින් අල්ලගෙන සිටියෝය.

"අපි මේ ගුහාවෙන් එලියට යා යුතුයි එන්න මා සමග. "

සුගන්දිකා ඉස්සර උනාය. ඇය බිත්තියේ යම් තැනක ඇඟිල්ලෙන් ඉරි කීපයක් ඇන්දාය.ගල් බිත්තිය අතරින් දොරක් මතු විය. එයින් සියල්ලෝම එලියට ආවෝය.




එළියට ආපසු අපට දිස්වූ හැටි.

එළියේ සිරි නැරඹූ පිරිසට තේරුනේ තමන් වෙනත් ස්ථානයකට පැමිණ ඇති බව ය.

මේ අතර සුගන්ධි කතාව ඇරඹුවාය.

"ඔයාලා මේ ඇවිත් තියෙන්නේ පෘථිවිය වගේම වෙනත් ලෝකයකට. දෙව්ලොවටත් අපායටත් පිවිසුම් දොරටු තියෙන්නෙ මේ ලෝකයේ.අපි දැන් සතුටේ සුරංගනාවිය මුණගැහෙන්න යන්න ඕන. ඒ වෙන මොනවත් නිසා නෙමෙයි මට සදාකාලික ජීවිතය ලබා ගන්න. මේ විදියට හිටියොත් මට පැය විසිහතරකට වඩා ජීවත් වෙන්න බැහැ. ඒ

තරම් සුළු කාලයක් මට ජීවත්වෙන්න තියෙන්නේ.

" සදාකාලික ජීවනය."

ක්‍රිෂාන් පුදුමයෙන් ඇසීය.

"සදාකාලික ජීවනය කියන්නේ මගේ ජීවත් විය යුතු කාලය, මට ජීවත් වෙන්න ඕන. අවුරුදු පනහක් හැටක් හැත්තෑවක් මට හිමි ජීවිත කාලෙම ජීවත්වෙලා මිය යන්න ඕන. කලින් මම අකාලයේ මියගිය තරුණියක්. "

"සුරංගනාවියන් ඉන්නවා කියන්නේ ඇත්තද?"

එසේ ඇසුවේ පිංකි ය.

ඔහු මීනාක්ශි සුරංගනාවියෝ ඉන්නව. අපි හැමෝම යමුකෝ සුරංගනාවි මුණ ගැසෙන්න මොවුන් ඇවිද ගිය පරිසරයේ විශාල බෝල ගල් තිබූ ඓතිහාසික ප්‍රදේශවල සිරියක් ඉසිලීය.

"ඔයාලට බය හිතුනේ නැද්ද මිනියකට පණ දෙද්දී."

සුගන්ධි ඇසුවේ පිරිස දෙස බලමිනි.

"අපිට නම් ටිකක් බය හිතුනා ඒත් ඒ අයියට නම් බය හිතෙච්චි ගතියක් පෙනුනේ නෑ."




විශාල බෝල ගල් තිබූ ඓතිහාසික ප්‍රදේශවල සිරියක් ඉසිලීය

"ඒක නෙවෙයි ක්‍රිෂ්නා ඔයාට කොහොමද අතීතය මතක් උනේ."

සුගන්ධි ක්‍රිෂාන් ගෙන් ඇසුවේ ආදරණීය විදිහටය.

"මට ඒක මතක් උනේ අර පොකුණ ඇතුලෙ කිමිදුන වෙලාවෙ."

"ඔයා මම ගාවට ආවා වගේ දැක්කා. ඒ එක්කම මට විදුලි සැරක් වැදුණා වගේ දැණුනා. ඒ එක්කම මට මේ ආත්මෙ අයිති නැති දෙයක් මගේ මනසට ඇතුල් වෙනවා වගේ දැනුනා. ඒත් එක්කම මට

ආගන්තුක දැනුමක් ලැබෙනවා තේරුනා. ඒ දැනුමෙන් තමයි හැමදේම හොයා ගෙන ආවේ. "

ක්‍රිෂාන් පවසද්දී අනිත් සියල්ලෝම මුහුණට මුහුණ බලා ගත්තෝය.

"මාරයි නේ බං මාර ලව් ස්ටෝරි එක."

සුභා පිංකිට කීවේ ටිකක් දුකට පත් වූ හඬිනි.

"අපි ඒක තමා උඹට කිව්වේ වැඩි බලාපොරොත්තු තියා ගන්න එපා කියලා."

එසේ කීවේ හිරු ය.

"කවුද බං දන්නේ මිනියක් නැගිටලා අවුරුදු දාහස් ගණනක් පරණ ලව් එකක් පටන් ගනී කියලා."

එසේ පැවසුවේ සුභාය.

"හිත හදාගන්නවා ආදරය කියන්නේ අයිති කරගන්න දෙයක් නෙමේ අත හරින දෙයක් කියල තියෙනවනෙ."

සුබා කතා කරන්නේ හුඟක් හිත රිදීමෙන් බව පිංකිටත් හිරුටත් මනාව වැටහු නි.

"උඹ ඕව ගණන් ගන්න එපා, හිමි කමක් තියෙනවා නම් නො ලැබී තියෙන්නේ නෑ. අනික

සුගන්දිකා කියන්නේ අවුරුදු දහස් ගානකට කලින් ජීවත් වෙච්ච කෙනෙක් ,එයා දැන් කාලෙට කොච්චර ගැලපෙනවාද නැද්ද කියන එක ක්‍රිෂාන් තීරණය කරයි. "

"නෑ බං මට බලෙන් කිසිම දෙයක් අවශ්‍ය නෑ. එයාට එහෙම හොඳයි නම් මට කමක් නෑ. අනික එයා අහම්බෙන් හම්බ වෙච්චි කෙනෙක්, එතනින් එහා මේ ගැන කතා කරන්න ඕන නෑ. එයාට දැන් සුගන්ධිකා හැර වෙන සිහියක් නෑ. එයා පෙර ආත්මෙ ආදරයක් හොයාගෙන අපිව මතකත් නෑ .කමක් නෑ අපි බලමු මොකද වෙන්නේ කියලා."

ඔවුන් ඇවිදිමින් ගියේ ගල් තලාවක් කිට්ටුවට එකවරම පිටුපස හැරුණු සුගන්ධිකා.

"යාලුවනේ අපි මෙන්න මේ ගල් කන්ද නගින්න ඕන. මේ ගල් කන්දෙන් එහා පැත්තේ තමයි සතුටේ සුරන්ගංගනාවිය ඉන්න එයාගේ මාලිගාව තියෙන්නේ. එයා ගාවට ගියාම අපේ සියළු ප්‍රශ්න විසඳෙනවා."

ඔවුන් එම ගල් කන්ද තරණය කරන්නට පටන් ගත්තෝය.




ඔවුන් එම ගල් කන්ද තරණය කරන්නට පටන් ගත්තෝය.

ගල් කන්ද තරණය කර පල්ලෙහාට බැස්ස ඔවුන්ට දක්නට ලැබුණේ මනරම් වෙල්යායකි.

" කවුද මේ ගොවිතැන් කරන්නේ? "

ක්‍රිෂාන් ඇසුවේ සුගන්ධිකාගෙනි.

මෙහි ගොවිතැන් කරන්න ඉන්නේ කොහොඹයෝ කියලා කට්ටියක්. එයාලා තමා ගොවිතැන් කටයුතු සියලුම දේ කරන්නෙ. දැන් නම් කරල් කපපු කාලය. ඒ නිසයි මේ පිට්ටනියක් වගේ ඔයාලට පේන්න තියෙන්නේ. නැත්නම් සතුටේ

සුරංගනාවියගේ මාලිගාව වටේ රන්වන් කරලින් බර වුණු ගොයම් ගස් දැකීම සාමාන්‍ය දෙයක්. ඔවුන් ඉදිරියේ පෙනෙන්නට තිබුණේ ගල් වලින් සාදන ලද මාළිගාවක් වැනි ස්ථානයකි. එය වටේ කැලෑ වැවී තිබූ අතර ඒ මත විශාල ගහක් දෙකක් සැදී තිබුණේ තවද වෙල් යායක් මැද ලස්සන තැනක පිහිටා තිබුණි.




ඔවුන් ඉදිරියේ පෙනෙන්නට තිබුණේ ගල් වලින් සාදන ලද මාළිගාවක් වැනි ස්ථානයකි.

අරකද සුරංගනාවිගෙ මාලිගාව. හසරැල් විමසුවේ සුගන්ධිකා දෙස බලාගෙනය.

"ඔව් ඒක තමා සුරංගනාවිගෙ මාලිගාව. ඒ වුනාට දැන් නම් ඒක ජරාවාස වෙලා වගේ. කවුරුත් ඉන්න බවක් පේන්නෙත් නෑ. සුගන්ධිකා කීවේ විමසිලිමත්ව ඒ දෙස බලමිනි."

"සුගන්ධිකා ඔයා ඔය කියන්නේ අවුරුදු දහස් ගණනක්ට කලින් හිටපු කෙනෙක් ගැන ද?"

එසේ ඇසුවේ සුබා ය.

" මම මියදෙන්න කලින් එයා හිටියේ මේ ගල් මාලිගාව ඇතුලෙ තමා, එයා එක්ක තව සුරංගනාවියො ගොඩක් හිටියා. මං මෙහේ හිර කරාට පස්සේ මම ජීවත්වුණේ එයාලත් එක්ක. පිය රජතුමා වත් මව් රැජින වත් මාලිගාවේ කිසිදු කෙනෙක් වත් මාව බලන්න ආවේ නෑ. ක්‍රිෂ්ණාට මාව මෙහි හිර කළාට පසු එන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒ තරම් රහසිගතවයි මාව සිරකරේ. මම දන්නවා ඔයාලා හැමෝම මාව නැතිවුණ දුකින් හිටියා කියලා. මට ඒ හැමදේම කිව්වෙ චිත්‍ර බාහු කියලා මාගේ ආරක්ෂාවට හිටපු මුර සෙබලා. "

"ඔයාව නැගිට්ටවන්න කලින් අපිට එයාව හම්බවුණා."

ක්‍රිෂාන් කීවේය.

"මොනවා එයා කොහෙදිද හම්බුනේ?"

" අර ගුහාව ඇතුලේ ඔයාගේ සිරුර තැන්පත් කරලා තිබුණු තැන එයා ඉඳගෙන හිටියේ."

"මෙච්චර කාලයක්."

"නෑ එයා මැරිලා හුඟක් කල්, ඒත් එයාගේ ඇට සැකිල්ල අපිත් එක්ක කතා කළා."

"ඔයාට පණ දෙන රහස එයා කියපු ගමන් ඒ ඇටසැකිල්ල සුනු විසුනු වෙලා ගියා. අවුරුදු දහස් ගණනක් ගතවෙලා ඒක තමයි මේ කොහෙවත් කවුරුත් පේන්න නැත්තේ."

Author
KUSHAN HETTIARACHCHI

ක්‍රිෂාන් කියද්දි..

"ඒ කියන්නේ මේක මුඩු බිමක් දැන්."

සුගන්ධිකා කතා කළේ ශෝකී ස්වභාවයකිනි.

"ඒ උනාට සුගන්ධිකා සතුටේ සුරංගනාවිය හමුවුණාම අපිට මේ වෙනස මොකක්ද කියලා දැන්ගන්න පුලුවන් වෙයි නේද?"

ඔවුන් සියලු දෙනා ගල් මාළිගාව තුළට ඇතුළු වුනහ.

හැම තැනම ජරා වාස වෙලා.

ඔවුන් ඇතුලට ගිය පසු ඔවුන්ට දිස්වූයේ විශාල ශාලාවකි. එහි එක් පසෙකට වන්න ගල් වලින් සෑදූ ආසනයක්බඳු තැනක් දක්නට ලැබුණි. හරියට එය පිරිසක් සාකච්ඡා කිරීම් සඳහා යොදා ගත් තැනක් වගේය. එහි ගල් බිත්තියේ දොරක උළුවස්සක් මෙන් කැටයමක් තබා තිබුණි. සුබා එය අතගා බැලුවේ දොරක්ද යැයි සැක හැර දැනගැනීමට ය.




පසෙකට වන්න ගල් වලින් සෑදූ ආසනයක්බඳු තැනක් දක්නට ලැබුණි.

ඒ දොරක් නොවන බව තේරුණු පසු ඇය එතනම වාඩි වුණාය. ඒ අතර සුගන්ධිකා පිංකි ගෙන් විමසුවේ.

"ඔයා ලඟ තියන පිත්තල පීරිසියයි තෙල් බෝතලෙයි මගේ අතට දැන් දෙන්න. ඇත්තම කියනවනම් ඔයාල මේක පාවිච්චි කරන්න දන්නේ නෑ"

ඇය පිත්තල පීරිසිය බිමින් තැබුවාය. සහ තෙල් බින්දු දෙකක් නළල දෙපැත්තේ ගාගෙන තවත් තෙල් බිංදු කිහිපයක් එහි පහන වගේ තැනට දමා එය අමුතුම ක්‍රමයකටයකට දැල්වූවාය. ඉන්පසු අවට ඒකාලෝක වී තිරයක් වගේ මැවුණු පටලයකින් විවිධ දේ පෙනෙන්න පටන් ගති. ඉන්පසු ඔවුන්ට පෙනුණේ වාඩිවී සිටින සුන්දර ගැහැණු ළමයෙකි. ඒ දුටු ගමන් සුගන්ධිකා පැවසුවේ.

"ඒ තමයි සතුටේ සුරංගනාවි. ඒ තමයි මගෙ යාලුව ."

ඇය එසේ පැවසුවේ ඉතා සතු සතුටිනි.

"ඉතින් එයාව එලියට ගන්නෙ කොහොමද?" ක්‍රිෂාන් ඇසුවේ නොඉවසිලිමත්වය.

sinhalaebooks.com

"සුලු දෙයයි කරන්න තියෙන්නෙ ගන්න ඔයා ලඟතියන මන්තර පොත නිමේෂා. "

සුගන්දිකා තම සුරත දිගුකරේ පිංකි දෙසටය. පිංකි එය සුගන්දි අතට දුන්නෙ ඉල්ලන පමාවෙනි.

ඉන්පසු සුගන්දිකා එහි එක පිටුවක් පෙරලා ඇස් මට්ටමෙන් තබාගෙන සතුටේ සුරංගනාවිය පෙනෙන තිරය දෙස බලා මන්තරයක් මතුරන්න වූවාය .මද වේලාවකින් එක මොහොතකට මුලු ගුහාවම අඳුරු විය .

"බයවෙන්න එපා මේ මන්තරය මතුරද්දි ඉර කවුළු වැසෙනව." ගුහාව අඳුරුවූ පසු සුගන්දිකා පැවසුවාය."මම හරියටම තව මිනිත්තුවකින් ඊලඟ මන්තරය ජප කරණව. එතකොට ඉර කවුළු ආයේ හැරෙනව. එතකොට සතුටේ සුරංගනව අපි ඉදිරියේ හිඳියි.හැබැයි මම මතුරද්දි දකින දේවල් ගනන් ගන්න එපා. බය වෙන්නත් එපා ඒ දේවල් දුෂ්ඨ මායාවන් විතරයි. "

පවසා ඇය යලි මතුරන්න විය. නිමේෂයකින් ජප කිරීමේ උච්චතම අවසථාවට පැමිණි පසු ඔවුන් ඉදිරියේ භයානක රූප මැවෙන්න විය. ඇවිදින ඇටසැකිලි විකාර රූපි සතුන්. සුබා සහ හිරූ ක්‍රිෂාන් ගේ අත් දෙකෙන් දැඩිව අල්ලා ගත් අතර

පිංකී සුබාගේ අතද හසරැල් පිංකිව දැඩිව වැලඳගෙනද සිටියෝය. මද වේලාවකින් සුගන්දිකා ගේ මැතිරිල්ල අවසාන විය. ඒ එක්කම හිරු කවුලු හැරෙන්න විය .ගුහාව ඒකාලෝක වන විට ඔවුන් ඉදිරියේ සතුටේ සුරංගනාවිය ඔවුන් ඉදිරියේ ජීවමානව වැඩ උන්නාය.පිරිස තුශ්නීම්භූතව ඒ දෙස බලා සිටිද්දි සුගන්දිකා පියවරක් ඉදිරියට තබා සුරංගනාවියට ලං උනාය .

"සුගන්දිකා කුමරිය බෝහෝ කලකට පසු මාව කැඳවූයේ මන්ද? " සුරංගනාවිය මිහිරි හඬින් විමසුවාය.

"සතුටේ සුරංගනාවිය අප නොදැනුවත්ව බොහෝ කලක් ගතවී තිබේ, මා මියගොස් අවුරුදු දහස් ගණනකි. මට මාගේ සම්පූරණ ජීවිතකාලය ජීවත් විය යුතුයි ."

"ඒ සඳහා සුර ලොවට යා යුතුයි කුමරිය,මේ ඔබගේ යහලුවන්ද?" කුමරිය සුරංගනාවිය මිතුරන් දෙස බලමින් විමසුවාය. සුගන්දිකා ඔවුන් එකිනෙකාව ඇයට හඳුන්වා දුන්නාය. ඉන්පසු සුරංගනාවියම තමාව හදුන්වා දුන්නාය.

"මම අප්සරා මම තමයි සතුටේ සුරංගනාවිය මට පුලුවන් ඔය හැමෝගෙම සිත් සතුටින් පුරවන්න. "

"වාව් ඒකනම් නියමයි. "

සුබා පැවසුවේ සතුටිනි. ඉන් පසු සියලු දෙනාම ගල් මාලිගාවෙන් එලියට පැමිණ එලිමහනේ වාඩිවූහ .

"ඔයාලා කැමතිද? තරු අතරින් දෙවිවරු දිව්‍යාංගනාවෝ ඉන්න සුරංගනා ලෝකයට යන්න."

"ඔව් අපි කැමතියි. "

සියල්ලෝම එකවර පැවසුහ.

"ඒත් ප්‍රශ්නයක් තියනව. ආන්න අර ඈත පේන කඳු මුදුනට අපි යන්න වෙනවා. හැබැයි සුරංගනා ලෝකෙට යන්න කලින් අපි නිරයට ගිහින් එන්න වෙනව. ඒක දුෂ්කර ගමනක් කට්ටිය යම රජ්ජුරුවෝ එහෙම මුණ ගැසෙන්න කැමති ඇති නේද ?"

"පණ පිටින් අපායට යන්න "ක්‍රිෂාන් විමතියෙන් විමසද්දී ..




Author
KUSHAN HETTIARACHCHI

ආන්න අර ඈත පේන කඳු මුදුනට අපි යන්න වෙනවා.

"ඔව් ඔයාලට කිසි කරදරයක් වෙන්නෙ නෑ යම රජ්ජුරුවන්ගේ මාලිගාවට ගිහින් තමයි අපිට අවසර ගන්න වෙන්නෙ, සුර ලොව යන්න. ඒ වගේම සුගන්දිකා කුමරියගෙ අමරණීයත්වය වෙනුවෙන් ."

"මොකද කියන්නෙ කට්ටිය මේක කිසිම මිනිසෙකුට නොලැබෙන චාන්ස් එකක් අපි යමු නේද? "

පිරිස දෙස බැලූ ක්‍රිෂාන් විමසීය.

"අපි කැමතියි. "

සියල්ලෝම එක හඬින් පැවසූහ. මේ වන විට හිරුගේ බියගුලු ස්වභාවය බොහෝ සේ ඈත් වී තිබුනි.

"ඒත් මටනම දැන් බඩගිනියි හුගක්.

"ක්‍රිෂාන් පිරිස දෙස බලමින් පැවසීය."

"සුලු දෙයක් ඔයාල කන්න කැමති මොනවද? මම නම් කන්නෙ පලතුරු විතරයි අප්සරා පැවසුවාය."

"රස පලතුරු වලට අපිත් කැමතියි."

ඒ සුබාය.

අප්සරා ඇයගෙ මන්ත්‍ර බලයෙන් විශාල පළසක් සහ ඒ මත විවිධ පළතුරු මැවුවාය .සියලු දෙන කුස පිරෙන කම් පලතුරු කෑවෝය .

"ඔයාගෙ පලතුරු රසයි සුරංගනාවි. "

එසේ කීවේ ක්‍රිෂානුයි.

KUSHAN HETTIARACHCHI

"මට සුරංගනාවි කියන්න එපා අප්සරා කියන්න ඒක නෙමෙයි යාලුවනේ අපි යමුද? "

"පයින් යන්න ගියාම එපා වෙන්නෙ නැද්ද? " ඒ හසරැල් ය.

"මෙන්න මේ බෝතලෙන් උගුර උගුර බොන්න. ඔයාලට මහන්සි දැනෙන එකක් නෑ "

අප්සරා වතුර බෝතලයක් මවා යහලුවන් පස් දෙනාට බොන්න දුන්නාය .

"දැන් යමු ඉතින් කට්ටිය මේ ගමන හුගක් අමාරු ගමනක් අනවශ්‍ය දේවල් අපි මගෙ මාළිගාවෙන් තියල යමු නේද? "

අප්සරා විමසූ දෙයට හැමෝම අනුමත කලෝය. ඒ අනුව ඉතිරිවී තිබූ සියලුම කෑම වර්ග අප්සරා ගේ මාලිගයෙන් තැබූ ඔවුන් තම ගමන් මළු සැහැල්ලු කර ගත්තෝය .ඔවුන් ගමනට සූදානම් වන විට හවස් වී තිබිණි.

"අපි හවස් වෙලා යන එක කමක් නැද්ද? රෑ ගමන් අනතුරු නැද්ද?"

ක්‍රිෂාන් සුරංගනාවිය ගෙන් විමසුවේය.

" මේ ගමන රෑ යන තරම්ට හොඳයි එතකොට අපට රස්නය දැනෙනවා අඩුයි .ඔයාලට රෑ යනකොට තව අමුතු දෙයක් මට පෙන්නන්න පුළුවන්"

ඒ මොකක්ද අප්සරා?

"මේ ලෝකේ හද පායන්න වෙනස්ම විදිහකට තව ටිකකින් හද පායනවා. එතකොට බලාගමුකෝ."

සියලු දෙනාම කදු මුදුන කරා යාමට ගමන් ඇරඹුවෝය. ඔවුන් වෙල් ඉපනැල්ල දිගේ ගමන් කරමින් ඉදිරියට ඇදෙද්දී සුගන්දි සහ අප්සරා මේ ලෝකය ගැන බොහෝ තොරතුරු යහලුවන්ට පැවසුවෝය .මේ ලෝකය සොයාගෙන තිබුනේ රාවණ රජුගෙන් පසුව රජ වුන විභීෂණ රජගෙනුත් පසුව රජ වූ චිත්‍රාරම්බන නම් රජෙකුගේ කාලයේය. සුගන්දිකා යනු ඒ රජගේ දූ කුමරියයි මේ සමය රාවණ රජගේ ගුප්ත බල මන්තර බල නිශේදනය වූ කාලයකි විභීශණ රජ යන්ත්‍ර මන්ත්‍ර ගැන උනන්දුවක් දැක්වූ රජෙකු නොවේ ඒ නිසාම ඔහුගේ ඇවෑමෙන් රජකමට පත් වූ ඔහුගේ නැගනියගේ පුතේකු වූ චිත්‍රාරම්බන කුමරු රජවෙන විට යන්ත්‍ර මන්ත්‍ර ගැන දැනුම තිබූ විද්වත්තු හීනව පැවතින.

බුද්ධිඝෝෂ නම් එක් ඇදුරුතුමෙක් රාවණ යුගයේ සිට පැවති ගුප්ත ශාස්ත්‍ර යම් පමණක් පරම්පරාවේ උරුමයක් ලෙස ඉදිරියට රැගෙන ආවේය. මේ පෘථිවිය මත වූ වෙනත් ලෝකය ඔහු සොයා ගත්තේ ඒ පොත් පරිශීලනය කිරීමෙනි.ඇත්තවශයෙන්ම මේ ලෝකය මුලින්ම සොයා ගනු ලැබුවේ රාවණ නම් තුන් ලොව රජ කල ඒ මහා නරපතියායි.ඔහු නිරයටත් දෙව්ලොවටත් ගමන් කිරීමට මෙම ලෝකයේ පිහිටි දොරවල් උපයෝගී කර ගත්තේය .ඔහුගේ මරණයෙන් පසු මේ ලොවට පිවිසෙන දොරටු සියල්ලම සදහටම වසා දමන ලදී. ඔබ මෙතෙක් මේ ලොව දුටු සියලුම ගොඩ නැගිලි රාවණ සමයේ නිර්මාණය කර චිත්‍රාරම්බන රජ කාලයේ ප්‍රතිසංස්කරණය කල ඒවාය .රාවණ නම් රජ ජීවත් උනේ දැනට අවුරුදු පන්දහසකට පමණ පෙර වූ අතර ලංකාවේ ඉතාමත් ඈත අතීතයේ විසූ සක්විති රජෙකි .ඔහුගේ මරණය සිදු වූයේ රාම රාවණා සටනෙනි .ඔහුගේ මරණයෙන් පසු මේ ලොවට පිවිසුම් දොරටු වසා දැමුනත් බුද්ධිඝෝෂ ඇදුරු තුමා පසු කලෙක මේ දොරටු විවර කරන්නේ .චිත්‍රාරම්බන රජ ගේ දියණිය සුගන්ධිකා සිරකොට තැබීම සඳහාය. එම ශාප ලත් කුමරිය මෙහි සිරකරලූවේ රජතුමාට තිබූ

ශාපයක් ඉවත් කිරීමටය .ඒ වන විටත් ඇය උත්තර භාරතයේ රාම සමග මෙහි පැමිණි පරපුරකින් පැවතෙන තරුණයෙක් වූ ක්‍රිෂ්නා සමග පෙමින් වෙලී සිටියාය. මේ ගැන දැන සිටියේ ක්‍රිෂ්නා ගේ මලණුවන් වූ හසරැල් සහ යහලුවන් වූ මිනාක්ශි බෝදි සහ රවිනියි.අවුරුදු දහස් ගනනකට පසු ඔවුන් යලිත් ඉපදී මේ ගමනට එක්වීඇත්තේ.ක්‍රිෂාන්,හසරැල්,නිමේෂා,සුබෝදා, හිරුණි ලෙසයි ,අප්සරා මේ සියලුමදේ පවසන විට ඔවුන් කන්ද පාමුලට පැමිණ සිටියේ නොදැනුවත්වමයි. අඳුර වැටෙන්න කිට්ටු වීතිබූ නිසා ඔවුන් එදින රෑ කඳු පාමුල ගතකිරීමට තීරණය කලෝය .

"කට්ටියම එන්න මම ඔයාලට දෙයක් පෙන්නන්න බලන්න අර අහස දිහා "එසේ පැවසුවේ අප්සරාය. සියල්ලෝම අහස දෙස බැලූහ අහසේ හඳ පායා තිබිනි .

"කොහොමද ඔයාලට වෙනසක් පේනවද? "

"මටනම් පේන්නෙ නිකන් නිල් පාට ගතිය වැඩියි වගේ. "

සුබා එසේ පවසද්දී..

"ඒකත් එකක් තමයි සුබා එත් තවදෙයක් තියනව. "




"හඳ අනිත් පැත්ත හැරිල වගේ නේද? "

KUSHAN HETTIARACHCHI

හසරැල් එක පාරටම පැවසූ විටයි හැමෝටම එය වැටහුනේ .



"ඔවුම නේන්නම්. "

සැමෝම මුහුනෙන් මුහුණ බලා ගනිද්දි සුගන්දිකා කටහඬ අවදි කලාය.

"ඔයාලට මතකද ඔයාල ගුහාවට එන්න පොකුණෙන් ඇතුලට එද්දි වෙලාවෙ වෙනසක් උනා ."

"ඔව් "

ක්‍රිෂාන් පිළිතුරු දුන්නා.

"ඒ හේතුවේම ප්‍රතිඵලයක් තමයි ඕකත්. "

"ඒ කියන්නෙ අංශක 180 ක වෙනසක් ද ?"

"ඔව් ඔයාලගෙ ලෝකේ පිහිටීමට වඩා මේක වෙනස්. "

ඔවුන් රාත්‍රී ආහාරයට ගත්තේ අප්සරා සකස් කර දුන් අල වර්ගයකි. එය ප්‍රනීත රසයෙන් යුක්ත විය .

"ළමායි අපි දැන් නිදාගමු නේද? හෙට උදේම කන්ද නගින්නත් තියනව නේ. "

ඒ අප්සරාය, සුරංගනාවියක් උනත් ඇය දැන් යහලුවන් පස් දෙනාට බොහෝ සේ එකතු වී උන්නාය .

නින්දේ සිටි ක්‍රිෂාන් ගැස්සී අවදි වූයේ අස්සයකු ගමන් කරණවා වැනි හඬකිනි. එවිට පාන්දර හිරු එලිය යන්තමට වැටෙමින් දිබුනි. ඔහු දුටු දෙයින් ඔහුගේ ඇස් අදහා ගැනීමට නොහැකි විය .ඔහු දුටුවේ විශාල කූඹියෙකි. ඔහු තම ලඟ උන් හසරැල්ව ඇහැරෙව්වේ ඔහුගේ කට අතින් වසාගෙනය.

ඔහු හසරැල් ට කූඹියා ව පෙන්නුවේය.




ඔහු දුටුවේ විශාල කූඹියෙකි.

"අයියේ මොකෙක්ද ඒ? "

හසරැල් විමසුවේ රහසිනි .

"බය වෙන්න එපා ඒ අහිංසක සතෙක්. ඔය ඉන්නේ කුඹියෙක්ම තමයි. එයාගෙන් කාටවත් හානියක් නෑ" එසේ පැවසුවේ  පිටුපසින් සිටි අප්සරාය.

"මෙච්චර ලොකු එකෙක්? "

ක්‍රිෂාන් අසද්දී.

"අපි කන්ද උඩට යද්දි තව ඉදියි මම පෙන්නන්නම් කො. "

මේ වන විට සුගන්දිකා සමග අනිත් ගැහැනු ළමුන් තුන් දෙනාද එතනට පැමින සිටියෝය.

"අපි ඉක්මනට යන්න ලෑස්ති වෙමු නේද? ඉක්මනට යන තරමට ගමන  ඉක්මන් "

අප්සරා එසේ කියමින් යාමට ලෑස්ති වුණාය. ඔවුන් උදෑසන මුහුණ කට දොවා ගත්තේ අසල තිබූ පොකුණකිනි. ඔවුන් උදේට කෑවේ පලතුරුය. ඔවුන් ගමන අරඹන විට උදෑසන  7.30 පමණ වී තිබුණි. ඔවුන් ගමන් ගත්තේ ලස්සනට මල් පිපී

කළුම් තාරකාවී
Author
KUSHAN HETTIARACHCHI

ගස් කොළන් සැදී වනසතුන් සිටී ලස්සන භූමි ප්‍රදේශයකිනි .




මල් පිපී ගස් කොළන් සැදී වනසතුන් සිටී ලස්සන භූමි ප්‍රදේශයකිනි.

අප්සරා එක වරම සියල්ලන්ටම පෙන්නුවේ කඳු මුදුන මත සිටි විශාල කුඹියෙකි .

"ඒකා අස්සයෙක් ටත් වඩා ලොකුයි නේ. "

ඒ පිංකිය හිරු සහ සුබා නම් ටිකක් බියවූ සෙයක් පෙනුනි.




ඒකා අස්සයෙක් ටත් වඩා ලොකුයි නේ.

ඔවුන් ඒ ලස්සන තුරුලතා අතරින් කඳු මුදුන්ටම පැමිණියෝය. ටිකක් දුර ගිය පසු එක්තරා ගල් ගුහාවක් වැනි විවරයකින් ඔවුන් ඇතුලට ගියෝය. අප්සරා පෙරමුණ ගෙන සිටි අතර සුගන්ධිකා යහළුවන් සමඟ ම සිටියාය.

"අපි මේ කොහාට ද ආවේ?"

ක්‍රිෂාන් වටපිට බලමින් සුගන්දිකා ගෙන් විමසුවාය.

"ක්‍රිෂාන් මේ තමයි අපායට යන දොරටුව ඔයාට මේ පරිසරයේ වෙනස පේන්නෙ නැද්ද ?" එසේ ඇසුවේ අප්සරාය.

"ඔව් මට පේනවා අමුතු රතුපාටක්. ඒත් මොකද්ද අතන රිදී පාට එළියක් පේන්නේ?"

"එතනින් තමයි ඇතුලට බහින්න ඕන."

" අර මොනවද ඇටසැකිලි තියෙන්නේ?"

" ඔය වැරදි කරපු මිනිස්සුන්ගේ ඇටසැකිලි ඒ ගැන හිතන්න එපා."




ඔය වැරදි කරපු මිනිස්සුන්ගේ ඇටසැකිලි.

ඔවුන් සියලුදෙනා ඇට සැකිලි පසු කොට රිදී ආලෝකය වෙතට ගියෝය.

"දැන් අපි හත් දෙනාම අත්වලින් අල්ල ගන්න ඕන."

අප්සරා පැවසුවාය.

ඒ අනුව ඔවුන්  රිදී ආලෝකය වටා වට වී ආලෝකය කරා කිට්ටු උනෝය.

ඔවුන්ට තේරුනේ පාතාලයට ගිලා බහිනවා වගේය. ඔවුන් හත් දෙනා වැටුනේ පිට්ටනියකටය. එහි අඳුරින් වැසී තිබුනි කිසිම පාටක් පැහැදිලිව නොපෙනුනි.

."මේ අපායද අප්සරා?"

ක්‍රිෂාන් විමසද්දී..

"ඔව් ක්‍රිෂාන් මේ අපායේ පිවිසුම. අපට යම රජගේ මාලිගය ටිකක් දුර තියෙන්නෙ? "

"අපි ආපසු යන්නෙ කොහොමද? "

සුබා විමසුවාය.

"අපිට පිටවීමට දොරක් තියනව සුබා, යම රජ මුණගැසුනාම අපිට තරු අතරට යන පාර විවර වෙනවා. “

අප්සරා පවසත්ම.

"මරුනෙ එහෙනම් ඇත්තටම කිසිම මනුස්සයෙක්ට නොලැබෙන චාන්ස් එකක් අපට ලැබිල තියෙන්නෙ. "

එසේ පැවසුවේ පිංකිය.

"මොකද මේ හැම තැනම ඇටකටු කෑලි? "

හිරු විමසුවේ  පිට්ටනිය පුරා විසිරී තිබූ ඇටකටු හිස්කබල් පෙන්නමිනි.




ඔය පව් කරල අපායට ඇදන් ආපු අය දස වද දීල මරල දාලා.

"ඔය පව් කරල අපායට ඇදන් ආපු අය දස වද දීල මරල දාලා. "

ඔවුන්  ඉදිරියට එනම් ඇතින් පෙනෙන කඳුකරය දෙසට ගමන් කරන්න විය .සෑහෙන දුරක් ගිය පසු ඔවිනට හමු වූයේ යම රජගේ මාලිගාවට පිවිසෙන දොරටුවයි. එය විශාල මිනිස් හිස්කබලක කටක් තුලින් ඇතුලුවන ලෙස සාදා තිබිනි .ඇටසැකිලි දෙකක් දොර දෙපස ඉඳගෙන සිටියෝය. දකින්න බිය සිතෙන දසුනකි. දොර අසල පතොක් වැනි කටු සහිත ශාක සහ පඳුරු බහුලව තිබිනි.




*මිනිස් හිස්කබලක කටක් තුලින් ඇතුලුවන ලෙස සාදා තිබිනි.*

"කවුරුත් ගැවසෙන තැනක් නෙමෙයි වගේ නේද?"

ක්‍රිෂාන් පැවසුවේ තවමත් ඔහුගේ අතේ එල්ලී සිටින සුබා දෙස බලා ය.

එයට පිළිතුරු දුන්නෙ අනෙත් පස සිටි සුගන්දිකාය.

"අපාය ඔහොම තමයි සුබා මූසල පාලු පාටයි. "

"අපි ඇතුලට යමු නේද? "

අප්සරා දොර ලඟට යන විට ඇටසැකිලි දෙක නැඟිට ඇය දෙසට ආවෝය .

"සුරංගනාවිය මේ නරයන්ට හැර ඔබතුමීටත් සුගන්දිකා කුමරියටත් ඇතුලු වීමට අවසර ඇත. "

KUSHAN HETTIARACHCHI

එක ඇට සැකිල්ලක් කතා කරයි.

යහලුවන් මුහුණෙන් මුහුණ බලා ගත්තේ බලාපොරොත්තු සුන් වූ ලෙසය.

"නැහැ සුමේධ මේ අය යායුතුයි. ඔබ ගොසින් යම රජුගෙන් අවසර රැගෙන එන්න. "

එවිටම හිස්කබල් දොරෙන් පිට වූයේ හැඩිදැඩි කලු පැහැ මිනිසෙකි. ඔහු මිනිසෙක් නොව යම

පල්ලෙකි.
"සතුටේ සුරංගනාවිය සුගන්දිකා කුමරිය ඔබ දෙපලටත් යහලුවන් පස් දෙනාටත් අපායට ඇතුලු වීමට වසර ඇත. "

"සුදාරක ඔබට අපව පෙනුනාද? "

"එසේය සුරංගනාවිය ඔබගේ මේ පැමිණීම පුරාණ පොත් වල සඳහන්ව ඇත. "

අප්සරා ඉස්සර උනාය. ඔවුන් සියලු දෙනාම හිස්කබලේ කටින් අපායට අතුලු උනෝය.

"යම රජ සුවෙන් වෙසෙනවද? "

සුගන්දිකා යම පල්ලන්ගෙන් විමසුවේය.

"එසේය කුමරිය. "

ඔවුන් ඒ අදුරු ලෝකයේ සුදාරක සමග ඉදිරියට පිය මැන්නෝය. මිතුරන් පස් දෙනා මේ අපූරු අත් දැකීම විදිමින් ඉදිරියට ඇදුනෝය.

"ඔබ පස්දෙනා තමයි ප්‍රතම වතාවට මෙහි සතුටින් පිය නගන නරයන් පිරිස. "

සුදාරක කීවේ යහලුවන් දෙස බලාය.

"ඔයාල අපි අහල තියන තරම් නපුරු නෑනේ. "

එසේ ඇවසුවේ හසරැල් ය.

"අපි හොද අයට නපුරු නෑ. හැබැයි වැරදි කරන අයට දඬුවම් කරනව. ඉස්සරහට යද්දී මම පෙන්වන්නම්. "

මාත් එක්ක එන්න. ඔහු ඔවුන්ව රැගෙන ගියේ මනාව කලුගල් අල්ලන ලද මාවතක් දිගේය .

"මේ ලෝකෙට ඉර පායන්නෙ නැද්ද සුදාරක? "

ක්‍රිෂාන් යම පල්ලාගෙන් ඇසීය.

"පායනව, ඒත් අවුරුද්දකට එක දවසයි. අනිත් දවස් වලට මේ විදිහට මද අඳුරෙ තමයි තියෙන්නෙ. "

ඔවුන් ඉදිරියට ගමන් කරද්දී ගඟක් ගලායන හඬක් ඇසුනි .

"ඒ මොකක්ද සුදාරක. "

ක්‍රිෂාන් ඇසුවේ යම පල්ලාගෙනි. ඔහු පිළිතුරු දෙන්නත් ප්‍රතම ඔවුන්ට ඇසුනේ මිනිසුන්ගේ විලාපයකි .

"අපි සිටින්නෙ කටුඉඹුලට ගොඩක් කිට්ටුව. ඔය ඇසෙන්නේ රුධිරයෙන් සෑදුන ගංගාව ගලායන

හඬයි. ඔය විලාප ඇසෙන්නේ කටු ඉඹුලට නංවන නරයින් ගේ විලාපයයි. "

ඒත් සමග හමාගියේ අමු ලේ වල දුර්ගන්ධයකි. ගැහැණු ළමුන් තිදෙනාටම ඔක්කාරයට ආවේය.ක්‍රිෂාන් සහ හසරැල් අප්පිරියාව පිටට නොපෙන්වා සිටියේ අමාරුවෙනි.

"අපාය මෙහෙම තමයි ඔයාලට හුරු නැති නිසයි ඔහොම වෙන්නෙ. "

සුදාරක පැවසුවේ අසල ගසකට වාරු වී වමනය දමන සුබා සහ හිරු දෙස බලාය.

මද දුරක් ගිය විට ඔවුන්ට කටු ඉඹුල හමු විය. රුධිර ගංගාව ගලන්නේ කටු ඉඹුල පාමුලිනි.නරයන් එකා බැගින් කටුඉඹුලට නංවති. කටු වල පැටලී ඔවුන්ගේ සිරුරු හිල් වී ලේ ගලයි.

"ඔය ඉන්නෙ කාමයේ වරදවා හැසිරුණු අය. කාමයේ වරදවා හැසිරුණු හැමෝටම මේ දඬුවම විදින්න වෙනවා. "

කටුඉඹුලේ නගින උන් ගේ දුක්මුසු මුහුණු දෙස මදක් බලා සිටි පිරිස, එතනින් නික්ම ගියේ මිනිස් මනසට එම ම්ලේච්ච වද හිංසා දරන්න බැරි නිසාය .




කටු වල පැටලී ඔවුන්ගේ සිරුරු හිල් වී ලේ ගලයි.

Author
KUSHAN HETTIARACHCHI

"බුදු අම්මෝ ඒපෝ ."

මද දුරක් යන විට ඇසුනේ ක්‍රිෂාන් ට හුරු පුරුදු කටහඬකි.

ක්‍රිෂාන් වටපිට බලද්දී..

"වටපිට බලන්න දෙයක් නෑ ක්‍රිෂාන් ලඟදි නැතිඋන ගුණදාස තමයි ඒ කෑ ගහන්නේ. එන්න පෙන්නන්න. "

"මොනව ඔයාට හිත් කියවන්නත් පුලුවන්ද? සුදාරක. "

ක්‍රිෂාන් ඇසුවේ පුදුමයනි.

"ඔව් ක්‍රිෂාන් මට පුලුවන්. ඔයාගෙ අල්ලපු ගෙදර ගුණදාස. එයාගෙ අම්මට තාත්තට සැලකුවෙ නෑ ඒ අම්ම තාත්තා අවසාන කාලේ හරියට දුක් විඳල මැරුනෙ. ක්‍රිෂාන් ඒ අයව දන්නෙ නැතුව ඇති අර බලන්න ගුණදාසට ලැබෙන දඬුවම. "

සුදාර පෙන්නුවේ ටිකක් එහාට වෙන්න බන්ඩි කියතකින් කෑලි වලට කපන මිනිසෙකි .


"දෙයියනේ ගුණදාස මාමා, ගුණදාස මාමේ. "

ක්‍රිෂාන් ට කෑ ගැස්සුනි.

"ක්‍රිෂාන් පුතා කවදාවත් දෙමව්පියන්ට නොසලකා හරින්න එපා. ඒ පව මම දැන් ගෙවන්නෙ ,වයසට ගියාම දෙමව්පියන් මල් වගේ බලා ගන්න දුක් දෙන්න එපා. "

යම පල්ලෝ දෙදෙන ගුණදාසගේ කකුලක් කපා වෙන් කලෝය.

Author
ISHAN HETTIARACHCHI




යම පල්ලෝ දෙදෙන ගුණදාසගේ කකුලක් කපා වෙන් කලෝය.

සුගන්දිකා සහ අප්සරා කිසිත් කතා නොකලෝය. ගැහැණු ළමුන් තිදේනාත් හසරළුත් හොදටම බියවී ඇති බව ඔවුන් ගේ නෙත් වලින් පෙනෙයි.

ඔවුන් සත් දෙනා සුදාරක සමග ගල් ඇල්ලූ මාවත දිගේ ඉදිරියට ගියෝය.

"අම්මෝ මේ ලෝකේ හරිම භයානකයි. "

සුබා එසේ කියමින් ක්‍රිෂාන්ගේ අතේ තවත් වෙලුනාය.සුගන්දිකා මෙය දුටුවත් ඇය නොදැක්ක සේ සිටියාය.ටික දුරක් යනවිට තවත් මිනිසෙකුගේ අදෝනාවක් ඇසෙයි .

"පිංකි ඒ හඬ හුරු නැද්ද?"

හිරු ඇසුවේ පිංකිගෙනි .

"ඒක තමයි මට හොඳට හුරුයි ඒ හඬ. "

"ඒ අර ඉස්කෝලෙ ගාව මස් කඩේ කරන ධර්මෙ මාමගෙ කටහඬ. "

"ඒත් එයා මැරිල නෑනේ. "

"එයා මැරුනෙ ඊයෙ නිමේෂා ඔය ඉස්සරහ දඬුවම් විදින්නෙ එයා. "

සුදාරක පවසද්දි ඉදිරියේ මස්කඩේ ධර්මෙව බිම දමන් යමපල්ලො දෙදෙනෙක් වැයකින් ඔහුව රහිමින් සිටියෝය. ධර්මේ වේදනාවෙන් ඇඹරෙමින් සිටියේය. ඔහු වේදනාව අතරින් කෑ ගැසුවේ.

"දරුවනේ කවදාවත් සතුන් මරන්න එපා. සතුන්ට රිදවන්න එපා. උන් කූඩු කරල දුක් දෙන්න එපා. "

ඔහු වේදනාවෙන් ඇඹරෙද්දීම යම පල්ලා ඔහුගේ වම් කලවය වැයෙන් රැස්සේය .

KUSHAN HETTIARACHCHI




යම පල්ලා ඔහුගේ වම් කලවය වැයෙන් රැස්සේය.

එය දුටු සුබා ක්ලාන්ත උණවා සේය. ක්‍රිෂාන් ඇයව වත්තන් කරගෙන සියලු දෙනාම ගල් මාවතේ ඉදිරියට ගියෝය .

තව ටික දුරක් යන විට ඔවුන්ට  දැඩි රස්නයක් දැනුනි.

"සුදාරක මොකක්ද මේ අසාමාන්‍ය රස්නය? "

ක්‍රිෂාන් ඇසුවේ ඇඟට දැනුනු දැඩි තාපය නිසාය.

තව ඉස්සරහට යමු කො මම පෙන්න්වන්නම්.

ඔවුන් ඉදිරියට යන විට මිනිසෙක් බිම ඉඳගෙන සිටියේය. යමපල්ලො දෙදෙනෙක් ඔහුගේ කටට මොනවාදෝ වත් කරයි. ඔහු වේදනාවෙන් මොර දෙයි.

"ඔය තමයි මත් පැන් බොන අයට ලැබෙන දඬුවම. උණු කරපු ලෝදිය පොවනව මැරෙනකම්ම.ඒත් මැරෙන්නෙ නෑ."

සුදාරක පවසද්දී.

ඒ මිනිසා දුකින් ඔවුන් දෙස බලා සිටියේ මත් පැන් බොන්න එපා කියන්න සේය.




ඒ මිනිසා දුකින් ඔවුන් දෙස බල්ල සිටියේ මත් පැන් බොන්න එපා කියන්න සේය.

යලිත් සුදාරක සිය කටහඬ අවදි කලේය.

"අපිට මෙතනින් යම රජ මුණ ගැසෙන්න මාලිගාවට යන්න පුලුවන්. කැමතිනම් අපායේ තව දේවල් බලන්න පුලුවන්. මොකද කියන්නෙ? "

"අම්මෝ තව ඕනේ නෑ දැක්ක ටික හොදටම ඇති"

යහලුවන් පස් දේනා එකවරම කීවෝය.

"හරි එහෙනම් මේ පැත්තෙන් එන්න. "

සුදාරක වෙනත් මාවතකට පිවිසුනි. මද දුරක් ගිය විට කලින් මෙන් හිස් කබල් දොරකින් ඔවුන් ඇතුලු උනෝය. මෙවර ඇතුලු උනේ විශාල ශාලාවකටය. එහි යම රජ සිංහාසනාරූඪව නඩු විමසමින් සිටියේය. ඔවුන් ඇතුලුවෙනු දුටු යම රජ ඔවුන් දෙස බැලුවේ ගාම්බීරවය. ඔහුගේ මේසය මත පව් පොත දිග හැර තිබුනි.

සුදාරක යම රජට වැඳ ආචාර කර පසෙකින් සිට ගත්තේය.යම රජ සිය ගාම්බීර කට හඬ අවදි කර,

"ඔබලාගේ අපාය සංචාරය අපගේ පුරාණ පොත්පත් වල සඳහන්ව ඇත ඒ දිනය අදයි. "

යනුවෙන් පැවසීය.




යම රජ ඔවුන් දෙස බැලුවේ ගාම්භීරවය.

යහලුවන් පස් දෙනා බියවී යම රජ දෙස බලා සිටී, එය තේරුණ නිසාදෝ යමරජ.

"ඔබලා කිසිවෙකුත් බියවිය යුතු නැත. නරයිනේ ඔබලා ගේ පෙර වාසනාවක් නිසා පණපිටින් මා බැහැ හැකීමට අවස්තාව ලැබී ඇත. ඒ ගැන සතුටු වෙව. "

යයි පවසා සුගන්දිකා සහ අප්සරා දෙසට හැරී.

"සතුටේ සුරංගනාවිය මම දනිමි ඔබ දෙපල මෙහි ආ කාරණය. එහෙත් කියන්න කණගාටුයි සුගන්දිකාට යලි මිනිස් ජීවයක් ලබා දිය

නොහැක. අපට කල හැක්කේ ඇය අමරණීය කර ඔබ වැනි සුරංගනාවියක් කරවීම පමණයි. "

"එහෙත් යම රජුනි? "

සුගන්දිකා යමක් පවසන්න සැරසුන විට යම රජ යලි සිය ගාම්බීර හඬ අවදි කලේය.

"සුගන්දිකා මම නුඹගේ මාමණ්ඩිය වන බව ඇත්තයි. එහෙත් මට උවත් ලෝක ධර්මය තුල යා හැකි සීමාවන් තිබෙයි. ඔබව සුරංගනාවියක් කර අමරණීය කල හැක්කේද මා මිත්‍ර සක් දෙව්දුට පමණයි. මම මරණයේ දෙවියා පමණි.ජීවිතයේ හෝ පැවැත්මේ දෙවියා නොවෙයි. "

"යම රජුණි එවිට මට මගේ ක්‍රිෂ්නා ලබා ගත නොහැකිවෙනවා නොවේද? "

"ඔබට ඔහු කෙසේවත් ලබා ගත නොහැකියි. ක්‍රිෂ්නා වෙනුවෙන් ඉපදී ඇත්තේ බෝධියි. ඔබ සුරංගනාවියක් වූ පසු තව දුරටත් ක්‍රිෂ්ණා පිලිබඳ ඇතිවී තිබෙන බොලඳ ආදර හැඟීම් වැනි දේවල් හිතෙන් දුරස් වෙලා යාවි. "

එසේ පවසා ක්‍රිෂාන් සහ සුබා දෙස බැලූ යමරජ ඔවුන් දෙදෙනා “දරුවනේ මෙහි එන්න .”

sinhalaebooks.com

යයි තමා වෙත කැඳවූයේ මෘදු ලෙස අමතමිනි.

ඔවුන් දෙදෙනා යම රජ ලඟට ගිය විට දෙදෙනාගේම සුරත්වලින් අල්ලා ගත් යම රජ.

"ඔබ දෙදෙනා මැවී ඇත්තේ ඔබ දෙදෙනා වෙනුවෙනි. මේ දැත් කවදාවත් වෙන් වෙන්න දෙන්න එපා. "

යයි පවසමින් ඔවුන් දෙදෙනා ගේ දැත් එක් කලේය .

ඉන්පසු සුදාරක දෙස බැලූ යම රජ.

"සුදාරක මේ අපේ අමුත්තෝ හත් දෙනා සමග මම ආහාර ගත යුතුයි. මොවුන්ව මාගේ භෝජනාගාරය කරා කැඳවා ගෙන ගොස් මා සමග අහාර ගැනීම සඳහා සූදානම් කරන්න. තවද මොවුන් සුරලෝකය කරා ගමන් කිරීමට තරු දොරටුව සූදානම් කරන්න. ආහාර ගැනීමෙන් පසු මා ඔවුන් සමග තරු දොරටුව වෙත යමි. ඔබ එය සූදානම් කර අප එන තෙක් එතන රැඳී සිටින්න. "

"එසේය යම රජ. "

සුදාරක එසේ කියමින් මිතුරන් හත් දෙනාව රැගෙන රාජකීය භෝජනාගාරයට ඇතුලුවුනි.

රාජකීය භෝජනාගාරයට මේසය මත විවිධ කෑම වර්ග වලින් පිරී ඉතිරී තිබින. විවිද පළතුරු වර්ග සහ අල වර්ග වලින් සෑදූ ආහාර බොහොමයක් තිබුනි. ආසන වල යහලුවන් වාඩි වූ පසු සුදාරක තරු දොරටුව කරා යාමට පිටත් විය. යහලුවන් ටික අසුන් ගෙන බලා සිටියේ යම රජ සැපත් වෙන තෙක් ය .

"සුබා මෙ බලන්න, මෙ හැම ආහාරයක් ම නිර්මාංශයි වගේ. "

ක්‍රිෂාන් පැවසුවේ තමන් ලග ඉදගෙන සිටි සුබාටය. එසේ පවසද්දිම යම රජ භෝජනාගාරයට ඇතුල් විය .සියල්ලෝම තම පුටු වලින් නැගී සිටියෝය.

"ක්‍රිෂ්ණා ඔබ කිව්ව හරි, මේ යම ලෝකේ හැමෝම නිර්මාංශයි. අපි පස් පවින් වැලකිලා ඉන්නෙ. අපි මේ ඉටු කරන්නේ දේව කාරියක්. අපි පස්පව් කරණ අයට දඩුවම් කරන අය. අපි පස් පව් කලොත් අනිත් අයට ආදර්ශයක් වෙන්නෙ කොහොමද? "

එසේ කියමින් යම රජ පැමිණ කෑම මේසයට වාඩි විය .ඔවුන් සියලු දෙනාම රසම රස පළතුරු වලින් සහ අල වර්ග වලින් කුස පුරවා ගත්තෝය .යම රජගේ සිරුරින් ඔහු රෞද්‍ර ගතියක් පෙනුනත් ඔහුගේ කතාබහෙන් ඔහු මෘදු තැනැත්තෙක් බව නම් පෙනී ගියේය.ආහාර ගැනීමෙන් පසු තම සේවක යම පල්ලෙක් කැඳවූ යම රජ.

"අප හට තරු දොරටුව කරා යාම සඳහා රථයක් සූදානම් කරව. "

යයි අණ දුන්නේය.

"එසේය යම දේවයන් වහන්ස. "

එසේ ආචාර කල යම පල්ලා එතනින් නික්මිනි.

පිරිස දෙස බැලූ යම රජ.

"අප දැන් පිටත් විය යුතුයි. තරු දොරටු විවර කල හැක්කේ දිනකට පැයක් පමණයි. සූදාරක දැන් සියලු දේ සූදානම් කොට ඇති බවට සැකයක් නැහැ. "

එසේ කියමින් යම රජ ඉස්සර විය.

සියල්ලෝම යම මාළිගයෙන් එලියට ආවේ වෙන පැත්තකිනි. ඒ පස පෙර මෙන් කර්කශ නැත. ගස්

KUSHAN HETTIARACHCHI

වැල් සරුසාරව වැඩී හිරු එළිය හොඳින් ලැබී තිබේ.

"මේ කොහෙද? "

එසේ ඇසුවේ හිරුය.

"මේ තමයි තරු දොරටුවට යන පාර. "

යම රජ පැවසීය. ඔවුන් එළිමහනේ මද දුරක් පැමිණි විට මනරම් අශ්ව කරත්තයක් සූදානම් කොට තිබුනි. එය ඇදගෙන යන ලද්දේ අශ්වයන් අට දෙනෙකු විසිනි. යම රජ ඇතුලු පිරිස රථය තුලට නැගී සුවපහසු ලෙස වාඩි උනි.

"ඔබ කවුරුවත් මීට පෙර අශ්ව කරත්තයකින් ගමන් කොට නැතිව ඇති නේද? "

යම රජ විමසුවේ යහලුවන් පස් දෙනා දෙස බලමිනි.

"ඔවුන් හිස වැනුවේ නෑ කියන්නට මෙනි. "

අශ්ව කරත්තය ගමන ආරම්භ කලේ යම රජ ගේ විධානයෙනි. කරත්තය හෙමින් හෙමින් ගමන ආරම්භ කර පසුව සැලකිය යුතු වේගයකින් ගමන් කරන්න විය.

පැය බාගයකින් පමන පසුව ඔවුන් තරු දොරටුව වෙත ආවෝය.

එම ප්‍රදේශය නිකන් උත්‍රධ්‍රැවයට ගියා වැනි විය. හැම තැනම හිම මිදී ඇති මුත් ගස් කොලන් තිබුනේ සර්ම කලාපීය රටක මෙනි. හැම තැනම වායු ගෝලයේ ගිනි රැල් වගේ තිබුණි. සුදාරක පසෙක සිටි අතර .




එම ප්‍රදේශය නිකන් උත්‍රධ්‍රැවයට ගියා වැනි විය හැම තැනම හිම මිදී ඇති මුත් ගස් කොලන් තිබුනේ සර්ම කලාපීය රටක මෙනි.

යම රජ සහ පිරිස ලඟට ඔහු ආවේ සිනාසීගෙනය.

"රජ තුමනි සියල්ල සූදානම්. "

පිරිස ඇමතූ යම රජ.

"අප මෙතනින් නවතිනව. මාගේ ලෝකයට ඔබ සැමගේ පැමිණීම මට මහත් සතුටක්. සුගන්දිකා මා දියණිය මා මිත්‍ර සක් දෙවිඳු මුන ගැසී මේ සන්නස ඔහුට බාර කරන්න. ඔහු ඔබට අවශ්‍ය සියලුම දේ ලබා දෙනු ඇත. "

යම රජ පැවසීය. අවසන සියලු දෙනා යම රජට වැඳ ආචාර කලෝය.පිරිස නැගිටවූ යම රජ ක්‍රිෂාන් සහ සුබා ළඟට ගෙන.

"දිනෙක ඔබ දෙපලගේ දරුවන් හට ඔබ දෙදෙනා එක්කල යම රජ ගැන පවසා සිටින්න. ඔවුන් සුරංගනා කතාවක් මෙන් එය ආසාවෙන් අසා සිටිනු ඇත. ඒ වගේම මා මෙන්ම මා මිත්‍ර සක්දෙවිඳුද දැසින් දකින ඔබ මිහිපිට සිටි වාසනාවන්තම යුවල වන්නේය. "

සියලු දෙනාට සුබ පැතූ යම රජ තරු දොරටුවෙන් ඇතුල් වෙන ක්‍රමය ඔවුන්ට පහදා දුනි.

"ඔබ සැම බිය නොවී මේ සීතල ගිනි දැල් අතරින් ජල පොකුණ මතට යන්න. ඉන් පසුව සුදාරක මන්තර මතුරා තරු දොරටුව ක්‍රියාත්මක කරනු

ඇත. සීතල ජල ධාරාවෝ ඔබ සැම වෙලා ගෙන ඉහල අහසට නැග අහස් විවරය ඇරී සුරලොව වෙත ඔබ රැගෙන යනු ඇත. සුර ලොව අපායේ මෙන් ඔබට ඇවිදීමට අවසර නැත. ඒ සුරලොවට යාමට මේ නරයින් ගේ පින් මදි නිසාය. ඔබට හමුවීමට අවසර ඇත්තේ සක් දෙවිදු පමණය.සුරලොව දොරටුපාලයන් වන චිත්‍රක සහ සුදේව යන දෙදෙනාගෙන් කෙනෙක් ඔබව සක් දෙවිදු වෙත පමුණුවාවි .අප්සරා සහ සුගන්දිකා සුරලොව නවතින අතර නරයින් වන ඔබ පස් දෙනා යලි පෘථිවිය මතට රැගෙන යනු ඇත. ඒ ලෙසම ඔබ කාටවත් මේ ගමන ගැන පැවසීමට අවසර නැත. අවසර ඇත්තේ ක්‍රිෂ්ණා සහ බෝධි යුවලට පමණි. එත් ඔවුන්ගේ දරුවන්ට පමණය. "

ඔවුන් සියලු දෙනාම ගිනිසිළු අතරින් ජලය මතින් ගමන් කලෝය. ඔවුන් ජලයට පිවිසුන පසු සුදාරක මතුරන්න පටන් ගති .මද වේලාවකින් ජල රැලි ඉහලට එසවෙන්න විය. ඒ සමගම සියලු දෙනා ඉහළට යනවා වැනි හැඟීමක් දැනෙන්න විට.ජලය නිසා අවට නොපෙනුනත් වටපිටාවේ දැඩි අදුරක් ඇතිබවනම් පෙනුනි. මෙලෙස විනාඩි කීපයක් ගත වෙන්නට ඇත .මද වේලාවකින් ජලය අතරින් ආලෝකය පතිත වී හිටිගමන් ජලය

KUSHAN HETTIARACHCHI

sinhalaebooks.com

වාෂ්ප වී ගියේ නිමේශයකිනි .ඔවුන් සිටියේ ලස්සනම ලස්සන පරිසරයකය .

"මේද දෙව් ලොව. "

පිංකි තම කටහඬ අවදි කලේ හාත් පස සිසාරා බලමිනි.

මෙහි හිරු එළිය සෞම්‍ය බව ඔවුන්ට වැටහුනි.

"ඔව් මේ තමයි සුරලොව අපි උතුරු දිසාවට යා යුතුය. "

එසේ කියමින් අප්සරා ඉස්සර උනාය. ඒ අනුව අනිත් අය ඇයව අනුගමනය කරමින් ගමන් කලෝය.

කිලෝමීටරයක් පමණ යන විට ඔවුන්ට සුරලොව දොරටුව ලඟට යා හැකිවිය. චිත්‍රක සහ සුදේව සුරංගනාවිය ඇතුලු පිරිස පිළිගත්තේ ඉතා සතුටිනි .

"සුදේව සක් දෙවිඳු හමුවීමට යාම සඳහා යි අප පැමිණියේ. "

අප්සරා පවසද්දී.

"එන්න මම රැගෙන යන්නම්. “

සුදේව ඉස්සර විය.

සියලු දෙනා ඇතුලු වූයේ සුර ලොවටය. ඔවුන් ඇවිදගෙන යද්දී ඉදිරියට පැමිණියේ ශාන්ත ලෙස ගමන් ගත් උවැසියන් පිරිසකි එම දර්ශනය නෙතට රසඳුනක් සේ විය .

"පිංකි අර අපේ ආච්චි නේද? "

ක්‍රිෂාන් ඇසුවේ පිංකී දෙස බලමින්ය.

"ඔව් නෙ අයියේ අපි කතා කරමුද? "

"ඔයාලට එයා එක්ක කතා කරන්න සක් දෙවිඳුගෙන් අවසර ගන්න වෙනවා. "

එසේ පැවසුවේ සුදේවයි.

"අපි සක්දෙවිඳු හමුවෙලා සිටිමු. "

අප්සරාද පැවසුවාය.

සුදේව ඔවුන් කැටුව ගියේ විශාල මාළිගාවකටය. මාළිගාව ඇතුලත විශාල ශාලාවකි. ඒ ඔවුන් ට ශාලාව තුල තිබූ සැටියක වාඩිවීමට ඇරයුම් ලැබුනි. ශාලාවේ කෙළවරට වන්නට තිබූ පුංචි දොරකින් සුදේව ඇතුලු විය. දොර ලඟ මුරට සිටියේ කාන්තාවන් දෙදෙනෙකි,සෑම තැනම හමා

ගියේ පළතුරු සුවඳ සහ මල් සුවඳයි .ශාලාවේ අනෙක් පස විශාල බුදු කුටියකි ඒ තුල දඹ රණින් නිර්මාණය කල බුදු පිළිමයකි.මද වේලාවකින් දොරටුවෙන් එලියට පැමිණි සුදේව.මිතුරන් අතරට පැමිණියේ සිනා මුසු මුහුණෙනි .

"ඔබ සියලු දෙනාටම සක් දෙවිඳු බැහැදැකීමට අවසර ලැබී තිබේ. එන්න මා සමග. "

ඔවුන් සියලු දෙනාම සක් දෙවිදුගේ කුටියට ඇතුලු වූහ.සුදු උස මහත මනා අරෝහ පරිණාම දේහයකින් යුත් සක් දෙවිදු සිනා මුසු මුහුණෙන් ඔවුන් දෙස බලාගෙන.පඬුපුල් ආසනයේ විරාජමානව වැඩ හුන් සේක.

"අප්සරා දියණිය ඔබ බොහෝම කාලෙකින්. "

"එසේය මාමණ්ඩිය. "

"මට මා මිත්‍ර යම රජ ඔබගේ පැමිණීම ගැණ පණිවිඩ එවා තිබුනා. "

සුගන්ධිකා තම අත වූ යම රජුගේ සන්නස සක් දෙවිඳු හට ප්‍රධානය කලාය .

"යමරජ ඔබව ආදරයෙන් මතක් කලා සක් දෙවිඳුණි. "

සුගන්ධිකා දෙස බැලූ සක් දෙවිදු.

"මා මිතුරා සුවෙන් වෙසෙත් ද දියණිය. "

"එසේය සක් දෙවිඳුනි. "

"ඔබගේ ශාපලත් කාලය අවසන් දියණිය ඔබගේ කඳුලු හැලූ කාලය අවසන් ඔබටත් අප්සරාටත් දැන් සතුටේ දේව මාලිගයේ සතුටේ සුරංගනාවියක් ලෙස ජීවත් වෙන්න පුලුවන්. "

සක් දෙවිදු අහස දෙසට අත් දික් කොට යම්කිසි මන්ත්‍රයක් මැතුරුවේය .ඒ සමගම නිල්පාට ගිනිසිළු රාශියකින් සුගන්ධිකා වැසී ගියේය .

ගිනිසිළු නිවී යන විට සුගන්දිකාගේ හිස මත අප්සරාගේ මෙන් අලංකාර ඔටුන්නක් විය.

"මේ දරුවන් ට ඔබ ස්තූතිවන්ත විය යුතුයි. ඔවුන් නොසිටින්න ඔබ තවමත් ශාපලත් කදුළු හෙලන ආත්මයක්. "

සක් දෙවිදු පිරිස දෙසට අත දික් කර පැවසීය.

අප්සරා සක්දෙවිදු දෙස බලා.

"මාමණ්ඩිය මට ඔබෙන් වරයක් ඉල්ලීමට ඇත. "

"කියන්න දියණිය කුමක් ද ඒ වරය. "

"ක්‍රිෂාන් ගේ සහ පිංකිගේ මිත්තනිය සුරලොව වෙසෙයි ඔවුන්ට ඇය සමග මොහොතක් කතා කිරීමට වසර ලබා දෙනු මැනවි. "

"එය සුළු දෙයකි ඊට පෙර මේ සැම දෙනාටම සංග්‍රහ කලයුතුයි. මේ සැමෝම අපගේ අමුත්තෝය. "

"සුදේව මේ සෑම දෙනාටම ආහාර සූදානම් කරන්න. මමද තව ස්වල්ප වේලාවකින් පැමිණෙන්නෙමි. "

සුදේව ඔවුන්ව කැඳවාගෙන භෝජනාගාරය වෙත ගියෝය .බොහෝ කැවිලි වර්ග පළතුරු වර්ග එහි මේසය මත පිරී තිබුනි. මෙහිද හැම ආහාරයම නිර්මාංශ ආහාර විය.

මද වේලාවකින් සක් දෙවිඳු පැමිණියේ ක්‍රිෂාන්ගේ මිත්තනියත් සමගය .ඇය මියගොස් දැනට අවුරුදු පහලවක් පමණ ගතවී ඇත.ක්‍රිෂාන්ට පැහැදිලි මතකයක් තිබ්බත් පිංකිට එතරම් මතකයක් ඇය ගැන නැත.ඇයගේ මුහුණ එදා මෙන් පියකරුය .

"ආච්චි "

ක්‍රිෂානුත් පිංකිත් හසරැලුත් තිදනාම ඇයට වැන්දෝය.

"කොහොමද දරුවනේ, ඔයාල හරිම වාසනාවන්තයි පණපිටින් දෙව්ලොව ආවා ඔයාලා. "

"ඔව් ආච්චි ඒත් අපි තව ටිකකින් යනව. "

"ඔව් පුතේ පුලුවන් තරම් පින් රැස් කරන්න. නැතිබැරි අයට දෙන්න. පොඩි දරුවන්ට සලකන්න. කුසගින්නෙ ඉන්න අයගෙ කුසගිනි නිවන්න. මිනිස් ලොව ඉන්න ඔනම කෙනෙක් ට පින් රැස් කරන්න අපහසු නෑ. ඒ අය කුසල් මාර්ගයෙන් ඈත් වෙලා ඉන්නෙ. ඒ නිසා සුර ලොව එන අය අඩුයි දැන් . "

එලෙස පැවසූ ඇය තව සුලු මොහොතක් එතන රැදී සිට යහලුවන් පස් දෙනාට ආශීර්වාද කොට සමුදුන්නාය .

"දරුවනේ එන්න අපි ආහාර ගමු."

සක්දෙවිඳු කෑම මේසයට වාඩි විය. අනිත් සැමෝම වටේ තිබූ පුටු වල වාඩි වී දිව්‍ය භෝජන බුක්තිවිදීමට සැරසුනි .

"සක් දෙවිඳුනි ඔය මිහිපිට තිබෙන දේවාල සත්‍යද? ඒ තැන්වලට දෙවිවරු වඩිනවද? "

හිරුගෙන් අමුතුම ප්‍රශ්නයකි.

"නැත දරුවා මිහි පිටට දෙවියන් වඩින්නේ නැත. මිනිස්සුන්ගේ දුර්ජණ ක්‍රියා තිබෙන තාක් කල් දෙවියන් මිහිපිටට නොවඩිනු ඇත,එහෙත් හොඳවැඩ හොද දේවල් කරන මිනිසුන් දිහා දෙවිවරුන් වන අප සෑම විටම නෙත් යොමා සිටින්නෙමු .ඔවුනට ආශිර්වාද කරන්නෙමු. "

ආහාර ගෙන අවසන් වූ පසු සියලු දේනා නැගී සිටියහ.

"දැන් ඔබලාට මිනිස් ලොවට යාමට කාලය පැමිණ තිබේ. එන්න මා සමග යාමට. "

සක් දෙවිඳු ඔවුන් සත්දෙනාම කැඳවාගෙන සක්දෙව් මාලිගයෙන් ඔබ්බෙ පිහිටි එලිමහන් ස්ථානයකට ගියේය .යහලුවන් පස් දෙනා අප්සරා ටත් සුගන්දිකාටත් සමු දුන්නෝය. සුබා සහ ක්‍රිෂාන්ගේ දැත් අල්ලා ගත් සුගන්දිකා .

"බෝධී මේ මගේ පණ මෙන් ආදරය කල ක්‍රිෂ්නා අද සිට ඔබට බාරයි, ඔබ දෙදනා සතුටින් වාසය කරණු ඇති බව සැකයක් නැත.ඔබ දෙදෙනා

අතර මම ආදරය වපුරන්නෙමි. ඔබ පස් දෙනා දෙසම මම මෙහි සිට බලා සිටිමි. "

ඇය සියලු දෙනා දෙසම බලා පැවසුවාය.

"ඔබලා අප දෙදෙනාටම ලැබුණු හොඳම යහලුවන් පස් දෙනෙක් සැබවින්ම අපි හොඳ කන්ඩායමක්. "

සතුටේ සුරංගනාවිය අප්සරාද මිතුරන් ට සමු දෙමින් පැවසුවාය.

සක්දෙවිදුට වැද අවසර ගත් යහලුවන් පස් දෙනා මනුලොව කරා යාමට සූදානම් උනෝය .

සක් දෙවිදු ගේ සේවක සුදේව පුංචි පලසක් වැනි යමක් ගෙනවිත් සක් දෙවිදු ඉස්සරහ බිම එලුවේය.

"දරුවනේ සියලුම දෙනා මේ පලස මතට ගොඩ වෙන්න. "

ඔවුන් පස් දෙනා පළස මතට ගොඩවූ පසු සක් දෙවිදු අතේ වූ පැණි කෙන්ඩියෙන් වතුර ස්වල්පයක් ගෙන සැමෝටම වැදී යන ලෙස ඉස්සේය .

පළස මදක් ඉස්සී වටයක් කැරකී වේගයෙන් ඉහලට එසවුනි යහලුවන් පස් දෙනා ඔච්නොවීන්

දැඩි සේ වැලඳ ගත්තෝය. හාත්පස අඳුර වෙලාගත් අතර සක්දෙවිදු අප්සරා සුදේව ගේ රූප බොඳවී මැකී ගියේය. ගතවූ කාලය ගැන අවබෝදයක් නැතත් ඔවුන් සිහියට පැමිණෙන විට සිටියේ ඔවුන්  ගමන පටන් ගත් නිල් දිය පොකුණ  අසබඩය.

පොකුණ යලිත් නිල් පැහැ දිය පිරී ගුප්ත ලෝකයට යන පාර වසාගෙන සිටියාය.

"ඔන්න අපි ආයෙත් මිනිස් ලොවට පය ගැසුවා. "

ක්‍රිෂාන් පැවසුවේ සුබාගේ උර හිසෙන් අතකුත් තබාගෙනය.

නිල් දිය පොකුණේ ජලය තුලින් සුගන්දිකා ගේ සහ අප්සරාගේ චායාවන් පෙනී ඔවුන් ට අත වනා නොපෙනී ගියේය.

KUSHAN HETTIARACHCHI

"තාම උදේ දහයට විතර ඇති දැම්මම පිටත් උනොත් අපට හවස් වෙද්දි ගෙදර යන්න පුලුවන්. "

අත්භූත චාරිකාවක අත්දැකීම් ලැබූ ක්‍රිෂාන් ඇතුලු පිරිස නිවෙස් බලා ඒමට සූදානම් උනෝය.

නිමි

කුෂාන් කුෂී^

මේ නව කතාව ලියන්න මට ගොඩක් අය උදව් උනා.මුලින්ම කියන්න ඕනේ. මෙම නවකතාව ලියවුනේ අපූරු විදිහකට .ඒ ඒ දේවල් වලට අදාල වුන සමහර සිදුවීම් වල ඡායාරූප පලවුනා.සමහර අය එම සථාන ඇත්තටම තියනව කියල හිතල කතා කරපු අවස්තාත් තිබුන .ඇත්තෙන්ම මට ඡායාරූප ගන්න උදව් කරපු දෙදෙනෙක් හිටිය.එක්කෙනෙක් චමින්ද මල්ලි "චමී ටැටූස් "කියල ෆේස් බුක් එකේ ඉන්නෙ එයා දක්ෂතම කලා කාරයෙක් ,ඒ වගේම අනිත් කෙනා රංගසිරි පද්මකුමාර අපේ රංග අයියා කවුරුත් දන්න විදිහට "පත්තර කඩේ අයියා " එයා බොහොම වෙහෙස උනා මේ වැඩේට මාත් එක්ක කැලෑ ගානේ ගිහින් දවස් ගනන් මේ වැඩේට හුඟක් උදව් උනා .තව මට සිංහපුරේ අපේ අනුර මල්ලි චායාරූප ගන්න උදව් උනා.ඒ වගේම වැල්ලව පන්සලේ රතනසාර ලොකු හාමුදුරුවෝ අපායේ ඡායාරූප ලබාදී ලොකු සහයෝගයක් දැක්වූවා.

, මෙතන නම් කියවුන නොකියවුන හැමෝටම ස්තූතිවන්ත වෙනව.

Author - Kushan Hettiarachchi 2017 SEPTEMBER

# කඳුළු තාරකාවී

"සුගන්දි දැන් පිය රජ කෙනෙක් නැහැ බොහෝ කල් ගතවෙලා අවුරුදු දහස් ගනනක් දැන් මේ දෙදහස් දා හත වර්ශය "

"එහෙම උනේ කොහොමද හසරැල් මීනාක්ශි බෝධි රවිනි මේ අය ඇයි මාව අදුරන්නෙ නෑ වගේ ඉන්නෙ "

ඇය පැවසුවේ පුදුමයෙන් මෙන් ඇය දෙස බලන් සිටිනා යහලුවන් දෙස බලමිනි

"ඒ අයගෙ මතකය ගිලිහිලා කුමරිය අපි මැරෙමින් ඉපදෙමින් ආත්ම කීයක් ගත කරන්න ඇත්ද "

සියලුම දෙනා සුගන්දිකා වෙත ලන් උනෝය.

"ඔයාගේ මතකය රැදුනේ කොහොමද ක්‍රිෂ්නා "

"ඒ අප අතර තිබුන බැඳීම කුමරිය අවුරුදු 21දි ඔබව පිය රජ මේ ගුහාව තුල සිර කරද්දි මම ඔබේ පෙම්වතා ඒ ආදරය මට ආත්ම දහසක් ගියත් අමතක වෙන්නේ නෑ "

"ඔහ්හ් ක්‍රිෂ්නා ඔබනම් කදිම පෙම්වතෙක් "

කුමරිය ක්‍රිෂාන්ගේ අත අල්ලමින් පැවසුවාය

මේ මීනාක්ශි නෙවෙයි දැන් ඇගේ නම




KiYasha

කුෂාන් හෙට්ටිආරච්චි
www.facebook.com/kushan3000
kushan3000@gmail.com